5

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

5.1 සමස්ත නිරීක්ෂණ

ව්‍යවහාර මුදලේ බාහිර අගය මත වන අඛණ්ඩ පීඩනය සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මන්දගාමී ක්‍රියාකාරීත්වය හා සමගාමීව අඛණ්ඩව ඉහළ මට්ටමක පැවති ණය සේවාකරණ වගකීම් සහ දුර්වල ගෙවුම් තුලනයක් පවතින තත්ත්වය මධ්‍යයේ 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ඉහළ අවදානම් තත්ත්වයන් සඳහා මුහුණ දුන්නේය. අපනයන යථා තත්ත්වයට පත් වීම සහ ස්ථාවර වර්ධනයක් පිළිබිඹු කළ ද, ආනයන වියදම සාපේක්ෂව ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් වූ අතර, එය විදේශීය ජංගම ගිණුම මත සෘණාත්මක බලපෑමක් ඇති කළේය. තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන සීමා පවතින අතරතුර වුව ද, අපනයන වර්ධනය ඉක්මවා යමින් ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම සමඟ ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ බලශක්ති මිල ඉහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් විය. පරිගණක සේවා උප අංශය හිතකර වර්ධනයක් පෙන්නුම් කළ ද, සේවා අංශයේ ක්‍රියාකාරීත්වය 2020 සහ 2021 යන වසර ද්විත්වයේ ම මන්දගාමී වූ අතර, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී පමණක් සංචාරක අංශයේ පිබිදීමක් දක්නට ලැබුණි. 2021 වසරේ දී පොලී සහ ලාභාංශ ගෙවීම් අඩු වීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් අඩු විය. වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීමේ මන්දගාමීත්වයක් නිරීක්ෂණය කළ අතර, ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස පහළ යෑමට එය හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී වූ දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස සියයට 1.5ට සාපේක්ෂව 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය. කොටස් වෙළඳපොළෙහි සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විවිධ ආයෝජන අඛණ්ඩව ශුද්ධ ගෙවීම් වාර්තා කළ අතර, විදේශීය සෘජු ආයෝජන ආකාරයෙන් වන විදේශීය ආයෝජන තවදුරටත් මන්දගාමී තත්ත්වයක පැවතුණ හෙයින් මූල්‍ය ගිණුම ද මන්දගාමී ක්‍රියාකාරීත්වයක් වාර්තා කළේය. විදේශීය ගිණුම් මත පීඩනය තීව්‍ර කරමින් රජය වෙත වූ විදේශීය ලැබීම්, විදේශ ව්‍යාපෘති ණය සහ ප්‍රදාන මෙන්ම විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකකට සීමා විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) නව විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) වෙන් කිරීම සහ බංගලාදේශ බැංකුව, චීන මහජන බැංකුව සමඟ 2021 වසරේ දී සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී සිදු කළ විදේශ විනිමය හුවමාරු

පහසුකම් තුළින් මහ බැංකුව වෙත විදේශ විනිමය ලැබීම් වාර්තා විය. විදේශ විනිමය ලැබීම් අවම වීම හේතුවෙන් විදේශීය අංශයේ ඉහළ යන අසමතුලිතතා හමුවේ, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවය වර්ධනය කිරීම සහ විදේශ සංචිත නැවත ගොඩ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. මහ බැංකුව විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීමේ අවශ්‍යතා දැක්වූ අතර, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ අපනයන ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීම සඳහා බැංකු වෙත නියෝග දෙන ලදී. වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම සඳහා ද මහ බැංකුව සහ රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. මේ අතර, වෙළඳපොළ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සැලකිල්ලට ගනිමින්, 2021 සහ 2022 වසර තුළ දී ජාතික ප්‍රමුඛතාවයක් ලෙස සලකා ප්‍රධාන වශයෙන් ම ඉන්ධන, එල් පී ගෑස් සහ ගල් අඟුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා මහ බැංකුව විසින් මූල්‍ය සහය ලබා දෙන ලදී. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට සහයෝගය දැක්වීම සඳහා 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී විනිමය අනුපාතිකය බොහෝ දුරට ස්ථායී මට්ටමක පවත්වා ගත්ත ද, විදේශීය අංශයේ මතුවන ගැටලු සලකා බලමින් මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ දක්නට ලැබුණු ඉහළ පීඩනය හේතුවෙන්, විනිමය අනුපාතිකය සැලකිය යුතු ඉහළ ප්‍රමාණයකින් අවප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ දී සියයට 7.0කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට සියයට 33.0කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. විදේශීය අංශයේ පවතින අර්බුදයට පිළියමක් ලෙස කඩිනම් පියවර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම තුළින් සහ ආර්ථිකයේ අඛණ්ඩව පැවත එන දිගු කාලීන ගැටලු විසඳීම ඉලක්ක කරගත් පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් ඒවාට දායකවීම සඳහා ජා.මූ. අරමුදල සමඟ සබඳතා ආරම්භ කිරීම සහ මෙරට විදේශීය ණය තිරසාර ලෙස කළමනාකරණය කර ගැනීම ඇතුළුව රජය සහ මහ බැංකුව විසින් 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කරන ලදී.

5.1 සංඛ්‍යා සටහන

ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

ශීර්ෂය	එ.ජ. ඩොලර් මිලියන		රුපියල් මිලියන	
	2020 (අ)	2021 (ආ)	2020 (අ)	2021 (ආ)
ජංගම ගිණුම (ශුද්ධ)	**-1,187**	**-3,343**	**-238,248**	**-672,960**
වෙළඳ ගිණුම	**-6,008**	**-8,139**	**-1,115,988**	**-1,617,274**
අපනයන	10,047	12,499	1,858,927	2,486,943
ආනයන	16,055	20,637	2,974,915	4,104,218
සේවා (ශුද්ධ)	**819**	**1,586**	**150,014**	**316,225**
ලැබීම්	3,035	2,475	559,615	493,320
ගෙවීම්	2,216	889	409,601	177,095
ප්‍රාථමික ආදායම් (ශුද්ධ)	**-2,205**	**-2,018**	**-423,063**	**-406,605**
ලැබීම්	198	116	36,766	22,769
ගෙවීම්	2,404	2,134	459,829	429,374
ද්විතීයික ආදායම් (ශුද්ධ)	**6,207**	**5,228**	**1,150,789**	**1,034,694**
ද්විතීයික ආදායම්: ලැබීම්	7,117	5,498	1,319,377	1,088,388
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	7,104	5,491	1,317,007	1,087,188
රජයේ සංක්‍රාම	13	6	2,371	1,200
ද්විතීයික ආදායම්: ගෙවීම්	910	270	168,589	53,694
ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**28**	**25**	**5,193**	**5,009**
ප්‍රාග්ධන ගිණුම: ලැබීම්	51	50	9,472	9,850
ප්‍රාග්ධන ගිණුම: ගෙවීම්	23	24	4,279	4,841
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**-1,159**	**-3,318**	**-233,056**	**-667,951**
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-394**	**-4,029**	**-77,578**	**-962,044**
සෘජු ආයෝජන: වත්කම්	**15**	**17**	**2,699**	**3,468**
සෘජු ආයෝජන: වගකීම්	**434**	**598**	**80,592**	**118,973**
විවිධ ආයෝජන: වත්කම්	-	-	-	-
විවිධ ආයෝජන: වගකීම්	**-2,383**	**-906**	**-441,922**	**-181,568**
හිමිකම්	-217	-236	-40,223	-46,914
ණය සුරැකුම්පත්	-2,166	-670	-401,700	-134,654
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන: වත්කම්	**-136**	**387**	**-27,446**	**77,454**
මුදල් සහ තැන්පතු	64	306	11,666	62,761
වෙළඳ ණය සහ අත්තිකාරම්	-224	257	-41,647	51,199
අනෙකුත් ලැබිය යුතු ගිණුම්	24	-176	2,535	-36,506
අනෙකුත් ආයෝජන: වගකීම්	**231**	**2,216**	**38,567**	**605,734**
මුදල් සහ තැන්පතු	-15	4,016	-3,519	810,195
ණය	174	-1,552	29,568	-309,188
මහ බැංකුව	-14	-57	-2,689	-11,377
තැන්පතු භාරගන්නා ආයතන	75	-2,152	10,390	-429,506
රජය	169	664	31,961	132,662
අනෙකුත් අංශ	-56	-7	-10,093	-968
වෙළඳ ණය සහ අත්තිකාරම්	185	-428	32,565	-87,756
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	-114	180	-20,046	34,713
විශේෂ ගැනුම් හිමිකම්	-	787	-	157,771
සංචිත වත්කම්	**-1,992**	**-2,526**	**-375,594**	**-499,826**
මූල්‍ය රත්‍රන්	-667	-212	-123,485	-42,734
විශේෂ ගැනුම් හිමිකම්	-5	123	-825	24,635
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	-	-	-	-
අනෙකුත් සංචිත වත්කම්	-1,319	-2,437	-251,284	-481,726
මුදල් සහ තැන්පතු	-177	1,536	-37,326	300,122
සුරැකුම්පත්	-1,143	-3,976	-214,172	-782,339
ශුද්ධ වැරදීම් හා අත්හැරීම්	**765**	**-711**	**155,478**	**-294,093**
සමස්ත ශේෂය (ඇ)	**-2,328**	**-3,967**	**-405,854**	**-745,312**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස				
වෙළඳ ගිණුම	-7.4	-9.6		
භාණ්ඩ හා සේවා	-6.4	-7.8		
ජංගම ගිණුම	-1.5	-4.0		
ජංගම හා ප්‍රාග්ධන ගිණුම	-1.4	-3.9		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.12 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.1 රූප සටහන
විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය



5

5.2 රූප සටහන
ගෙවුම් තුලනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.2 සංඛ්‍යා සටහන
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)			2021 (ආ)		
	බැර	හර	ශුද්ධ	බැර	හර	ශුද්ධ
භාණ්ඩ හා සේවා	**13,083**	**18,271**	**-5,189**	**14,974**	**21,526**	**-6,552**
භාණ්ඩ	**10,047**	**16,055**	**-6,008**	**12,499**	**20,637**	**-8,139**
වෙළඳ භාණ්ඩ	10,047	16,047	-5,999	12,499	20,636	-8,138
මූල්‍ය නොවන රත්‍රන්	-	9	-9	-	1	-1
සේවා	**3,035**	**2,216**	**819**	**2,475**	**889**	**1,586**
ප්‍රවාහන	1,174	1,059	114	608	256	352
මුහුදු ප්‍රවාහන	702	635	67	450	150	300
නැව් කුලී	702	635	67	450	150	300
ගුවන් ප්‍රවාහන	472	424	48	158	106	52
මගී ගාස්තු	394	354	40	108	89	19
ගුවන් කුලී	78	71	7	50	17	33
සංචාරක (ඇ)	682	449	234	507	239	268
ඉදිකිරීම්	7	10	-3	10	11	-1
රක්ෂණ සහ විශ්‍රාම වැටුප්	39	82	-42	20	37	-17
මූල්‍ය සේවා	96	220	-125	95	102	-7
විදුලි සන්දේශ සහ පරිගණක සේවා	995	288	706	1,201	171	1,030
විදුලි සන්දේශ	24	32	-8	32	31	2
පරිගණක සේවා	971	257	714	1,168	140	1,028
වෙනත් ව්‍යාපාරික සේවා	16	37	-21	16	17	-1
රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)	26	70	-44	19	57	-38
ප්‍රාථමික ආදායම්	**198**	**2,404**	**-2,205**	**116**	**2,134**	**-2,018**
සේවක වැටුප්	36	132	-96	30	74	-43
ආයෝජන ආදායම්	162	2,271	-2,110	86	2,060	-1,975
සෘජු ආයෝජන	17	636	-619	16	647	-631
ලාභාංශ	14	445	-431	12	357	-345
ප්‍රති ආයෝජිත ඉපැයුම්	3	191	-188	4	290	-286
විවිධ ආයෝජන	-	943	-943	-	818	-818
හිමිකම්	-	35	-35	-	26	-26
පොලී ආදායම්	-	908	-908	-	793	-793
කෙටි කාලීන	-	2	-2	-	...	...
දිගු කාලීන	-	905	-905	-	793	-793
අනෙකුත් ආයෝජන	56	693	-637	43	595	-552
සංචිත වත්කම්	89	-	89	27	-	27
ද්විතීයික ආදායම්	**7,117**	**910**	**6,207**	**5,498**	**270**	**5,228**
රජය	13	-	13	6	-	6
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	7,104	910	6,194	5,491	270	5,221
ජංගම ගිණුම	**20,398**	**21,585**	**-1,187**	**20,587**	**23,930**	**-3,343**
ප්‍රාග්ධන ගිණුම	**51**	**23**	**28**	**50**	**24**	**25**
ප්‍රාග්ධන සංක්‍රාම	51	23	28	50	24	25
රජය	24	-	24	11	-	11
සංස්ථා සහ කුටුම්බ	27	23	4	38	24	14
ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම	**20,449**	**21,608**	**-1,159**	**20,637**	**23,955**	**-3,318**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.2 ජංගම ගිණුමේ ශේෂය

සේවා ගිණුම් ශේෂයේ වැඩිවීම සහ ප්‍රාථමික ආදායම් ගිණුම් හිඟය අඩුවීම හමුවේ වුව ද, වෙළඳ හිඟය පුළුල් වීම සහ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. අපනයන ආදායමට සාපේක්ෂව ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0ක සාපේක්ෂ අඩු වෙළඳ හිඟය සමඟ සැසඳීමේ දී 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 8.1ක පමණ පුළුල් වෙළඳ හිඟයක් වාර්තා විය. තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ සේවා සහ ප්‍රවාහන අංශය වර්ධනය වීම් හේතුවෙන් ඇති වූ ඉහළ ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස සේවා ගිණුමේ අතිරික්තය වැඩි විය. වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී සංචාරක අංශය ද යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කරන ලදී. සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ප්‍රතිආයෝජිත ඉපැයීම්වල වැඩිවීමක් තිබියදීත්, විදේශීය ආයෝජකයන් සතු රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන කූපන ගෙවීම් සහ විදේශීය සෘජු ආයෝජන සමාගම්හී ලාභාංශ ගෙවීම් අඩුවීමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු විය. 2020 වසර සමඟ සැසඳීමේ දී විශේෂයෙන් ම 2021 වසරේ අවසාන භාගයේ දී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස අඩු වීමට එවකට පැවති නිල විනිමය අනුපාතිකයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපොළෙහි විනිමය අනුපාතිකයෙහි කැපී පෙනෙන වෙනසක් පැවතීම හේතු වූවා විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී වාර්තා වූ

5

එ.ජ. ඩොලර් බිලියන 1.2ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.3ක් දක්වා පුළුල් විය. ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම සහ සමස්ත නිමැවුමේ සිදු වූ සුළු වර්ධනය පිළිබිඹු කරමින්, ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී වාර්තා වූ සියයට 1.5 සමඟ සැසඳීමේ දී 2021 වසරේ දී සියයට 4.0ක් විය.

5.2.1 වෙළඳ ගිණුම

වෙළඳ ශේෂය

පසුගිය වසර දෙක තුළ පහළ ගිය වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ දී කැපී පෙනෙන ලෙස පුළුල් වූ අතර ස්ථාවර අපනයන වර්ධනය ඉක්මවා ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම එයට හේතු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,008ක් වූ වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,139ක් දක්වා පුළුල් විය. වෙළඳ හිඟයෙහි ප්‍රසාරණයට ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධන මිල ඇතුළුව භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් වීම හේතුවෙන් ආනයනික අයිතම සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම, එන්නත් වැනි බෙහෙත් සහ ඖෂධීය අයිතම සඳහා වූ ආනයන වියදම ඉහළ යෑම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය මත පනවා තිබූ ඇතැම් සීමා ලිහිල් කිරීම යනාදිය දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2020 වසරේ වාර්තා වූ සියයට 7.4ට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 9.6ක් දක්වා පුළුල් විය.

අපනයන හා ආනයන ක්‍රියාකාරිත්වය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

අපනයන ක්‍රියාකාරිත්වය

වසරක් සඳහා වූ ඉහළම අපනයන ආදායම් මට්ටම වාර්තා කරමින් වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,499ක් දක්වා ළඟා වූ අතර, එය 2019 වසරේ වාර්තා කරන ලද මෙයට පෙර ඉහළම අපනයන ආදායම වන එ.ජ. ඩොලර් මිලියන 11,940 ඉක්මවා ගියේය. ඒ අනුව, අපනයන ආදායම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,047ට සාපේක්ෂව සියයට 24.4කින් වර්ධනය විය. ශක්තිමත් අපනයන ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූනි මාසයේ සිට අඛණ්ඩව සෑම මසක ම අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා ගියේය. තවද, 2021 නොවැම්බර් මාසයේ දී, මෙතෙක් වාර්තා කරන ලද ඉහළම මාසික අපනයන ආදායම වන එ.ජ. ඩොලර් මිලියන 1,211ක අගය වාර්තා කරන ලදී. 2021 වසරේ දී අපනයන ආදායම ඉහළ යෑම බොහෝ අපනයන කාණ්ඩයන්හි ආදායම් පුළුල් පදනමකින් ඉහළ යෑම හේතුවෙන් සිදු විය. ඉහළ අපනයන ආදායම් සඳහා, විශේෂයෙන් ම අපනයනාභිමුඛ කර්මාන්ත සහ වසංගතයේ බලපෑමට ලක් වූ කර්මාන්ත වෙත නව පසුවිපරම් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සහ දිරිගැන්වීම් ලබා දීම හරහා, රජය, මහ බැංකුව සහ අනෙකුත් අදාළ බලධාරීන්ගේ විශේෂ ප්‍රතිපත්තිමය අවධානය හිමිවීම, කඩිනම් එන්නත්කරණ වැඩසටහන හේතුවෙන් දේශීය නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වීම සහ ගෝලීය වෙළඳපොළ සාමාන්‍ය තත්ත්වයට පත් වීම සමඟ

5

5.3 රූප සටහන
අපනයන, ආනයන සහ වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් බිලියන)



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5.4 රූප සටහන
අපනයන සංයුතිය - 2021



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5.3 සංඛ්‍යා සටහන
අපනයන සංයුතිය

කාණ්ඩය	2020		2021 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස් වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
කෘෂිකාර්මික අපනයන	**2,336.2**	**23.3**	**2,729.5**	**21.8**	**393.3**	**16.8**	**16.0**
තේ	1,240.9	12.4	1,324.4	10.6	83.4	6.7	3.4
කුළුබඩු	333.5	3.3	454.8	3.6	121.3	36.4	4.9
පොල්	345.2	3.4	425.2	3.4	80.1	23.2	3.3
මුහුදු ආහාර	189.8	1.9	274.1	2.2	84.3	44.4	3.4
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	134.7	1.3	148.8	1.2	14.1	10.5	0.6
රබර්	30.1	0.3	42.2	0.3	12.1	40.1	0.5
සකස් නොකළ දුම්කොළ	25.5	0.3	31.6	0.3	6.1	23.9	0.2
එළවළු	36.6	0.4	28.5	0.2	-8.0	-22.0	-0.3
කාර්මික අපනයන	**7,672.0**	**76.4**	**9,702.0**	**77.6**	**2,030.0**	**26.5**	**82.8**
රෙදිපිළි හා ඇඟලුම්	4,423.1	44.0	5,435.1	43.5	1,012.1	22.9	41.3
රබර් නිෂ්පාදිත	786.1	7.8	1,050.4	8.4	264.4	33.6	10.8
ආහාර, පාන වර්ග හා දුම්කොළ	464.0	4.6	586.9	4.7	122.8	26.5	5.0
ඛනිජතෙල් නිෂ්පාදිත	373.6	3.7	506.4	4.1	132.8	35.6	5.4
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	337.5	3.4	500.9	4.0	163.4	48.4	6.7
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	181.5	1.8	276.7	2.2	95.2	52.5	3.9
රසායනික නිෂ්පාදිත	172.7	1.7	223.2	1.8	50.5	29.2	2.1
මූල ලෝහ හා උපාංග	110.9	1.1	156.4	1.3	45.5	41.1	1.9
සත්ත්ව ආහාර	102.9	1.0	149.4	1.2	46.5	45.2	1.9
ප්‍රවාහන උපකරණ	71.4	0.7	148.2	1.2	76.8	107.5	3.1
අනෙකුත් කාර්මික අපනයන	648.4	6.5	668.5	5.3	20.1	3.1	0.8
ඛනිජ අපනයන	**25.1**	**0.2**	**44.5**	**0.4**	**19.4**	**77.3**	**0.8**
වර්ග නොකළ අපනයන	**14.1**	**0.1**	**22.6**	**0.2**	**8.5**	**60.1**	**0.3**
මුළු අපනයන (ආ) (ඇ)	**10,047.4**	**100.0**	**12,498.6**	**100.0**	**2,451.2**	**24.4**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)	**185.52**		**198.88**				

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

ඉල්ලුම් සහ සැපයුම් වෙළඳපොළ දාමයන් ද්විත්වයම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන පරිමා සහ ඒකක මිල දර්ශකයන්හී වෙනස්වීම් මගින් පැහැදිලි වන පරිදි, අපනයන ආදායම ඉහළ යෑමට අපනයන පරිමාව වැඩි වීම සැලකිය යුතු ලෙස දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන ආදායම 2020 වසරේ වාර්තා වූ සියයට 12.4ක සිට 2021 වසරේ දී සියයට 14.8ක් දක්වා ඉහළ ගියේය.

කාර්මික භාණ්ඩ අපනයන ආදායම සමස්ත අපනයනයන්ගෙන් සියයට 78කට පමණ දායක වෙමින් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,702ක් දක්වා සියයට 26.5කින් ඉහළ ගියේය. කාර්මික අපනයන කාණ්ඩය පුළුල් පදනමකින් වර්ධනය වූ අතර, රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම 2021 වසරේ දී සියයට 22.9ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 5,435ක් දක්වා ළඟා වූ අතර, එය සමස්ත අපනයන ආදායම ඉහළ යෑමට සියයට 40 කට වඩා වැඩි දායකත්වයක් දැක්වීය. සියලුම ප්‍රධාන ඇඟලුම් අපනයන ගමනාන්තයන්ගෙන් ලැබූ ආදායම ඉහළ යෑම මෙම වැඩි වීමට හේතු විය. රබර් නිෂ්පාදිත අංශයට ඉහළ ක්‍රියාකාරිත්වයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් ඝන ටයර් සහ ගෘහාශ්‍රිත රබර් අත්වැසුම් ඇතුළු රබර් නිෂ්පාදිත අපනයන සහාය වූ අතර, රබර් නිෂ්පාදිත අපනයන, ඇඟලුම් සහ තේ අපනයනයෙන් පසු එ.ජ. ඩොලර් බිලියනය සීමාව ඉක්මවූ ශ්‍රී ලංකාවේ තුන්වැනි ප්‍රධානතම අපනයන අංශය බවට පත් විය. ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන්යානා ඉන්ධන අපනයන හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර සපයන ලද පරිමාව අඩු වුවද, නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන මිලෙහි සාමාන්‍යය ඉහළ යෑම එයට හේතු විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයේ ඉහළ යෑමට අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත, සත්ත්ව හෝ එළවළු මේද

සහ තෙල්, සහ මෘද්වංගී (ප්‍රධාන වශයෙන්, කකුළුවන් වැනි) සකස් කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ පුද්ගලික සනීපාරක්ෂක උපකරණ සඳහා වන ඉල්ලුම අඩු වීම පෙන්නුම් කරමින්, 2021 වසර තුළ දී රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, මුහුණු ආවරණ) සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ග කරන ලද ප්ලාස්ටික් ඇඳුම් උපාංග අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

බොහෝ උප කාණ්ඩයන්හී කාර්යසාධනය ඉහළ යෑමත් සමඟ 2020 වසරට සාපේක්ෂව කෘෂිකාර්මික අපනයන 2021 වසරේ දී සියයට 16.8ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම ඉහළ යෑම සඳහා කුළුබඩු, තේ, මුහුදු ආහාර සහ පොල් නිෂ්පාදිත ආදායම ඉහළ යෑම මූලිකව දායක වූ අතර, එළවළු අපනයන ආදායම පහළ ගියේය. අපනයන මිලෙහි සාමාන්‍ය පහළ යෑම අභිබවා අපනයන පරිමාව සියයට 7.7කින් ඉහළ යෑම 2021 වසරේ දී තේ අපනයන ආදායම ඉහළ යෑම සඳහා හේතු විය. ස්වාභාවික රබර්, කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු සහ සාදික්කා) සහ සකස් නොකළ දුම්කොළ අපනයන ඉහළ යෑම සඳහා අපනයන මිල ගණන් ඉහළ යෑම හේතු වූ අතර, මුහුදු ආහාර, ගම්මිරිස් සහ පොල් (පොල් මද ආශ්‍රිත/ ආශ්‍රිත නොවන නිෂ්පාදිත දෙවර්ගයම) ඉහළ ආදායම් වාර්තා කරනු ලැබූයේ අපනයන මිල සහ පරිමාවන් යන දෙඅංශයම ඉහළ යෑම හේතුවෙනි. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ ආදායම ඉහළ යෑමට පලතුරු, ධාන්‍ය වර්ග සහ වාෂ්පශීලි තෙල් වර්ග අපනයන පරිමාවන් ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, මිල ඉහළ මට්ටමක පැවතියද, එළවළු අපනයන ක්‍රියාකාරිත්වය දුර්වල වීමට අඩු අපනයන පරිමාවන් හේතු විය.

සමස්ත අපනයනයෙන් සියයට 1කට වඩා අඩු දායකත්වයක් දැක්වූ ඛනිජ අපනයන ආදායම 2021 වසරේ දී පසුගිය වසරට සාපේක්ෂව සියයට 77.3කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ලෝපස්, ලෝබොර සහ අළු උප කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති ටයිටේනියම් ලෝපස් මූලික වශයෙන් දායක වූ අතර, පස් හා පාෂාණ සහ අගනා ලෝහ අපනයන ආදායම වැඩි වීම සඳහා ස්වාභාවික මිනිරන් සහ ක්වාට්ස් ඉහළ යෑම හේතු විය.

ආනයන ක්‍රියාකාරිත්වය

ප්‍රධාන වශයෙන් පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන ඇතුළුව ඇතැම් ආනයන මත සීමා පැනවීම් අඛණ්ඩව ක්‍රියාත්මක වීම මධ්‍යයේ වුවද, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 20,637ක් දක්වා සියයට 28.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන ඉතා පහළ මට්ටමක පැවතුණ ද, දේශීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීමත් සමඟ යෙදවුම් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම, ඉන්ධන මිල ඇතුළුව ගෝලීය භාණ්ඩ වෙළඳපොළ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම, ඛනිජ තෙල් පිරිපහදුව වරින් වර වසා දැමීම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් මත යැපීම ඉහළ යෑම, එන්නත් වැනි බෙහෙත් සහ ඖෂධීය අයිතම මත ආනයන වියදම ඉහළ යෑම සහ ඇතැම් ආනයන සීමා ලිහිල් කිරීම ආනයන ඉහළ යෑම සඳහා මූලිකව හේතු විය. ප්‍රධාන ආනයන කාණ්ඩයන් සියල්ලම පාහේ ඉහළ යෑම මගින් නිරූපණය කරන පරිදි ආනයන ඉහළ යෑම පුළුල් පදනමක් ගන්නා ලදී. ආනයන පරිමා සහ ඒකක මිල දර්ශකයන්හී වෙනස්කම් හරහා නිරීක්ෂණය කළ අයුරින්, පරිමාවන් සහ මිල වෙනස්වීම්හී බලපෑම ප්‍රධාන ආනයන කාණ්ඩ මත විවිධාකාර වූ නමුත් සාමාන්‍යයෙන් ආනයන වියදම පරිමා සහ මිල දෙඅංශයේම ඉහළ යෑමේ බලපෑමට ලක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආනයන වියදම 2020 වසරේ වාර්තා වූ සියයට 19.8 හා සැසඳීමේ දී 2021 වසරේ සියයට 24.4ක් දක්වා ඉහළ ගියේය.

5.5 රූප සටහන
ආනයන සංයුතිය - 2021



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ආනයන වියදමින් අඩකට වඩා දායක වන අන්තර් භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ ආනයන ඉහළ යෑමට විශාල වශයෙන් හේතු විය. වසර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 12,309ක් දක්වා සියයට 35.6කින් ඉහළ ගියේය. රටේ

5

ආනයන ලැයිස්තුවෙහි විශාලතම වියදම් අයිතමය ලෙස බොර තෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් (එල්. පී. ගෑස් ඇතුළුව) සහ ගල් අඟුරු සඳහා වූ ඉන්ධන ආනයන වියදම 2020 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 2,543 හා සැසඳීමේදී 2021 වසර තුළදී, එ.ජ. ඩොලර් මිලියන 3,743ක් දක්වා ඉහළ ගියේය. බොර තෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාවන් පහළ යෑමේ බලපෑම ඉක්මවා යමින් මෙම සියලුම උප කාණ්ඩයන්හී මිල ගණන්හි සාමාන්‍යය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව ඉහළ යෑම ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම සඳහා හේතු විය. දෙවන විශාලතම ආනයන අයිතමය වන රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයන වියදම පළමු වරට එ.ජ. ඩොලර් බිලියන 3 සීමාව පසු කර ගියේය. යුරෝපා සංගමයේ රටවල්, එක්සත් රාජධානිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ප්‍රධාන අපනයන ගමනාන්තයන්ගෙන් ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා වන ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා භාවිත කරනු ලබන රෙදි සහ කෙඳි වර්ග සඳහා වන ආනයන වියදම ඉහළ යෑම මෙයට මූලිකව හේතු විය. රසායනික නිෂ්පාදිත ආනයන (ප්‍රධාන වශයෙන්, කාබන්) පළමුවරට එ.ජ. ඩොලර් බිලියනයේ සීමාව පසු කර ගිය අතර, මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ), ප්‍රාථමික ආකාරයේ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, සහ ස්වාභාවික හා කෘත්‍රිම රබර් ඇතුළු අනෙකුත් ආනයන කාණ්ඩ වසර තුළ ඉහළ වර්ධන අනුපාත වාර්තා කළේය. කෙසේ වුවද, 2021 වසරේ බොහෝ කාලයක් පුරාවට පැවති රසායනික පොහොර ආනයන තහනම හේතුවෙන් පොහොර (ප්‍රධාන වශයෙන්, යූරියා) සඳහා වන වියදම පහළ ගිය අතර, සකස් නොකළ දුම්කොළ සහ සිමෙන්ති ක්ලින්කර් ආදී වූ ඛනිජ නිෂ්පාදිත වියදම් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී පහළ ගියේය.

5.4 සංඛ්‍යා සටහන
ආනයන සංයුතිය

කාණ්ඩය	2020		2021 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස්වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
පාරිභෝගික භාණ්ඩ	**3,401.7**	**21.2**	**3,848.7**	**18.6**	**447.0**	**13.1**	**9.8**
ආහාර හා පාන වර්ග	1,554.4	9.7	1,666.5	8.1	112.1	7.2	2.4
සහල්	10.5	0.1	73.0	0.4	62.5	595.3	1.4
සීනි හා රසකැවිලි	277.1	1.7	288.8	1.4	11.7	4.2	0.3
කිරි නිෂ්පාදිත	333.8	2.1	317.7	1.5	-16.1	-4.8	-0.4
පරිප්පු	96.9	0.6	143.0	0.7	46.1	47.5	1.0
වෙනත්	836.0	5.2	843.9	4.1	7.9	0.9	0.2
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	1,847.3	11.5	2,182.2	10.6	334.9	18.1	7.3
බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත	595.5	3.7	882.5	4.3	287.0	48.2	6.3
විදුලි සංදේශ මෙවලම්	268.4	1.7	382.9	1.9	114.5	42.6	2.5
ගෘහ උපකරණ	174.2	1.1	257.1	1.2	82.9	47.6	1.8
රෙදිපිළි හා උපාංග	200.7	1.2	221.3	1.1	20.7	10.3	0.5
වෙනත්	608.5	3.8	438.4	2.1	-170.0	-27.9	-3.7
අන්තර් භාණ්ඩ	**9,076.5**	**56.5**	**12,308.9**	**59.6**	**3,232.4**	**35.6**	**70.5**
ඉන්ධන	2,542.6	15.8	3,742.9	18.1	1,200.3	47.2	26.2
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	2,335.1	14.5	3,066.9	14.9	731.9	31.3	16.0
රසායනික නිෂ්පාදිත	831.5	5.2	1,074.4	5.2	242.9	29.2	5.3
මූල ලෝහ	460.3	2.9	866.4	4.2	406.1	88.2	8.9
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	540.2	3.4	765.7	3.7	225.6	41.8	4.9
කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	383.1	2.4	468.9	2.3	85.8	22.4	1.9
තිරිඟු හා ඉරිඟු	384.4	2.4	418.3	2.0	33.8	8.8	0.7
අනෙකුත් අන්තර් භාණ්ඩ	1,599.4	10.0	1,905.4	9.2	306.0	19.1	6.7
ආයෝජන භාණ්ඩ	**3,563.2**	**22.2**	**4,462.7**	**21.6**	**899.5**	**25.2**	**19.6**
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	2,176.1	13.6	2,809.5	13.6	633.4	29.1	13.8
ගොඩනැගිලි ද්‍රව්‍ය	1,035.6	6.5	1,248.9	6.1	213.2	20.6	4.7
ප්‍රවාහන උපකරණ	348.3	2.2	398.5	1.9	50.2	14.4	1.1
අනෙකුත් ආයෝජන භාණ්ඩ	3.2	0.02	5.8	0.03	2.6	81.4	0.1
වර්ග නොකළ ආනයන	**14.0**	**0.1**	**17.1**	**0.1**	**3.1**	**22.2**	**0.1**
මුළු ආනයන (ආ) (ඇ)	**16,055.4**	**100.0**	**20,637.4**	**100.0**	**4,582.0**	**28.5**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඇ)	**185.52**		**198.88**				

(අ) තාවකාලික
(ආ) ප්‍රතිආනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඇ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5.5 සංඛ්‍යා සටහන

ප්‍රධාන ආනයනවල පරිමාවන්

මෙට්‍රික් ටොන් දහස්

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)
පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)	**4,895**	**4,959**	**4,740**	**4,028**	**4,553**
පළමු කාර්තුව	1,275	1,382	1,199	1,249	1,378
දෙවන කාර්තුව	1,123	1,207	1,206	678	1,008
තෙවන කාර්තුව	1,336	1,317	1,211	1,123	865
සිව්වන කාර්තුව	1,161	1,054	1,124	978	1,302
තිරිඟු	**1,250**	**1,297**	**1,159**	**1,404**	**1,307**
පළමු කාර්තුව	291	412	164	272	323
දෙවන කාර්තුව	334	329	318	285	288
තෙවන කාර්තුව	359	285	292	498	335
සිව්වන කාර්තුව	265	271	385	348	360
බොරතෙල් (ආ)	**1,591**	**1,674**	**1,842**	**1,667**	**1,182**
පළමු කාර්තුව	282	283	461	464	274
දෙවන කාර්තුව	376	459	460	265	368
තෙවන කාර්තුව	464	461	461	568	362
සිව්වන කාර්තුව	469	471	460	370	178
සීනි	**498**	**645**	**556**	**683**	**582**
පළමු කාර්තුව	108	205	140	193	293
දෙවන කාර්තුව	158	166	153	108	140
තෙවන කාර්තුව	101	119	100	209	14
සිව්වන කාර්තුව	132	154	164	172	136
පොහොර	**399**	**861**	**707**	**952**	**412**
පළමු කාර්තුව	78	256	148	88	114
දෙවන කාර්තුව	73	154	142	294	182
තෙවන කාර්තුව	129	225	238	126	17
සිව්වන කාර්තුව	119	226	179	444	98
සහල්	**748**	**249**	**24**	**16**	**147**
පළමු කාර්තුව	259	203	8	8	3
දෙවන කාර්තුව	79	37	3	2	4
තෙවන කාර්තුව	160	2	5	2	3
සිව්වන කාර්තුව	250	7	8	4	137

(අ) තාවකාලික
(ආ)ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ආනයන වියදමෙන් සියයට 22ක් පමණ වන ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,463ක් දක්වා සියයට 25.2කින් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස් හැර, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ යටතේ වර්ග කර ඇති සියලුම ආනයන අයිතම සඳහා වූ වියදම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ ගිය අතර, මෙම ඉහළ යෑම සඳහා කාර්යාල යන්ත්‍රසූත්‍ර (ප්‍රධාන වශයෙන්, පරිගණක), සන්නිවේදන උපාංග (ප්‍රධාන වශයෙන්, සම්ප්‍රේෂණ උපකරණ) සහ වෛද්‍ය සහ රසායනාගාර උපකරණ ප්‍රධාන වශයෙන් දායක විය. ඇතැම් ආනයන සීමා 2021 වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වුවද, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ (වාණිජ කටයුතු සඳහා භාවිතයට ගැනෙන රථවාහන ඇතුළුව) ආනයන ද ඉහළ ගියේය. සිමෙන්ති ආනයන වියදම අවම වීම මධ්‍යයේ වුවද, ගොඩනැගිලි ද්‍රව්‍ය කාණ්ඩයේ ඉහළ යෑම සඳහා යකඩ සහ වානේ ආනයන හේතු වූ අතර, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ යෑම සඳහා කෘෂිකාර්මික ට්‍රැක්ටර්, ලොරි රථ සහ දුම්රිය උපකරණ ප්‍රධාන වශයෙන් හේතු විය.

ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,847ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,182ක් දක්වා සියයට 18.1කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා විශාලතම දායකත්වය බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත දැක්වූ අතර, විශේෂයෙන් ම කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන යටතේ ආනයනය කරන ලද එන්නත් මෙයට මූලික විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයේ කැපී පෙනෙන ඉහළ යෑම සඳහා දායක වූ අනිකුත් කාණ්ඩ අතර ජංගම දුරකථන, රබර් ටයර් සහ රූපවාහිනී යන්ත්‍ර විය. කෙසේ වුවද, 2020 වසරේ මාර්තු මාසයේ සිට රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද සීමා පැනවීම් අඛණ්ඩව ක්‍රියාත්මක වීම සමඟ, 2019 සහ 2020 වසරවලට සාපේක්ෂව 2021 වසරේ දී පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයනය කිරීම ඉතා පහළ මට්ටමක පැවතුණි.

ආහාර සහ පාන වර්ග ආනයන වියදම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 7.2කින් ඉහළ ගියේය. ආහාර සහ පාන වර්ග කාණ්ඩය යටතේ ආනයන වියදමෙහි විශාලතම ඉහළ යෑම සඳහා තෙල් සහ මේද වර්ග කාණ්ඩය යටතේ වර්ග කර ඇති පොල්තෙල් ආනයනය හේතු වූ අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත කාණ්ඩයේ, විශේෂයෙන් වසර අවසානය වන විට, සැලකිය යුතු වැඩි වීමක් (2021 වසරේ අවසාන මාස දෙක තුළ එ.ජ. ඩොලර් මිලියන 63ක් පමණ) වාර්තා කිරීම සඳහා සහල් ආනයන හේතු විය. 2021 වසරේ ඉහළ ආනයන වියදම් වාර්තා කළ අනිකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වූයේ පරිප්පු, සීනි සහ නැවුම් පලතුරුය. කෙසේ වුවද, 2021 වසර තුළ දී, මුහුදු ආහාර, පාන වර්ග සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ ගිය අතර පිළිවෙළින්, ටින්කළ මාලු හා හාල්මැස්සන්, මධ්‍යසාර පාන වර්ග සහ කිරිපිටි ආනයන වියදම් අඩු වීම එයට හේතු විය. ආහාර සහ පාන වර්ග ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සඳහා මිල ගණන් ඉහළ යෑම විශාල වශයෙන් දායක විය.

5.6 සංඛ්‍යා සටහන

වෙළඳ දර්ශක (අ)

2010 = 100

කාණ්ඩය	වටිනාකම් දර්ශකය			පරිමා දර්ශකය			ඒකක වටිනාකම් දර්ශකය		
	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%
අපනයන									
කෘෂිකාර්මික අපනයන	**101.3**	**118.4**	**16.8**	**90.5**	**101.1**	**11.7**	**112.0**	**117.1**	**4.6**
තේ	86.2	92.0	6.7	80.7	87.2	8.0	106.8	105.5	-1.2
රබර්	17.4	24.3	40.1	29.4	29.3	-0.5	59.1	83.2	40.8
පොල්	208.4	256.7	23.2	168.0	188.1	11.9	124.0	136.5	10.1
කුළුබඩු	161.0	219.5	36.4	114.5	146.9	28.3	140.6	149.4	6.3
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	188.6	208.3	10.5	173.1	188.4	8.8	108.9	110.6	1.5
කාර්මික අපනයන	**125.9**	**159.3**	**26.5**	**153.5**	**183.2**	**19.3**	**82.1**	**86.9**	**6.0**
රෙදිපිළි හා ඇඟලුම්	131.9	162.1	22.9	111.5	140.6	26.1	118.3	115.3	-2.5
ඛනිජ තෙල් නිෂ්පාදිත	141.9	192.4	35.6	238.5	282.8	18.6	59.5	68.0	14.3
රබර් නිෂ්පාදිත	141.2	188.7	33.6	100.0	112.6	12.7	141.3	167.6	18.6
ඛනිජ අපනයන	**103.6**	**183.7**	**77.3**	**68.6**	**111.4**	**62.6**	**151.2**	**164.8**	**9.1**
මුළු අපනයන	**116.5**	**145.0**	**24.4**	**132.9**	**156.9**	**18.0**	**87.7**	**92.4**	**5.4**
ආනයන									
පාරිභෝගික භාණ්ඩ	**137.5**	**155.5**	**13.1**	**128.0**	**127.8**	**-0.2**	**107.4**	**121.7**	**13.3**
ආහාර හා පාන වර්ග	117.5	126.0	7.2	127.4	125.5	-1.5	92.2	100.4	8.8
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	160.4	189.5	18.1	128.7	130.4	1.3	124.7	145.3	16.6
අන්තර් භාණ්ඩ	**112.8**	**152.9**	**35.6**	**140.2**	**152.0**	**8.5**	**80.5**	**100.6**	**25.0**
ඉන්ධන	83.6	123.1	47.2	133.1	134.2	0.8	62.8	91.7	46.1
පොහොර	107.8	65.9	-38.9	160.2	74.5	-53.5	67.3	88.4	31.4
රසායනික නිෂ්පාදිත	159.9	206.6	29.2	157.9	177.3	12.2	101.3	116.6	15.1
තිරිඟු සහ ඉරිඟු	144.8	157.6	8.8	138.9	134.2	-3.3	104.3	117.4	12.6
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	129.1	169.5	31.3	126.8	153.9	21.4	101.8	110.2	8.2
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	127.7	181.0	41.8	148.9	169.5	13.8	85.8	106.8	24.6
දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග	31.0	38.0	22.5	36.5	41.9	14.7	85.1	90.9	6.8
ආයෝජන භාණ්ඩ	**129.3**	**162.0**	**25.2**	**183.4**	**230.6**	**25.7**	**70.5**	**70.3**	**-0.4**
ගොඩනැගිලි ද්‍රව්‍ය	126.0	152.0	20.6	147.7	154.5	4.7	85.4	98.3	15.2
ප්‍රවාහන උපකරණ	58.8	67.3	14.4	50.4	46.7	-7.5	116.6	144.1	23.6
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	162.7	210.1	29.1	264.5	359.0	35.7	61.5	58.5	-4.9
වෙනත් ආයෝජන උපකරණ	96.2	174.5	81.4	112.9	142.6	26.4	85.2	122.3	43.5
මුළු ආනයන	**119.7**	**153.9**	**28.5**	**145.5**	**162.2**	**11.5**	**82.3**	**94.9**	**15.2**
වෙළඳ මිල අනුපාතය							**106.5**	**97.4**	**-8.6**

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳ මිල අනුපාතය

අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය ශ්‍රී ලංකාව සඳහා 2021 වසරේ දී පහළ ගියේය. අපනයන මිල දර්ශකය දර්ශකාංක 92.4ක් දක්වා සියයට 5.4කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය දර්ශකාංක 94.9ක් දක්වා සියයට 15.2ක ඉහළ අනුපාතයකින් ඉහළ ගියේය. අපනයන මිල ඉහළ යෑම සඳහා සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හී මිල දර්ශක ඉහළ යෑම දායක වූ අතර, අන්තර් භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයනයේදී වූ ඉහළ මිල ගණන් සමස්ත ආනයන මිල දර්ශකය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2021 වසරේ දී, වෙළඳ මිල අනුපාතය දර්ශකාංක 97.4ක් දක්වා සියයට 8.6කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ඉහළ යාමෙන් අපනයන ඒකකයකින් මිලදී ගත හැකි ආනයන ප්‍රමාණය අඩු වූ බව නිරූපණය විය.

2021 වසර තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම යන දෙඅංශයෙහිම ඉහළ යෑම සඳහා වෙළඳ පරිමාවන් පුළුල් වීම සැලකිය යුතු ලෙස දායක විය. ප්‍රධාන අපනයන කාණ්ඩ ත්‍රිත්වය සඳහා වන අපනයන පරිමා දර්ශක වර්ධනය වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන පරිමා දර්ශක

5.6 රූප සටහන
වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන පරිමා දර්ශක 2021 වසරේ සුළු වශයෙන් පහළ ගියේය.

වෙළඳ දිශාව

පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් නොවෙනස්ව පැවතුණි. වටිනාකම අනුව සැලකූ විට, 2021 වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා ලෙස ඉන්දියාව තම ස්ථානය නැවත වරක් අත් කරගත් අතර, ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය පිළිවෙළින් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් විය. එම රටවල් තුන සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳාමෙන් (අපනයන සහ ආනයන ද්විත්වය ම) සියයට 42කට පමණ දායක විය. ඉන්දියාව සහ චීනය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එක් එක් රට සඳහා එ.ජ. ඩොලර් බිලියන 5 ඉක්මවා ගිය අතර, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 3.5 ඉක්මවා ගියේය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය සහ ජර්මනිය අනිකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වූ අතර, එක් එක් රට සඳහා 2021 වසරේ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. 2021 වසරේ රටවල් අනුව වෙළඳ ශේෂ සලකා බැලීමේ දී, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, නෙදර්ලන්තය, ඉතාලිය සහ බෙල්ජියම වැනි බටහිර රටවල් සමඟ සැලකිය යුතු වෙළඳ අතිරික්තයන් වාර්තා වූ අතර, චීනය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මැලේසියාව සහ සිංගප්පූරුව ආදී වූ ආසියාතික රටවල් සමඟ සැලකිය යුතු වෙළඳ හිඟයයන් වාර්තා විය.

2021 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා රටවල් තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත විය. ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා තවදුරටත් තනි විශාලතම ගැනුම්කරුවා වූයේ සමස්ත අපනයන අතරින් සියයට 24.9ක්, එනම් එ.ජ. ඩොලර් බිලියන 3ක් ඉක්ම වූ අපනයන මිලදී ගනිමින් වන අතර, ඉන් පසුව, එක්සත් රාජධානිය (සියයට 7.5ක්), ඉන්දියාව (සියයට 6.6ක්), ජර්මනිය (සියයට 6.1ක්) සහ ඉතාලිය (සියයට 4.6ක්) ප්‍රධාන අපනයන ගමනාන්ත විය. 2021 වසරේ දී සමස්ත අපනයන ඉහළ යෑමට සමගාමීව බොහෝ අපනයන ගමනාන්තයන්හී ආදායම, ප්‍රධාන අපනයන ගමනාන්ත දහය ද ඇතුළුව, ඉහළ ගියේය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත අපනයන කරන ලද ප්‍රධාන භාණ්ඩ අතර විය. ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම තනි ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස 2021 වසරේ සමස්ත ඇඟලුම් අපනයන වටිනාකමෙන් සියයට 42කට දායක විය. එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයන අතර ඇඟලුම්, රබර් නිෂ්පාදිත, රෙදිපිළි උපාංග, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ මුහුදු ආහාර ප්‍රධාන විය. කුළුබඩු, සත්ත්ව ආහාර, රෙදිපිළි, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, දැව සහ කඩදාසි නිෂ්පාදිත සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ඉන්දියාව වෙත සිදු කළ අපනයන අතරට ඇතුළත් විය. කලාපයක් ලෙස යුරෝපා සංගමයට අයත් රටවල් වෙත 2021 වසරේ සිදු කළ අපනයන සමස්ත අපනයනවලින් සියයට

5

5.7 රූප සටහන
රටවල් අනුව වෙළඳ ශේෂයන් (එ.ජ. ඩොලර් මිලියන)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.8 රූප සටහන
අපනයන වෙළඳ දිශාව



මූලය: ශ්‍රී ලංකා රේගුව

5.9 රූප සටහන
ආනයන වෙළඳ දිශාව



*එක්සත් රාජධානිය අයත් නොවේ

මූලය: ශ්‍රී ලංකා රේගුව

5

24ක් පමණ වූ අතර සමස්ත ඇඟලුම් අපනයනයෙන් සියයට 30ක් පමණ ඊට ඇතුළත් විය. රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, තේ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත යුරෝපා සංගමයේ රටවල් වෙත සිදු කළ අනෙකුත් ප්‍රධාන අපනයන අතර වේ. 2021 වසරේ මැද පෙරදිග රටවල් සහ රුසියාව ඇතුළුව ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන ගමනාන්ත වූ අතර, සමස්ත තේ අපනයනයෙන් සියයට 58කට පමණ සාමූහිකව දායක විය.

ආසියානු කලාපයේ රටවල් 2021 වසරේ ශ්‍රී ලංකාව විසින් තවදුරටත් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රධාන රටවල් විය. 2021 වසරේ එ.ජ. ඩොලර් බිලියන 4.7කට වඩා වැඩි ආනයන ප්‍රමාණයකට හා සමස්ත ආනයන අතුරින් සියයට 23කට පමණ දායක වෙමින් චීනය අඛණ්ඩව තෙවැනි වතාවටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය විය. චීනයෙන් සිදු කළ ආනයන සඳහා වූ වියදම සියයට 33කින් ඉහළ යනු ලැබූයේ ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතුවෙනි. ඉන් අනතුරුව, ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2021 වසර සඳහා දෙවන සහ තෙවන ආනයන ප්‍රභව වූයේ, පිළිවෙළින්, සියයට 22.4ක සහ සියයට 6.8ක ප්‍රතිශතයක් සඳහා දායක වෙමිනි. ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, මූල ලෝහ සහ තිරිඟු හේතුවෙන් ඉන්දියාවෙන් සිදුකළ ආනයන සඳහා වූ වියදම සියයට 50කින් ඉහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදිත, මූල ලෝහ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් සිදු කළ ප්‍රධාන ආනයන වූ අතර, එය එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් සිදු කළ මුළු ආනයන අතරින් සියයට 86ක් පමණ සඳහා දායක විය. ආනයන ප්‍රභවයක් ලෙස 2021 වසරේ දී මැලේසියාව සඳහා සිව්වන ස්ථානය හිමිවූයේ ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර සැකසුම්, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රසායනික නිෂ්පාදිත සහ තෙල් සහ මේද වර්ග ආදී වූ ප්‍රධාන ආනයන අයිතම ඉහළ යෑම හේතුවෙනි. ඛනිජ තෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ 2021 වසරේ සිංගප්පූරුවෙන් ආනයනය කළ ප්‍රධාන භාණ්ඩ වේ. ආනයන ප්‍රභවයක් ලෙස 2020 වසරේ දී හයවන ස්ථානයේ වූ ජපානය එයට සාපේක්ෂව

2021 වසරේ දී දසවන ස්ථානය කරා පහත වැටුණේ ප්‍රධාන වශයෙන්ම වසර තුළ රථවාහන ආනයනය මත පනවා තිබුණු සීමා හේතුවෙනි.

විදේශ වෙළඳ ප්‍රතිපත්ති, ප්‍රවණතා සහ ආයතනික සහාය

වසංගතයේ විනාශකාරී බලපෑම් මධ්‍යයේ 2021 වසරේ වෙළඳ අංශය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය සහාය සහ අංශයේ සියලුම කොටස්කරුවන්ගේ ප්‍රයත්නයන් ඉවහල් විය. අපනයන අංශය පූර්ව වසංගත මට්ටම් අභිබවා යමින් යථා තත්ත්වයට පත්වීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ලබා දුන් ප්‍රතිපත්ති උත්තේජන සහ ප්‍රකෘතිමත් වෙමින් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන් ඒකාබද්ධව සහාය විය. වේගවත් අපනයන ප්‍රවර්ධනයක් ක්‍රියාත්මක කරමින් සහ අවම බදු අනුපාත පවත්වා ගනිමින් ඇතැම් කෘෂිකාර්මික සහ කාර්මික නිෂ්පාදන සඳහා ආනයන ආදේශක දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයාට සහාය දැක්වීම සඳහා වූ රජයේ උත්සාහයන් වසර පුරා

5.7 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

වරණීය වෙළඳ ගිවිසුම	2020	2021 (අ)			ප්‍රධාන අපනයන නිෂ්පාදන (අපනයන ප්‍රමාණ අනුව අනුපිළිවෙලින්)
	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වර්ධනය (%)	දායකත්වය (%)	
වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.)	3,671.8	4,312.7	17.5	80.8	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ)	1,907.0	2,402.1	26.0	45.0	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
එක්සත් රාජධානිය	690.9	680.7	-1.5	12.8	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, ප්‍රවාහන උපකරණ
ඇමෙරිකා එක්සත් ජනපදය (ඇ)	585.7	677.8	15.7	12.7	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රසායනික නිෂ්පාදිත, කුළුබඩු
රුසියානු සමූහාණ්ඩුව (ඈ)	142.2	132.9	-6.5	2.5	තේ, රබර් නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ඇඟලුම්, රසායනික නිෂ්පාදිත
ඕස්ට්‍රේලියාව	79.2	103.5	30.7	1.9	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත
කැනඩාව	61.0	87.9	44.0	1.6	රබර් නිෂ්පාදිත, ඇඟලුම්, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර
ජපානය	71.0	87.6	23.4	1.6	තේ, රසායනික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර
තුර්කිය	80.3	74.1	-7.7	1.4	තේ, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ඇඟලුම්, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත
වෙනත් ජී.එස්.පී. ක්‍රම	54.6	66.1	21.1	1.2	
ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි	358.4	525.8	46.7	9.9	සත්ත්ව ආහාර, ආහාර, පාන වර්ග හා දුම්කොළ, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, දැව හා කඩදාසි නිෂ්පාදිත
ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඉ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි	204.7	238.6	16.6	4.5	ඇඟලුම්, තේ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත
ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි	89.5	91.8	2.5	1.7	කුළුබඩු, මූල ලෝහ හා උපාංග, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, සත්ත්ව ආහාර, රබර් නිෂ්පාදිත
පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි	53.0	62.3	17.6	1.2	සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ස්වාභාවික රබර්, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි	42.2	101.6	140.6	1.9	කුළුබඩු, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග, රෙදිපිළි, තේ
සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි	0.8	1.4	83.6	0.03	රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රෙදිපිළි
වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන	**4,420.4**	**5,334.3**	**20.7**	**100.0**	
ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස	**44.0**	**42.7**			

(අ) තාවකාලික

(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ. එක්සත් රාජධානිය ඇතුළත් නොවේ.

(ඇ) එක්සත් ජනපදය මගින් ලබා දුන් ජී.එස්.පී. සහනය 2020 වසරේ දෙසැම්බර් 31 වන දින අවසන් වූ බැවින් ජී.එස්.පී. සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරන අතර එය 2021 වසර සඳහාද බලාපැවැත්වෙන පරිදි නැවත බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) රුසියාව, බෙලාරූස් හා කසකස්ථානය ඇතුළත් වේ.

(ඉ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: වාණිජ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

5

අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2021 වසර ආරම්භයේ දී, ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ ඒකාබද්ධ ප්‍රයත්නයක් තුළින් ඔවුන්ගේ කටයුතු විධිමත් සහ ඉලක්කගත ආකාරයකින් පෙළ ගැස්වීම හරහා අපනයන ආදායම සහ අනෙකුත් ණය නොවන විදේශ විනිමය ගලා ඒම් දිරිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, භාණ්ඩ වෙළඳාම (රෙදිපිළි සහ ඇඟලුම්, මැණික් සහ ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදිත, තේ, පොල් නිෂ්පාදිත, ධීවර, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික අපනයන බෝග), සංචාරක ඉපැයීම්, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශ ආයෝජන යනාදී සෑම ප්‍රධාන අංශයක් සඳහා ම මහ බැංකුව විසින් සම්බන්ධීකරණය කරනු ලබන අනු කමිටු කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම අනු කමිටු විසින් එක් එක් අංශවල ප්‍රගතියට බාධා කරනු ලබන ක්ෂණික ගැටලු සහ බාධක මගහරවා ගැනීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමින්, ලබා දෙන ලද ඉලක්ක සපුරාලීම සඳහා ප්‍රයත්න දරන ලදී. එමෙන්ම, වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම සඳහා වෙළඳ අමාත්‍යාංශය ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළේය. මේ අතර, ලෝක වෙළඳ සංවිධානය ලෝක භාණ්ඩ වෙළඳාම් පරිමාව 2021 වසරේ දී සියයට 9.8කින් (2020 වසරේ සියයට 5.0ක පහළ යෑමක සිට) සහ 2022 වසරේ දී සියයට 3.0ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, යෝග්‍ය ප්‍රතිපත්ති සහ සහාය තුළින් අන්තර්ජාතික වෙළඳපොළෙහි ශ්‍රී ලංකාවේ අපනයන කොටස ආරක්ෂා කිරීම සඳහා බලධාරීන් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

2021 වසරේ දී ආනයන සීමා කිරීම් කිහිපයක් ලිහිල් කරන ලදී. විදේශීය අංශය මත ඇති වූ පීඩනය හේතුවෙන් 2020 වසරේ මුල් භාගයේ දී රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආනයන සීමා කිරීම් 2021 වසරේ දී ක්‍රමයෙන් ඉවත් කරන ලදී. මේ සම්බන්ධයෙන් 2020 සහ 2021 වසර තුළ දී ආනයන පාලනය පිළිබඳ විධාන ඇතුළත් අතිවිශේෂ ගැසට්පත්‍ර මාලාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද තිරුබදු නිර්ණය කිරීමේ කමිටුවේ මගපෙන්වීම යටතේ ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී. දේශීය කර්මාන්තවලට සහ පාරිභෝගිකයන්ට අවම බලපෑමක් ඇති වන පරිදි විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මූලික වශයෙන් තෝරාගත් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයනික භාණ්ඩ සඳහා තාවකාලික පදනමක් මත මෙම සීමාවන් පනවා තිබුණි. කෙසේ වෙතත්, 2021 ජූනි මාසයේ සිට මෙම ආනයන සීමා කිරීම් සැලකිය යුතු ලෙස අඩු කරන ලද නමුත්, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ කෙටි කාලයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණයවර ලිපි හා ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබාදීමේ කොන්දේසි යටතේ, සිදු කළ තෝරාගත් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ ආනයනය කිරීම් සඳහා සියයට සියයක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවක් මහ බැංකුව විසින් පනවන ලදී. මීට අමතරව, කාබනික කෘෂිකර්මාන්තය වෙත මාරු වීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිය හා සමගාමීව 2021 වසරේ මැයි මාසයේ කාබනික නොවන පොහොර ආනයනය සීමා කරන ලදී. කෙසේ වුවද, 2021 වසරේ නොවැම්බර් මාසය වන විට මෙම ක්‍රියාමාර්ග ද ලිහිල් කරන ලදී. විදේශීය අංශය මත වූ අඛණ්ඩ පීඩනය සැලකිල්ලට ගනිමින්, රජය විසින් 2022 වසරේ මාර්තු මාසයේ දී තෝරාගත් හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන බදු වැඩි කරනු ලැබූ අතර, ආනයන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව වැනි සීමා කිහිපයක් පනවන ලදී.

වසංගතයේ බලපෑමට ලක් වූ විදේශීය අංශය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමේ අරමුණින්, 2021 වසරේ දී විදේශීය අංශයට සපයන ලද ආයතනික සහාය වැඩිදියුණු කිරීම සඳහා විවිධ පියවර ගනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලය 2018-2022 ජාතික අපනයන ක්‍රමෝපාය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරතුර, ප්‍රවර්ධන වැඩසටහන් නැවත ආරම්භ කළේය. ජාතික අපනයන ක්‍රමෝපායේ කාර්ය සැලැස්ම, වෙළඳපොළ සංවර්ධනය, නිෂ්පාදන සහ සැපයුම් දාම සංවර්ධනය සහ ධාරිතා ගොඩනැගීම යන ක්ෂේත්‍රවල අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, වෙළඳ ප්‍රදර්ශන, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වන ප්‍රවර්ධන වැඩසටහන්, සන්නාම ප්‍රවර්ධන වැඩසටහන් ආදී වූ 2020 වසර තුළ දී බොහෝවිට මංගත මාර්ග හරහා සිදු කරන ලද වැඩසටහන් සඳහා භෞතිකව සහභාගී වීම ද නැවත ආරම්භ කළේය. ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ගැටලු නිරාකරණයේ දී රාජ්‍ය සහ පෞද්ගලික අංශවල පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතා ගොඩනගමින් වාණිජ මණ්ඩල ද අපනයන ප්‍රවර්ධනය සඳහා දායක විය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ජාතික ප්‍රමිතීන් සම්පාදනය සහ යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කළ අතර, එය දේශීය නිෂ්පාදකයන්ට විදේශීය නිෂ්පාදන හා තරග වැදීමට

සහාය විය. ඒ අනුව, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල විය හැකි පරිදි ජාතික ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම උදෙසා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රකාශ කර ඇති ප්‍රමිතීන් 327 අතුරින් 128ක් 2021 වසර අවසාන වන විට සංශෝධනය කරන ලදී. අභියෝගකාරී වෙළඳපොළ වාතාවරණය මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රුපියල් බිලියන 48.7ක් වටිනා ව්‍යාපාර රක්ෂණය කිරීම් වාර්තා කරන ලද අතර, එය පසුගිය වසරට වඩා රුපියල් බිලියන 11.6කා ඉහළ යෑමකි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාවලීන් විශ්ලේෂණය කරනු ලබන සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ සපයන අනු කමිටු දහයක් යටතේ ශ්‍රී ලංකා රේගුව නවීකරණය කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, ශ්‍රී ලංකා රේගුව සහ ඒ ආශ්‍රිත කටයුතු විශ්ලේෂණයට සහ අදාළ කටයුතු වාර්තා කිරීමට 2021 පෙබරවාරි මාසයේ දී ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරන ලද අතර, රේගුවේ කාර්යයන් වැඩි දියුණු කිරීම සහ ආදායම් කාන්දු වීම වැළැක්වීම මෙහි අරමුණ වේ. ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළව ශ්‍රී ලංකා රේගුව සිය ක්‍රියාකාරකම් තවදුරටත් විධිමත් කළේය.

සමස්ත අපනයන ආදායම ඉහළ යෑම හා සමගාමීව 2021 වසරේ වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය විය. සමාලෝචනයට ලක්වන කාලය තුළ, වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රම (ජී.එස්.පී.) යටතේ වෙළඳාම් සිදු කළ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ වෙළඳාම් තුළින් වෙළඳපොළ පිවිසුම් අවස්ථා පුළුල් විය. 2020 වසරේ ජූලි මාසයේ දී පහළ මැදි ආදායම් ලබන රටක් ලෙස නැවත වර්ගීකරණය වීමත් සමඟ යුරෝපා සංගමයේ වත්මන් විශේෂ ප්‍රතිලාභයන් සහිත වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රමයේ (ජී.එස්.පී. ප්ලස්) වලංගු කාලසීමාව වන 2023 වසර ඉක්මවන තෙක් ශ්‍රී ලංකාව එහි ප්‍රතිලාභ අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් ලබා දුන් ජී.එස්.පී. යෝජනා ක්‍රමය 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වුවද, ඇමෙරිකා එක්සත් ජනපද රජයේ සාමාන්‍ය පිළිවෙත අනුව, නැවත වරක් එම පහසුකම් අතීතයට බලපාන පරිදි ප්‍රතිස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 ජනවාරි මස 01 වන දින සිට යුරෝපා සංගමයේ තීරු බදු ක්‍රමයෙන් පරිබාහිරව එක්සත් රාජධානියේ නව ගෝලීය තීරු බදු යෝජනා ක්‍රමයක් බලාත්මක වූ අතර, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ප්‍රතිලාභියෙකු ලෙස ශ්‍රී ලංකාව විසින් පෙර සේම එක්සත් රාජධානිය වෙත තීරු බදු රහිත ප්‍රවේශය තවදුරටත් අත්විඳින ලදී. කෙසේ වුවද, 2022 වසරේ සිට එක්සත් රාජධානිය නව ජී.එස්.පී. යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් එක්සත් රාජධානියේ අදාළ බලධාරීන්ට අවශ්‍ය යෙදවුම් ලබා දී ඇත. 2021 වසරේ මාර්තු මස 31 වන දිනෙන් වලංගු කාල සීමාව අවසන් වූ ජපානය විසින් ලබා දෙන ලද ජී.එස්.පී. යෝජනා ක්‍රමය 2031 වසර දක්වා නැවත වසර දහයක කාල සීමාවක් සඳහා දීර්ඝ කරන ලදී. මීට අමතරව, අපනයන සඳහා දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පැවැතිය ද, රුසියානු සමූහාණ්ඩුව, තුර්කිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්විට්සර්ලන්තය, නෝර්වේ සහ නවසීලන්තය ආදී වූ වෙනත් රටවල් ලබා දුන් ජී.එස්.පී. යෝජනා ක්‍රම මගින් ද ශ්‍රී ලංකාවට අඛණ්ඩව ප්‍රතිලාභ හිමි විය. ද්වීපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබූ අතර, 2021 වසරේ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන ඉහළ යෑමට දායක විය. ඉන්දියාව සහ පාකිස්ථානය සමඟ ඒ ඒ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන, 2021 වසරේ දී මෙම රටවල් වෙත සිදු කරන ලද සමස්ත අපනයනයෙන් සියයට 65ක් පමණ ඉහළ අගයක පැවතිණි. මේ අතර, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ ආනයන ඉන්දියාවෙන් සහ පාකිස්ථානයෙන් සිදු කළ මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 5කට (එ.ජ. ඩොලර් මිලියන 209ක්) සහ සියයට 3කට (එ.ජ. ඩොලර් මිලියන 12ක්) අඩුවෙන් වාර්තා විය. කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (චීනය, දකුණු කොරියාව සහ බංගලාදේශයට සිදු කළ අපනයන ඉහළ යෑම හේතුවෙන්) සහ ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) (මෙක්සිකෝවට කුරුඳු අපනයන ඉහළ යෑම හේතුවෙන්) යටතේ 2021 වසරේ සිදු කරන ලද අපනයන ඉහළ ගියේය. මොංගෝලියාව ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි හත්වන සාමාජිකයා ලෙස 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී එක් වූ අතර, ශ්‍රී ලංකාව ඇතුළු අනිකුත් සහභාගීත්ව රාජ්‍යයන් විසින් 2021 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මොංගෝලියාව සමඟ අන්‍යෝන්‍ය වශයෙන් තීරු බදු සහන ලැයිස්තු හුවමාරු කර ගන්නා ලදී. 2021 වසරේ දී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) යටතේ සිදු කළ අපනයන තවදුරටත් පහළ මට්ටමක පැවතුණ අතර. දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ සිදු කළ අපනයන ඉහළ ගියේය. ලෝක වෙළඳ සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වීය සම්බන්ධතා 2021

5

වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. චීනය, ජපානය, ඉන්දුනීසියාව සහ බංගලාදේශය වැනි අනාගත විභවයන් සහිත වෙළඳ හවුල්කරුවන් සමඟ සාකච්ඡා කිරීමට සහ වරණීය වෙළඳ ගිවිසුම් සඳහා එළඹීමට කටයුතු සිදු කරනු ලබන අතර, සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සමාලෝචන ක්‍රියාවලිය 2021 වසරේ අඛණ්ඩව ක්‍රියාත්මක විණි. මේ අතර, අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරීත්වය (RCEP) වැනි අනෙකුත් කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා සම්බන්ධ වීමේ හැකියාව ද ශ්‍රී ලංකාවට සොයා බැලිය හැක.

5.2.2 සේවා ගිණුම

සේවා ගිණුමේ අතිරික්තය පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ නමුත්, වසංගතයට පෙර සහ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ට පෙර පැවැති මට්ටම්වලට වඩා අඩු මට්ටමක පැවතුණි. පරිගණක සේවා ඉපැයීම්වල යහපත් වර්ධනය, සංචාරක ඉපැයීම්වල ක්‍රමානුකූල වර්ධනය සහ මුහුදු හා ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවාවල වර්ධනයන් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 0.8ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.6ක් විය.

විදේශ ගමන් සහ සංචාරක සේවා

කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ සංචාරක කර්මාන්තය 2021 වසර අග භාගයේ දී ස්ථාවර ප්‍රගතියක් අත්පත් කර ගත් අතර, අදාළ බලධාරීන් ගනු ලැබූ ඵලදායී ක්‍රියාමාර්ග සහ ශ්‍රී ලංකාව ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් ලෙස ගෝලීය ප්‍රජාව අතර ප්‍රචලිත වීම මෙයට ඉවහල් විය. 2021 ජනවාරි මාසයේ දී විදේශ සංචාරකයින් සඳහා රට නැවත විවෘත කිරීමෙන් පසුව, කලින් කලට පනවන ලද සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම් නොතකා සංචාරකයින්ගේ ස්ථාවර වැඩිවීමක් දක්නට ලැබිණි. මේ හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයට ඵලදායී බව තහවුරු වූ සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට සහ වැඩි දියුණු කිරීමට හැකි විය. වසංගතයේ තුන්වන රැල්ල හිස එසවීම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී පැනවූ තාවකාලික සීමා කිරීම්වලින් පසුව 2021 වසරේ ජූනි මාසයේ දී නැවත රට විවෘත කරන ලද අතර, පූර්ණ එන්නත්කරණයට ලක්වූ සංචාරකයින් සඳහා නිරෝධායනයෙන් තොරව රටට ඇතුළු වීම සඳහා අවස්ථාව ලබා දුනි. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස සහ සාර්ථක දේශීය එන්නත්කරණ වැඩපිළිවෙළ හා සමගාමීව, 2021 සැප්තැම්බර් මස සිට විදේශීය සංචාරකයන්ගේ පැමිණීම ක්‍රමානුකූලව ඉහළ යෑම ආරම්භ වූ අතර, 2021 දෙසැම්බර් මස 89,506ක් වූ 2021 වසර සඳහා එක් මසක් තුළ ඉහළම සංචාරක පැමිණීම වාර්තා විය. සංචාරක ක්ෂේත්‍රයේ යථා තත්ත්වයට ළඟා වීම සඳහා සහයවීමක් ලෙස සියලුම සංචාරක ව්‍යාපාර සහ සංචාරක සේවා සපයන්නන් වෙත සෞඛ්‍ය ආරක්ෂණ රෙගුලාසි නිශ්චිතව දක්වා ඇති ආචාර ධර්ම පද්ධතිය සංශෝධනය කිරීම, සහ සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම ආදී වූ ක්‍රියාමාර්ග කිහිපයක් බලධාරීන් විසින් ක්‍රියාවට නංවන ලදී. සංචාරක ක්ෂේත්‍රය 2019 වසරේ සිට මුහුණ දෙන ලද පසුබෑම යථා තත්ත්වයට පත් වන තුරු මූල්‍ය අංශය වෙත පියවීමට ඇති ණය සඳහා ලබා දුන්

5.8 සංඛ්‍යා සටහන
සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)	වාර්ෂික වෙනස්වීම (%) 2021
සංචාරක පැමිණීම් (සංඛ්‍යාව)	2,116,407	2,333,796	1,913,702	507,704	194,495	-61.7
පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන						
විනෝදාස්වාදය	1,744,149	1,979,819	1,592,212	444,328	157,766	-64.5
ව්‍යාපාර	70,683	71,255	70,068	13,946	3,956	-71.6
වෙනත්	301,575	282,722	251,422	49,430	32,773	-33.7
සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්)	23,068	25,205	19,902	4,315	2,937	-31.9
කාමර උපයෝජන අනුපාතය (%)	73.3	72.8	57.1	15.0	18.6	24.3
දළ සංචාරක ලැබීම් (රු.මිලියන)	598,143	711,961	646,362	124,189	101,903	-17.9
ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.)	282,622	305,066	337,755	244,609	523,936	114.2
මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ)	359,215	388,487	402,607	347,751	357,927	2.9
සෘජු සේවා නියුක්තිය	156,369	169,003	173,592	175,990	177,476	0.8
වක්‍ර සේවා නියුක්තිය	202,846	219,484	229,015	171,761	180,451	5.1

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 5

ශ්‍රී ලංකාව පශ්චාත් වසංගත යථා තත්ත්වයට පත්වීමේ කාල සීමාව තුළ සංචාරක කර්මාන්තයේ භූමිකාව

හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) විසින් සංචාරක කර්මාන්තය "පෞද්ගලික හෝ ව්‍යාපාරික /වෘත්තීමය අරමුණු සඳහා මිනිසුන් තම සුපුරුදු වටපිටාවෙන් පිටත රටවල් හෝ ස්ථානවලට සංක්‍රමණය වන සමාජ, සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධියක්" ලෙස නිර්වචනය කර ඇත. ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය (මින් ඉදිරියට "සංචාරක කර්මාන්තය" ලෙස හැඳින්වේ) යනු ප්‍රධාන වශයෙන්, සේවා අපනයනය කිරීමක් වේ. සංචාරක ඉපැයීම් සහ වියදම්, ගෙවුම් තුලනයෙහි භාණ්ඩ සහ සේවා ගිණුමෙහි "සේවා" යටතේ "සංචාර" ලෙස වාර්තා කරනු ලැබේ (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව කාර්ය සංග්‍රහය බීපීඑම් 6). යෙදවුම් සඳහා විදේශ විනිමය පිටතට ගලා යෑම ඉතා අවම වන නිසා සංචාරක කර්මාන්තය රටක ශුද්ධ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස පවතී. විදේශ විනිමය ඉපැයීමට අමතරව, සංචාරක කර්මාන්තය ආර්ථික වර්ධනයට, සේවා නියුක්තියට සහ කලාපීය ආදායම් විෂමතා අවම කිරීමට ද දායක වේ. ශ්‍රී ලංකාවේ පවතින සාමකාමී, සුපිරිසිදු, ආරක්ෂිත සහ විදේශිකයන්ට හිතකර පරිසරය සමඟින් රටේ උපායමාර්ගික පිහිටීම, ආකර්ෂණීය ස්වභාවික දායාදයන්, සංස්කෘතික විවිධත්වය, සහ දියුණු ඉතිහාසය මෙම කර්මාන්තයේ උන්නතිය සඳහා පදනම සපයයි. එබැවින්, විශේෂයෙන් ම, වසංගතයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ කාලපරිච්ඡේදය තුළ මෙරට විදේශීය අංශයේ අසමතුලිතතා මඟහරවා ගැනීම සඳහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනය මූලික ආර්ථික ප්‍රමුඛතාවක් වනු ඇත.

වර්තමානයේ ආර්ථිකය සඳහා සංචාරක ඉපැයීම්වල වැදගත්කම

සංචාරක කර්මාන්තය, 2014 සහ 2019 වසර අතර විදේශ විනිමය ඉපැයීම්වලින් තෙවන විශාලතම මූලාශ්‍රය වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ මුළු විදේශ විනිමය ඉපැයීම්වලින් සියයට 14කට පමණ දායක විය. විදේශ මුදල් ඉපැයීමේ විශාලතම මූලාශ්‍රය වන භාණ්ඩ අපනයන ඉපැයීම් 2010 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,626ක සිට 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,499ක් දක්වා වර්ධනය වුව ද, එවැනි අපනයන නිෂ්පාදනය කිරීම සඳහා යෙදවුම් ආනයනය කිරීමට සැලකිය යුතු ආනයන වියදමක් වැය වී ඇත. කෙසේ වෙතත්, සංචාරක කර්මාන්තය, තනි කර්මාන්තයක් වශයෙන් යෙදවුම් ආනයනය මත සාපේක්ෂව අඩු රඳා පැවතීමක් සමඟ සැලකිය යුතු විදේශ විනිමය ඉපැයීමක් උත්පාදනය කිරීමට සමත් වී ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ උච්චතම වසර වන 2018 වසරේ දී, සංචාරක ඉපැයීම්, එ.ජ. ඩොලර් මිලියන 4,381ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ඇඟලුම් අපනයන ඉපැයීම්වලින් රෙදිපිළි ආනයන වියදම් අඩු කළ විට ලැබෙන ශුද්ධ ඇඟලුම් අපනයන ඉපැයීම් (එ.ජ. ඩොලර් මිලියන 2,459ක්) සහ තේ (එ.ජ. ඩොලර් මිලියන 1,428ක්) හා රබර් නිෂ්පාදිත (එ.ජ. ඩොලර් මිලියන 875ක්) වැනි අනෙකුත් ප්‍රධාන කර්මාන්තවල අපනයන ඉපැයීම් අභිබවා ගොස් ඇත. මේ අතර, විදේශ විනිමය ඉපැයීම්වලින් දෙවන විශාලතම මූලාශ්‍රය වන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2014 වසර සහ 2019 වසර අතර එ.ජ. ඩොලර් මිලියන 7,023ක වාර්ෂික සාමාන්‍යයක් උත්පාදනය කළත්, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,491ක් දක්වා පහළ ගොස් ඇත. එබැවින්, සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපැයීමේ වැදගත් මූලාශ්‍රයක් වන අතර, විදේශීය අංශයේ පීඩනයන්ට ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සංචාරක කර්මාන්තයේ විභවතාව

ගෝලීය සංචාරක කර්මාන්තය මෑත දශක කිහිපය තුළ කාලානුරූපීව ගෝලීය මූල්‍ය අර්බුදය සහ වසංගත රෝග පැතිරීම වැනි බලපෑම් වලට ලක්වුවත්, ස්ථාවර වර්ධනයක් වාර්තා කළේය. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයට අනුව, 2019 වසර වන විට සංචාරක පැමිණීම් මිලියන 1,468ක් දක්වා ළඟා විය. ශ්‍රී ලංකාව ද සිවිල් යුද්ධය අවසන් වූ 2010 වසරේ සිට වඩා සැලකිය යුතු වැඩි වීමක් සමඟ 2018 වසර දක්වා සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2018 වසරේ දී, කීර්තිමත් සංචාරක තොරතුරු මූලාශ්‍රයක් වන "ලෝන්ලි ප්ලැනට් (Lonely Planet)" විසින් 2019 වසර සඳහා හොඳම ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව නම් කරන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ දී ගෝලීය සංචාරක පැමිණීම් වාර්තාගත ඉහළම අගයට ළඟා වුවත්, අවාසනාවන්ත ලෙස, 2019 වසරේ අප්‍රේල් මාසයේ පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් සංචාරක පැමිණීම් පසුබෑමකට ලක් විය. මෙම බලපෑම සිදු වුව ද, 2019 වසර අවසානය සහ 2020 වසර මුල් කාලපරිච්ඡේදය වන විට සංචාරක පැමිණීම් යථා තත්ත්වයට පත් විය. එනමුත්, සංචාරක පැමිණීම් සහ ඉපැයීම් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නැවත පහළ යන ලදී. මේ අතර, ඉදිරි වසරවල දී, ගෝලීය සංචාරක කර්මාන්තයේ යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2022 වසරේ ජනවාරි මාසයේ දී, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව, එහි සංචාරක විශේෂඥ මණ්ඩලය අතරින් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 63ක්ම 2024 වසර වන තෙක් තම රටවල ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 2019 වසරේ පැවති මට්ටමට යළි පත් නොවනු ඇතැයි අපේක්ෂා කළ අතර, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 79ක් ආසියා පැසිෆික් කලාපවල සංචාරක පැමිණීම් 2024 වසර වන තෙක් 2019

5

වසරේ පැවති මට්ටමට යථා තත්ත්වයට පත් නොවනු ඇති බව විශ්වාස කර ඇත. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය, ලෝක ගමනාගමන සහ සංචාරක කවුන්සිලය (WTTC) සහ වෙළඳපොළ විශ්ලේෂකයින් පෙන්වා දී ඇත්තේ වසංගතය හේතුවෙන් සංචාරක ලක්ෂණ මූලික වශයෙන් වෙනස් වී ඇති බවත්, පුද්ගල ඉතිරිකිරීම් සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් කිරීමට සූදානම් කර ඇති බව සහ සංචාරය කිරීමට දැඩි කුතුහලයකින් විශාල පිරිසක් සිටින බවයි. එබැවින්, සුදුසු උපාය මාර්ග කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නේ නම්, 2022 සහ 2023 වසරවල දී පවා සැලකිය යුතු සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සහ/හෝ සංචාරක කර්මාන්තයෙන් සැලකිය යුතු විදේශ විනිමය ඉපැයීම් උපයා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාවක් පවතී.

"නව සාමාන්‍ය" යුගයේ දී වසංගත තත්ත්වයේ සහ සංචාරක කර්මාන්තයේ ප්‍රතිචාරය

සංචාරක කර්මාන්තයට සහයෝගය දැක්වීමේ වැදගත්කම හඳුනා ගනිමින් රජය සහ මහ බැංකුව විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ණය සහන දීමනා, සහනදායී ණය යෝජනා ක්‍රම, ගාස්තු නිදහස් කිරීම්, විදුලි බිල්පත් සහන, ප්‍රදාන සහ බදු සහන පියවර වැනි සහන ක්‍රියාමාර්ග රාශියක් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සංචාරක කර්මාන්තය හරහා මෙරටට විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් තහවුරු කිරීම සඳහා මඟ පාදමින්, 2022 වසරේ ජනවාරි මස අනේවාසිකයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් පමණක් ගෙවීම් ලබා ගත යුතු බව හෝටල් සේවා සපයන්නන්හට දැනුම් දෙමින් විධාන නිකුත් කරන ලදී. දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදලින් සංචාරක කර්මාන්තය විශාල ආයෝජන කර ඇති බැවින්, ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජනවලින් තොරව විදේශ ව්‍යවහාර මුදලින් සිය ඉපැයීම් ශක්තිමත් කර ගැනීමට මෙමඟින් අවස්ථාව සැලසේ. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සමස්තයක් ලෙස සංචාරක කර්මාන්තය සැලකිය යුතු පසුබෑමකට ලක් වූ විට, නිරෝධායන මධ්‍යස්ථාන ලෙස හෝටල් කුලියට දීමෙන් ඇතැම් කුඩා පරිමාණයේ හෝටල් තම ව්‍යාපාර පවත්වාගෙන ගියහ.

ලෝක ගමනාගමන සහ සංචාරක කවුන්සිලය විසින් "නව සාමාන්‍ය" හෝ ගෝලීය සංචාරක කර්මාන්තයේ වත්මන් ප්‍රවණතාවයන්හී අනුගත විය යුතු නව ලක්ෂණ කිහිපයක් ඉස්මතු කර ඇත (සංචාරක ප්‍රවණතා 2021 සහ ඉන් ඉදිරියේ දී සංචාරක සහ සංචාරක කර්මාන්තයේ නැගී එන පාරිභෝගිකයන්ගේ ප්‍රවණතා, නොවැම්බර් 2021). උදාහරණයක් ලෙස, රටවල් විසින් පනවන ලද සීමාවන්හී හදිසි වෙනස්වීම් සහ කොවිඩ්-19 වැළඳීමේ අවදානම හේතුවෙන් සංචාරකයන් නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් කල්තියා වෙන්කරවා ගැනීමට පසුබට වෙයි. තවද, අමතර මුදලක් ගෙවීමකින් තොරව හදිසි අවලංගු කිරීම් වලට ඉඩ ප්‍රස්ථා සලසන විකල්ප සඳහා සංචාරකයන් කැමැත්තක් දක්වයි. දෙවනුව, වසංගත තත්ත්වය හේතුවෙන් දුරස්ථ ස්ථානයක සිට රාජකාරී කිරීම සාමාන්‍යකරණය වීම හේතුවෙන්, "ඩිජිටල් නොමැඩ්වරු" (තැනින් තැනට යමින් ඩිජිටල් තාක්ෂණය හරහා වැඩ කිරීම) සහ සංචාරක ස්ථානවල දිගුකල් ගත කිරීම ("staycation") වැනි සංකල්ප ජනප්‍රිය වී ඇති අතර, සංචාරකයන් දිගු කාලීන වීසා, නවාතැන් ගන්නා ස්ථානයන්හී දිගු කාලයක් රැඳී සිටින විට ලබා දෙන වට්ටම්, වේගවත් අන්තර්ජාල පහසුකම් සහ අනෙකුත් රාජකාරී කටයුතු හා සම්බන්ධ පහසුකම් අපේක්ෂා කරයි. 2021 වසර තුළ දී සංචාරකයන් රැඳී සිටීමේ කාලය සහ සංචාරයක දී සිදු කරන වියදම් ඉහළ ගොස් ඇති වග ජාත්‍යන්තර සංචාරක සංවිධාන තවදුරටත් නිරීක්ෂණය කරයි. තෙවනුව, සෞඛ්‍ය ගැටලු හේතුවෙන් වැඩිහිටි පුද්ගලයන් හෝ කුඩා දරුවන් සිටින පවුල්වලට සාපේක්ෂව තරුණ සංචාරකයන් (වයස අවුරුදු 20 සිට 40 දක්වා වන්නන්) සංචාරය කිරීම සඳහා වැඩි වශයෙන් යොමු වීමත් සමඟ සංචාරකයන්ගේ ආකෘතිය වෙනස් වී ඇත. එබැවින්, එවැනි සංචාරකයන්ගේ අවශ්‍යතා සහ මනාප සපුරාලීම සඳහා සංචාරක කර්මාන්තයට සහ සමස්තයක් වශයෙන් රටට හැකි විය යුතු වේ. මෙම වයස් කාණ්ඩය ත්‍රාසජනක ක්‍රියා සඳහා කැමැත්තක් දක්වන අතර, පුද්ගලවාදය අගය කරයි. ඔවුන් තම සංචාර සැලසුම් කිරීම සහ වෙන්කරවා ගැනීම් සඳහා ජංගම දුරකථන සහ ඩිජිටල් සේවා භාවිත කරන අතර, සමාජ මාධ්‍ය, බ්ලොග් සහ අනෙකුත් සංචාරකයන් අන්තර්ජාලයේ පළ කරන ලද සමාලෝචන මත තම තීරණ පදනම් කරගනී. සිව්වනුව, මානසික සෞඛ්‍යය සහ පුද්ගලික සුවතාවයේ අගය මෑත කාලීනව කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, සංචාරය කිරීම තුළින් මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා ඇති පාරිභෝගික උනන්දුව ද ඉහළ ගොස් ඇත. පරාර්ථකාමී කටයුතු හා සම්බන්ධ වීමට සංචාරකයන්ට අවස්ථාව හිමිවන පරාර්ථකාමී කටයුතු උදෙසා සංචාරය කිරීම ("philantourism") පිළිබඳව ද උනන්දු වන අතර, ලොව පුරා ඇති පාරිසරික මධ්‍යස්ථාන පිළිබඳව දැනුම ලබා ගත හැකි පාරිසරික සංචාරයන් ("ecotourism") සඳහා ද උනන්දුව වැඩි වී ඇත. පස්වනුව, ප්‍රධාන සංචාරක ස්ථාන සහ ග්‍රාමීය සංචාරක ස්ථාන අසළ පිහිටා ඇති එතරම් ප්‍රසිද්ධියක් නොඋසුලන ස්ථාන ගවේෂණය කරමින් ද්වීතීයික සංචාරවල ("secondary destination") යෙදීමේ ප්‍රවණතාවය ද ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය: ඉදිරි දැක්ම

සංචාරක අමාත්‍යංශය සහ එහි විෂය පථය යටතේ ඇති ආයතන පෞද්ගලික අංශය සමඟ එක්ව රට තුළ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ඉලක්කගත වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ග සහ ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද 2022-2025 සංචාරක උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්ෂේත්‍රය නංවාලීමට සහ ගැටලු

5

නිරාකරණය කිරීම සඳහා ඵලදායී මාර්ගෝපදේශ සැපයීය. සංචාරක කර්මාන්තය විසින් පුළුල් සංචාරක ප්‍රතිපත්තියක් ද කෙටුම්පත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී අවධාරණය කළ යුතු ඇතැම් අංග තිබේ.

(i). සංචාරක කර්මාන්තයේ නව අවස්ථා

පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (wellness tourism), අධ්‍යාපනය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (education tourism) සහ පරාර්ථකාමී කටයුතු හා සබැඳුණු සංචාරක කර්මාන්තය ("philantourism") වැනි සංචාරක ක්ෂේත්‍රයේ නව වපසරියන්හි සේවාවන් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත. පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය තුළ සාමකාමී සහ විවේකී නවාතැන් ස්ථාන, හුදෙකලා ස්ථාන (retreat), භාවනා, යෝග සහ ආයුර්වේද ප්‍රතිකාර වැනි කායික සහ මානසික යහපැවැත්ම වැඩි දියුණු කිරීමේ පහසුකම් ආදිය සැපයීමේ අවස්ථා පුළුල් කළ හැක. අධ්‍යාපනය හා සබැඳුණු සංචාරක කර්මාන්තය යටතේ ඉංග්‍රීසි සහ දකුණු ආසියානු සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය වැනි ක්ෂේත්‍රවල කෙටි කාලීන හෝ දිගුකාලීන වැඩසටහන් දැනට පවතින හෝ නව අධ්‍යාපන ආයතනවල ඉදිරිපත් කළ හැක. නැගෙනහිර ආසියාතිකයින් පාසල් අධ්‍යාපනයෙන් පසු විදේශයන්හි දී ඉංග්‍රීසි භාෂා වැඩසටහන් හැදෑරීම සාමාන්‍ය දෙයක් වන අතර, එවැනි වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ හැදෑරීමට අවස්ථාව සැලසිය හැක. විදේශ සිසුන් සඳහා හුවමාරු වැඩසටහන් සහ නිවෙස් තුළ ආගන්තුක වැඩසටහන් (home-stay) ද දිරිමත් කළ හැක. පරාර්ථකාමී කටයුතු හා සබැඳුණු සංචාරක කර්මාන්තය මගින් විදේශිකයන්ට රට තුළ පුණ්‍ය කටයුතු සහ කෘෂිකාර්මික කටයුතු වැනි පරාර්ථකාමී කටයුතුවල නියැලීමට අවස්ථාව ලබා දිය හැක.

(ii). ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම, සහ පරිසර දූෂණය අවම කිරීමේ වැදගත්කම

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය සහ ලෝක ගමනාගමන හා සංචාරක කවුන්සිලයේ ප්‍රකාශනවල මෙන්ම ශ්‍රී ලාංකීය හෝටල් අංශයෙන් ලැබෙන සන්නිවේදනයන්හි දක්වා ඇති පරිදි ලෝක සංචාරකයන් අතර ස්වභාවධර්මය සංරක්ෂණය කිරීම සහ පරිසර හිතකාමීත්වය පිළිබඳ උනන්දුව ඉහළ යමින් පවතී. සංචාරක නවාතැන්පොළවල් ඉදිකිරීමේ දී අන් අය සඳහා ස්වභාවධර්මය හෝ දර්ශනීය දෘෂ්ටිපථයන් (වෙරළ ආසන්නයේ ඇති හෝටල් ආදිය) විනාශ නොකිරීමටත්, වනාන්තර සහ පුද්ගල ඇසින් සැඟවී ඇති අනෙකුත් ආරක්ෂිත ස්ථාන අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීමටත් ශ්‍රී ලංකාවේ බලධාරීන්ට විශාල කාර්යභාරයක් ඇත. තවද, ආකර්ෂණීය ස්ථාන සහ නවාතැන් පොළවල් ආසන්නයේ ශබ්ද දූෂණය කළමනාකරණය කළ යුතු වේ. සංචාරක සේවා සැපයීමේ නියැලී සිටින්නන්ගේ කාර්යයන් පරිසර හිතකාමී ද යන්න අධීක්ෂණය කිරීම (උදාහරණයක් ලෙස තල්මසුන්ට බාධා කරන තල්මසුන් නැරඹීමේ චාරිකා) වැදගත් වේ. එමෙන්ම අලි ඇතුන් සහ වන සතුන්ට, විශේෂයෙන් ම දිවියන්ට, හිංසා කිරීම හේතුවෙන් ඇති වූ අහිතකර ප්‍රචාරණය අවම කිරීම සඳහා මෑතක දී සම්මත කරන ලද සත්ත්ව ආරක්ෂණ පනත භාවිතයට ගත යුතු වේ.

(iii). සංචාරකයන්ගේ ගමන් මග කෙරෙහි අවධානය යොමු කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සාමාන්‍යයෙන් වාර්ෂික පදනමක් මත රටෙන් පිටව යන අවස්ථාවේ දී සංචාරකයන් අතර සමීක්ෂණයක් සිදු කරනු ලබයි. 2018-2019 සමීක්ෂණ වාර්තාවේ සඳහන් වන පරිදි සංචාරකයන්ගෙන් සියයට 17ක් පමණක් සංචාරක පැකේජ භාවිත කළ බව අනාවරණය වූ බැවින් සංචාරකයන් බොහෝ දුරට තමන් විසින්ම සංචාර සැලසුම් කරන බව පෙනී යයි. තවද, සමීක්ෂණයට ලක් කරන ලද සංචාරකයන්ගෙන් සියයට 60ක් තම මිතුරන් සහ ඥාතීන්ගෙන් සහ සියයට 30ක් මාර්ගගත (online) මූලාශ්‍රයන්ගෙන් ගමන් තොරතුරු ලබා ගෙන ඇති අතර, මෙයින් පුද්ගල නිර්දේශ සහ මාර්ගගත ක්‍රමයන්ගේ පළ කර ඇති සමාලෝචනයන්ගේ වැදගත්කම පිළිබිඹු කරයි. මෙම සොයාගැනීම් මගින් එක් එක් සංචාරකයා තෘප්තිමත් කිරීමේ වැදගත්කම සහ ප්‍රචාරණයේ දී තනි පුද්ගලයෙකුට කළ හැකි බලපෑම පෙන්වා දෙයි. තවද, සියයට 60ක් පමණක් ඔවුන්ගේ සංචාරය විශිෂ්ට බවත්, සියයට 36ක් පමණක් තමන්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලද බැවින් සංචාරකයන්ගේ තෘප්තිය මධ්‍යස්ථ මට්ටමක වූ බව පෙනී යයි. සංචාරකයන්ට වන සුළු අපහසුතාවයකින් පවා ඔවුන්ගේ සමස්ත අත්දැකීම විනාශ වී තනි පුද්ගලයෙකු විසින් සමස්ත සංචාරක කර්මාන්තයටම බලපාන සෘණාත්මක ප්‍රචාරණයක් ඇති කළ හැක.

(iv). ඩිජිටල් තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීම

සංචාරක අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ඉහළ ඝනත්වයේ (high-density tourism) සිට සමාජීය වශයෙන් දුරස්ථභාවය සහිත (socially-distanced tourism) සංචාරක කර්මාන්තයකට පරිවර්තනය කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණ භාවිතය වැඩි දියුණු කිරීමට ඉඩකඩ පවතී. මේ සඳහා, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය, සංචාරක ජංගම යෙදුම (සංවර්ධනය කරමින් පවතී) වැනි පියවර කිහිපයක් ගෙන ඇතත්, ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම සඳහා වඩාත් බලවත් ක්‍රියාමාර්ග කඩිනමින් අවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB), "කොවිඩ්-19 සහ ආසියා සහ පැසිෆික් කලාපයේ අනාගත සංචාරක කර්මාන්තය" (2022 වසරේ මාර්තු මස) වාර්තාව

5

විසින් ද සංචාරක කර්මාන්තයේ ඩිජිටල් තාක්ෂණයේ පුළුල් වන භූමිකාව පෙන්වා දෙනු ලබයි.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, බස්නාහිර, දකුණු සහ මධ්‍යම පළාත්වල සහ සීගිරිය ආශ්‍රිත ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වී ඇත. ජාතික වනෝද්‍යානවල ගැවසෙන නරඹන්නන් අධික වීම මැතක සිට සැලකිය යුතු සෘණාත්මක ප්‍රචාරයක් ලබා ගෙන ඇත. එනමුත්, අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි ඓතිහාසික ස්ථානත් සැලකිය යුතු සංචාරකයින් පිරිසක් ආකර්ෂණය කර නොගනී (සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයේ 86 වගුව). එනමුත්, පුද්ගල සුවතාවය (wellness), ග්‍රාමීය (rural), පරාර්ථකාමී (philanthropical), ත්‍රාසජනක (adventure) සංචාරක කර්මාන්ත ඇතිකිරීමට රටේ අනෙකුත් ප්‍රදේශවල සුදුසු ස්ථාන පවතින අතර, සංචාරකයින් මෙම ප්‍රදේශවලට ආකර්ෂණය කර ගත යුතුය. මේ අතර, සංචාරකයින්ට, සංචාරක ස්ථාන සඳහා ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමේ දී එක් එක් ස්ථානවල දී මිලදී ගැනීමට සිදු වන අතර පෙරහැර සහ උත්සව (කුඩා පරිමාණ උත්සව වුවත්), පොදු ප්‍රවාහන සේවාවන්, ආරක්ෂක සේවාවන්, ආගමික ස්ථානවලට සුදුසු ඇඳුම්, ජාතික වනෝද්‍යානවලට නොගෙනා යුතු යැයි තහනම් කළ දේවල් ආදිය පිළිබඳව යාවත්කාලීන තොරතුරු මංගතව නොමැති වීම වැනි අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවෙයි. එබැවින්, එවැනි තොරතුරු මෙන්ම පුද්ගල අභිමතය පරිදි තෝරාගත් ප්‍රවේශපත්‍ර කළඹක් වශයෙන් (ticket-bundle) මිලදී ගැනීමේ පහසුකම, සංවර්ධනය කරමින් පවතින ජංගම යෙදුමට (mobile application) හෝ සංචාරකයින් සඳහා වෙන් වූ අන්තර්ජාල වෙබ් අඩවියකට ඇතුළත් කිරීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. ඩිජිටල් තාක්ෂණය, ස්පර්ශ රහිත සේවා බෙදා හැරීමේ ක්‍රම (touchless service provision), ක්ෂණික ප්‍රතිචාර (QR) කේත ආශ්‍රිත සම්බන්ධතා රහිත ගෙවීම් ක්‍රමවේද සහ සෞඛ්‍ය සහ ආරක්ෂණ තොරතුරු රැස් කිරීමට සහ බෙදා ගැනීමටද භාවිත කළ හැක.

(v). වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කර සංචාරක ව්‍යාපාරයේ විභවය ප්‍රයෝජනයට ගැනීම සඳහා තොරතුරු වැඩිදියුණු කිරීම

සුදුසු ප්‍රතිපත්ති තීරණ ගැනීම හොඳ තොරතුරු ජාලයක් මත රඳා පවතී. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා රටවල් අතර පවතින දැඩි තරඟකාරිත්වය සහ සංචාරක ලක්ෂණ නිතර විකාශනය වීම නිසා, ප්‍රතිපත්ති තීරණ සඳහා ශක්තිමත් තොරතුරු ජාලයක් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයෙහි සහාය ඇතිව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කරමින් පවතින "සංචාරක සැටලයිට් ගිණුම්කරණය" (Tourism Satellite Accounting) වැඩසටහන තුළින් ජාතික ගිණුම් සඳහා සංචාරක ව්‍යාපාරයේ ආර්ථික දායකත්වය වඩා හොඳින් තක්සේරු කිරීමට හැකි වනු ඇත. එබැවින් එය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම අවශ්‍ය වේ.

මීට අමතරව, සංචාරක වීසා යටතේ පැමිණෙන පුද්ගලයින්ගේ ලක්ෂණ, ඔවුන් කුමන ස්ථානයේ දී, කුමක් සඳහා කොපමණ මුදලක් වියදම් කරන්නේ ද යන්න, තෘප්තිමත් මට්ටම, සංචාරක ව්‍යාපාරයේ සේවා නියුක්තිය, සෘජු හා වක්‍ර සංචාරක සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව හා වර්ග සහ භූගෝලීය ප්‍රදේශ පිළිබඳ විවිධ තොරතුරු වැනි අනෙකුත් සාධක සමූහයක් පිළිබඳව නිතර වැඩි වාර ගණනකින් ප්‍රකාශයට පත් කෙරෙන දත්ත අවශ්‍ය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) මගින් පවා වසංගත කාලපරිච්ඡේදය තුළ රටවල් කිහිපයක පවත්වන ලද අධ්‍යයනයන් තුළින්, ජාතික සංචාරක ආයතනයන්ට, සංචාර වැඩිදියුණු කිරීම, නවෝත්පාදන ඇතිකිරීම සහ පෞද්ගලික අංශයට පෙර දැක්මක් ලබා ගැනීම සඳහා තම වෙළඳපොළ පර්යේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත (පශ්චාත් වසංගත ලෝකයේ සංචාරක ව්‍යාපාරය: ආසියා පැසිෆික් කලාපයේ සහ බටහිර අර්ධගෝලය සඳහා ආර්ථික අභියෝග සහ අවස්ථා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2021).

(vi). සංචාරක අංශයේ අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම

සංචාරක කර්මාන්තය ස්වභාවිකවම භූ දේශපාලනික සිදුවීම්වලට බෙහෙවින් ගොදුරු විය හැකි, සෘතුමය බලපෑමට ලක්වන කර්මාන්තයක් වන බැවින්, මෙම කර්මාන්තය ණය සහන සහ රාජ්‍ය මූල්‍ය දීමනා වැනි සහන මත පමණක් රඳා නොසිට සිය අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කළ යුතුය. ණය සහන බැංකුවල ආදායම් අඩු කරන අතර, බැංකුවල ද්‍රවශීලතාවයටද බලපෑම් කර අවදානම් වැඩි කරයි. බැංකු අංශයට ඇතිවන අයහපත් බලපෑම් මුළු ආර්ථිකයටම පැතිරිය හැකිය.

(vii). සංචාරක අංශය තුළ අවිධිමත් උප අංශය අඩු කිරීම

ශ්‍රී ලංකාවේ සංචාරක අංශය, සිය ව්‍යාපාර අවිධිමත් ලෙස කරගෙන යන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විශාල සංඛ්‍යාවකින් සමන්විත වේ. කෙසේ වෙතත්, එවැනි ව්‍යවසායන් සංචාරක ආයතන සමඟ ලියාපදිංචි වීමට දිරිමත් කිරීම තුළින් රජය ක්‍රියාත්මක කරන උපාය මාර්ගවල විධිමත් බව සහතික කිරීමට සහ සහනදායී ක්‍රියාමාර්ග අවශ්‍ය වූ විට සෑම සහභාගිවන්නෙකුටම සාධාරණ ලෙස ලබා දීමට උපකාරී වේ. එසේම, කර්මාන්තයක ඉහළ අවිධිමත්භාවය, ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම, රාජ්‍ය සේවා සැපයීම සහ තත්ත්ව ප්‍රමිතීන් සඳහා නියාමනය කිරීම සීමා කරයි. තවද, ව්‍යාපාර ලියාපදිංචි කිරීම තුළින් ණය ලබා ගැනීම ඇතුළු මූල්‍ය පිවිසුම් අවස්ථා වැඩිදියුණු කිරීම මෙන්ම බදු එකතු කිරීම ද ඉහළ නංවනු ඇත.

(viii). සංචාරකයින් අතර විවිධත්වය දිරිමත් කිරීම

ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පුද්ගලයින් (high net worth individuals) පමණක් ඉලක්ක නොකර, පුද්ගල අභිරුචිය, රට, සහ වියදම් කිරීමේ හැකියාව අනුව විවිධ වර්ගයේ සංචාරකයින් තෘප්තිමත් කිරීමට පහසුකම් සැලසිය යුතුය. මෙය විශේෂිත ලක්ෂණ සහිත හෝ තනි රටක/කලාපයක සංචාරකයින් මත මුළු කර්මාන්තයම රඳා පැවතීම අඩු කිරීමට උපකාරී වනු ඇත. ඇත්ත වශයෙන්ම, සියලුම වර්ගයේ සංචාරකයින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා දායක වේ. විවිධ වියදම් හැකියාවකින් යුත් සංචාරකයින් රටට ආකර්ෂණය කර ගැනීම තුළින් විවිධ ආයෝජන හැකියාවන් ඇති දේශීය ආයතනවලට සංචාරක කර්මාන්තය තුළ ක්‍රියාත්මක වීමට අවස්ථාව සලසා දෙනු ඇත.

(ix). සංචාරක ව්‍යාපාරය මත දැඩි ලෙස රඳා පැවතීම අඩු කිරීම

සංචාරක කර්මාන්තය මත යැපෙන රටවල් ප්‍රායෝගික ප්‍රමාණයෙන් කුඩා රටවල් වන අතර, එම රටවල විදේශ විනිමය ආදායම හා ස්වාරක්ෂකයන් ප්‍රමාණවත් නොවන බවත්, එම රටවල රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වන අතරම, අනෙකුත් සාර්ව ආර්ථික අභියෝගවලටද මුහුණ දෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2021 වසරේ නිකුත් කර ඇති "පශ්චාත් වසංගත ලෝකයේ සංචාරක ව්‍යාපාරයː ආසියා පැසිෆික් කලාපයේ සහ බටහිර අර්ධගෝලයේ ආර්ථික අභියෝග සහ අවස්ථා" යන පර්යේෂණ වාර්තාව මගින් පෙන්වා දී ඇත. ඒ තුළින් සංචාරක ව්‍යාපාරය මත අධික ලෙස රඳා පැවතීම වෙනත් අපනයනවලින් අඩු සාර්ථකත්වයක් අත්කරගත් ඉහත කී ලක්ෂණවලින් පීඩා විඳින රටවල ලක්ෂණයක් බව පෙනී යයි. සංචාරක කර්මාන්තය මත යැපෙන එවැනි රටවල අපනයන සංකීර්ණතාවය අවම වන අතර, එය ඔවුන්ගේ නව නිෂ්පාදන කිරීමේ හැකියාවට බලපායි. නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා නිෂ්පාදන දැනුම හා හැකියාවන් පුළුල් කිරීම අවශ්‍ය වේ. සංචාරක කර්මාන්තය යනු රටක තාක්ෂණික ධාරිතාව වැඩි කරන කර්මාන්තයක් නොවන අතර, බාහිර කම්පනවලට බෙහෙවින් ගොදුරු වන කර්මාන්තයකි. ඉහත සඳහන් කළ පර්යේෂණ වාර්තාව මගින්, නව ඩිජිටල් ආර්ථික මෙවලම් භාවිතයෙන් හෝ සමස්ත අපනයන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් අනෙකුත් භාණ්ඩ හා සේවා අපනයන අංශ දියුණු කිරීමට සංචාරක කර්මාන්තය මත යැපෙන රටවල් (ශ්‍රී ලංකාව ඇතුළුව) විචක්ෂණශීලී විය යුතු බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වා දී ඇත. මෙම වාර්තාව මගින් යෝජනා කර ඇති පරිදි ශ්‍රී ලංකාව මැදිකාලයේ දී, සිය සංචාරක ආකෘතිය ගැන නැවත සලකා බලා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය.

නිගමනය

භූ දේශපාලනික අර්බුදයන්ගේ සහ අභියෝගාත්මක දේශීය සමාජ දේශපාලනික පරිසරයේ බලපෑම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකයේ පශ්චාත් වසංගතයෙන් පසු යථා තත්ත්වයට පත් වීම සඳහා සංචාරක අංශය උත්තේජනයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයේ නව සාමාන්‍යයකට (new-normal) අනුවර්තනය වීමට පමණක් නොව, නව සාමාන්‍යයක් නිර්මාණය කිරීමට රජය සහ පෞද්ගලික අංශයේ සාමූහික ප්‍රයත්නයන් අවශ්‍ය වේ. මෙම ප්‍රයත්නයේ දී, ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් මෙරට මෑත කාලීන ආර්ථික තත්ත්වය මත පදනම්ව ඇතැම් විදේශ රජයන් විසින් නිකුත් කළ අනතුරු හැඟවීම් යහපත් සහසම්බන්ධතාවයක් තුළින් ඉවත්කළ යුතුය. සංචාරක කර්මාන්තයේ යථා තත්ත්වයට පත් වීම රඳා පවතින්නේ, නූතන සංචාරකයාගේ අවශ්‍යතා සපුරාලිය හැකි වීම, විය හැකි සැපයුම් සහ බලශක්ති හිඟයන් සඳහා පෙර සූදානම් වීම සහ ණය හා පොලී ගෙවීම් සඳහා දී ඇති සහන කාලයට පසු මනා මූල්‍ය කළමනාකරණයකින් යුතුව කටයුතු කිරීම යනාදිය මතය. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ විභවතාවයක්, භාවනා සහ වෛද්‍ය හා ඓතිහාසික පර්යේෂණ සඳහා තරුණ කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීම වැනි විවිධාංගීකරණය වූ සංචාරක උවමනා සඳහා පවතින බව වාණිජමය දෘෂ්ටිකෝණයකින් පෙනී යයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ පෞද්ගලික සංචාර සංවිධානය කරන්නන් විසින් කලාපයේ අනෙකුත් රටවල්වලට සාපේක්ෂව ආකර්ෂණීය පැකේජ ලබා දෙමින් මෙම විශේෂිත සංචාරක කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණීමට දිරිමත් කළ යුතුය. වසංගතය අඩුවීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයේ පුනර්ජීවනය පිණිස සංචාරක අංශයට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි බව අපේක්ෂිතය.

මූලාශ්‍ර

1. Asian Development Bank and United Nations World Tourism Organisation. (2022). COVID-19 and the future of tourism in the Asia and Pacific. Manila, Philippines and Madrid, Spain: Author.
2. Goretti, M. M., Leigh, M. L. Y., Babii, A., Cevik, M. S., Kaendera, S., Muir, M. D. V., ... & Salinas, M. G. (2021). Tourism in the post-pandemic world: economic challenges and opportunities for Asia-pacific and the western hemisphere. International Monetary Fund.
3. International Monetary Fund. (2009). Balance of Payments and International Investment Position Manual - BPM 6 (6th Edition). Washington D. C., USA: International Monetary Fund.
4. Sri Lanka Tourism Development Authority. (…..). Survey of Departing Tourists from Sri Lanka 2018-2019. Colombo, Sri Lanka: Sri Lanka Tourism Development Authority.
5. United Nations World Tourism Organisation. (2022). World Tourism Barometer January 2022. Madrid, Spain: United Nations World Tourism Organisation.
6. World Travel and Tourism Organisation. (2021). Trending in Travel – Emerging Consumer Trends in Travel & Tourism in 2021 and Beyond. London, United Kingdom: World Travel and Tourism Organisation.

5.10 රූප සටහන
සංචාරක පැමිණීම් සහ ඉපැයීම්



මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සහන ද දීර්ඝ කරන ලදී. සංචාරකයන්ගේ පැමිණීම්, 2020 වසරේ පළමු මාස තුන තුළ වාර්තා වූ පැමිණීම් 507,311ත් ඇතුළුව 2020 වසරේ වාර්තා වූ මුළු සංචාරක පැමිණීම් 507,704ට සාපේක්ෂව, 2021 වසරේ දී 194,495ක් දක්වා සියයට 61.7කින් පහළ ගියේය. 2022 වසරේ මුල් භාගයේ දී සිදු වූ සංචාරකයන්ගේ පැමිණීමේ ක්‍රමානුකූල වැඩි වීම හූ දේශපාලනික පීඩන හේතුවෙන් ගෝලීය සංචාරක කර්මාන්තයට වූ බාධක නොතකා අඛණ්ඩව සිදු විය.

යුරෝපය සංචාරක පැමිණීම් සඳහා ප්‍රමුඛ කලාපය වූ අතර, ඉන්දියාව තවදුරටත් සංචාරක පැමිණීම් සඳහා තනි රටක් ලෙස මුල් තැන ගන්නා ලදී. යුරෝපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 48කට දායක වෙමින් සංචාරක පැමිණීම් 93,496ක් වාර්තා කළේය. චීනයෙන් වූ සංචාරක පැමිණීම් ඉතා අඩු වුවද, ආසියා පැසිපික් කලාපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 43.2 කට දායක වෙමින් සංචාරක පැමිණීම් 83,926ක් වාර්තා කළ අතර, එය දෙවන විශාලතම සංචාරක පැමිණීම වේ. රටවල් අනුව සංචාරක පැමිණීම ගත් කළ, 2021 වසරේ දී ඉන්දියාව සංචාරක පැමිණීම් 56,268ක් සමඟින් පෙරමුණ ගත් අතර, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සහ පාකිස්ථානය ඉන් පසුව ඉහළම සංචාරකයන් සංඛ්‍යාවක් වාර්තා කළේය. 2021 අගෝස්තු මස අවසානයේ දී, ශ්‍රී ලංකාව ඉන්දියාවේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන නැවත ආරම්භ කරනු ලැබුවේ පූර්ණ එන්නත්කරණයට ලක්වූ සංචාරකයන් සඳහා සිය දේශ සීමා විවෘත කරමිනි. රුසියාව 2021 වසරේ දී දෙවන විශාලතම සංචාරක ප්‍රභවය ලෙස එක්සත් රාජධානිය පසු කළ අතර, ඒ සඳහා රුසියාවෙන් කුලී පදනම මත ලබාගත් ගුවන් යානා ගමන්වාර ඉලක්ක කර ගනිමින් සිදු කළ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් හේතු විය. සම්ප්‍රදායික සහ සම්ප්‍රදායික නොවන වෙළඳපොළ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මාධ්‍යයක් ලෙස නිත්‍ය ගමන් මාර්ග සහ කලින් කලට කුලී පදනම මත ලබාගත් ගුවන් ගමන් මෙහෙයුම් හරහා වැඩි දියුණු කරන ලද සම්බන්ධතා ප්‍රවර්ධනය කළ හැකි බව එමගින් පැහැදිලි වේ. 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ඉහළම සංචාරක ප්‍රභව පහ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 56.4ක් සඳහා දායක වී ඇත.

සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ රැඳී සිටින කාලය යන ද්විත්වයෙහි ම ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, සංචාරකයන් පැමිණීම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී සංචාරක ඉපැයීම් සුළු වශයෙන් පහළ ගියේය. සංචාරකයින්ගේ වියදම් සහ මෙරට ගත කරන කාලය පිළිබඳ 2021 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත තක්සේරුව අනුව, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 158.1 සිට 2021 වසරේ දී එ.ජ. ඩොලර් 172.6ක් දක්වා ඉහළ ගියේය. තවද, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය 2020 වසර සඳහා ඇස්තමේන්තු කළ දින 8.5 සමඟ සැසඳීමේ දී කොවිඩ්-19 හේතුවෙන් වන නිරෝධායනයේ බලපෑම නිරූපණය කරමින් 2021 වසරේ දී දින 15.1ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සංචාරක ඉපැයීම් 2020 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 682ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 507ක් දක්වා සියයට 25.7කින් පහළ ගියේය. මේ අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී විදේශ ගමන් සම්බන්ධයෙන් රටින් පිටවීම්වල ද පහළ යෑමක් වාර්තා විණි.

2021 වසරේ දී සංචාරක අංශය සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් වූ අතර, ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ විභවය පිළිබඳ ආයෝජකයන් සතු අඛණ්ඩ විශ්වාසය මෙයින් නිරූපණය වේ. 2021 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ආයෝජන සබඳතා ඒකකය වෙත එ.ජ. ඩොලර් මිලියන 134ක වටිනාකමකින් සහ කාමර 1,328ක සමස්ත ධාරිතාවයකින් යුතු යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ නව ආයෝජන ව්‍යාපෘති 45ක් ලැබී තිබුණි. මේ අතර, එ.ජ.ඩොලර් මිලියන 104ක වටිනාකමකින් සහ කාමර 922ක සමස්ත ධාරිතාවයකින් යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ නව ආයෝජන ව්‍යාපෘති 30ක් සඳහා ආයෝජන සබඳතා ඒකකය 2021 වසරේ දී අවසර ලබා දුන්නේය. තවද, කාමර 6,265ක් සහිත හෝටල් ව්‍යාපෘති 87ක් මේ වන විට විවිධ අදියරයන්හී ඉදිකරමින් පවතී. ඒ අනුව, කාමර 25,958ක සමස්ත

ධාරිතාවයකින් යුතු ශ්‍රේණිගත ආයතන 480ක් සහ අති සුඛෝපභෝගී කුඩා හෝටල්, බංගලා, නිවාඩු නිකේතන, පෞරාණික බංගලා, පෞරාණික නිවාස, සංචාරක සත්කාර නිවාස ඒකක, කුලියට ගත් තට්ටු නිවාස සහ කුලියට ගත් නිවාස ඇතුළුව, කාමර 21,379ක සමස්ත ධාරිතාවයකින් යුතු අතිරේක ආයතන 3,177 ක් 2021 වසරේ දී ක්‍රියාත්මක වුණි.

සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව 2021 වසරේ ප්‍රතිපත්තිමය මුලපිරීම් කිහිපයක් සහ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය. කොවිඩ්-19 වසංගතයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් සංචාරක ක්ෂේත්‍රයට අදාළව 2021 මාර්තු මස 31 වන දින දක්වා ලබා දී තිබූ ණය සහන කාලය 2021 ඔක්තෝම්බර් මස 01 වන දින දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, මෙම කර්මාන්තය මත වසංගතය හේතුවෙන් ඇති වූ දිගු කාලීන අහිතකර බලපෑම් සලකා බැලීමෙන් පසු, 2022 ජූලි මාසයෙන් අවසන් වන අයුරින් සහන කාලය තවත් මාස නවයකින් නැවත වරක් දීර්ඝ කිරීමට මහ බැංකුව විසින් කටයුතු කරන ලදී. මෙම දීර්ඝ කිරීම හා සමගාමීව, සංචාරක අංශය සඳහා මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාරික සහ පෞද්ගලික අංශයේ වාහන සඳහා කල්බදු වාරික ගෙවීමට ලබා දුන් සහන කාලය ද දීර්ඝ කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංචාරක අංශයේ නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම සඳහා ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය පහසුකම, එක් එක් ණය සඳහා වෙන් වෙන් ව සලකා බලන පදනමෙන්, කිහිප වතාවක් 2022 ජූනි මස 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සියලුම සංචාරක ආයතනයන්හී බලපත්‍ර වලංගු කාලය සහ සංචාරක මගපෙන්වන්නන්ගේ බලපත්‍ර වලංගු කාලය 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා දීර්ඝ කිරීම ආදී වූ සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් මුහුණ දෙන ගැටලු අඩු කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ බලධාරීන් විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සහාය ඇතිව ලියාපදිංචි සියලු සංචාරක මගපෙන්වන්නන් සඳහා ඔවුන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අඛණ්ඩ වෘත්තිමය සංවර්ධනය සඳහා මාර්ගගත ඉගෙනුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තවද, අවිධිමත් අංශයේ සංචාරක ක්‍රියාකරුවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වීම දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. සංචාරක හෝටල්, නිවාඩු නිකේතන, සංචාරක සත්කාර නිවාස, බංගලා, සංචාරක නියෝජිතායතන, සංචාරක හිතකාමී භෝජනාගාර, ආපනශාලා සහ ස්පා සහ සුවතා මධ්‍යස්ථාන ඇතුළු සියලුම අවිධිමත් සංචාරක ව්‍යාපාර සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් හරහා ලියාපදිංචි කිරීමට අවසර ලබා දී ඇත. මේ අතර, නව ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් පුළුල් ගෝලීය ප්‍රේක්ෂක ආකර්ෂණයක් ඇති කර ගැනීම සඳහා මෙරට ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් උපායමාර්ගික ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2021 වසරේ මාර්තු මාසයේ දී පස් අවුරුදු ගෝලීය සන්නිවේදන වැඩසටහනක් දියත් කරන ලද අතර, 2021 ඔක්තෝබර් මස ඉන්දියානු සිනමාව ඉලක්ක කර ගනිමින් චිත්‍රපට ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය ආරම්භ කළේය. තවද, 2021 ඔක්තෝබර් මස 1 වන දින සිට 2022 මාර්තු මස 31 දක්වා ඩුබායි හී පැවති වර්ල්ඩ් එක්ස්පෝ 2020 (World Expo 2020) ප්‍රදර්ශනය, වෙළඳාම, ආයෝජන සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට අවස්ථාවක් සලසා දෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයට නව තේමා කිහිපයක් 2021 වසරේ දී ප්‍රථම වරට හඳුන්වා දුන් අතර, ඩිජිටල් නොමැඩ්වරුන් (දුර ස්ථානවල සිට තාක්ෂණය හරහා වැඩ කරන පිරිස්) සඳහා මුලපිරීමක් සහ මංගත ක්‍රම හරහා සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත සජීවීව විකාශනය කරවු ලබන 'go on a couch safari' ඩිජිටල් වැඩසටහන මේ අතර වේ. ක්‍රියාකාරී ලෙස සංචාරක ප්‍රවර්ධනය කිරීම හේතුවෙන් 2021 වසරේ සංචාරය කිරීමට වඩාත් යෝග්‍ය ගමනාන්තයන් අතුරින් එකක් ලෙස කොන්ඩේ නාස්ට් (Condé Nast), ට්‍රැවල් ඇන්ඩ් ලෙෂර් සඟරාව (Travel and Leisure magazine), සීඑන්එන් ට්‍රැවල් (CNN travel) ආදී වූ ලෝක ප්‍රචලිත සංචාරක සංවිධානයන්ගෙන් ඇගයීම් කිහිපයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, ශාරීරික සුවතා සම්බන්ධ සංචාරක ව්‍යාපාරයේ ගමනාන්ත අතුරින් ඉහළම ස්ථානයක ශ්‍රේණිගත කිරීම සහ කාන්තා ඒකළ සංචාරක දර්ශකයේ දෙවන ස්ථානයට පත් වීමට හැකිවිය.

ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා සහ අනෙකුත් සේවා

තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ අංශයෙහි ක්‍රියාකාරිත්වය 2021 වසර තුළ දී යහපත් මට්ටමක පැවතුණු අතර, එය එ.ජ. ඩොලර් බිලියන 1ක සීමාව ඉක්ම විය. වසංගතය හේතුවෙන් 2020 වසරේ දී මුහුදු ප්‍රවාහන සේවා වෙත ඇති වූ සැලකිය යුතු බාධාවලින් පසුව 2021 වසරේ දී භාණ්ඩ ප්‍රවාහන සේවාවල ධනාත්මක වර්ධනයක් වාර්තා විය. 2021 වසරේ දී මෙරට වරායන් වෙත නැව් ගමනාගමනය සුළු වශයෙන් අඩු වුව ද, දේශීය බහාලුම් හැසිරවීම, ප්‍රතිනැව්ගත කිරීම් සහ තැන්මාරු මෙහෙයුම් ඇතුළුව සමස්ත බහාලුම් හැසිරවීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. පටවන ලද සහ මුදා හරින ලද භාණ්ඩ අනුව හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය ද වර්ෂය තුළ වැඩි විය. මෙය සහ ගෝලීය වශයෙන් භාණ්ඩ හැසිරවීටම් ගාස්තු ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස රටේ ආනයන සහ අපනයන යන දෙඅංශයේම භාණ්ඩ ප්‍රවාහනය හා සම්බන්ධ ගාස්තු වැඩි වීමට හේතු විය. මේ අතර, වසංගතය සමඟ සංචාරක පැමිණීම් අඩුවීම හේතුවෙන් ගුවන් මගී සේවාවන්හි ඉපැයීම්වල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. වසංගතය හේතුවෙන් ශ්‍රී ලාංකිකයින්ට අනේවාසික ගුවන් සමාගම්වල ගමන් කිරීමට ඇති අවස්ථා සීමා වීමේ ප්‍රතිඵලයක් ලෙස, මගී ප්‍රවාහන සේවා ගෙවීම් ද අඩු විය. මූල්‍ය සේවා, ඉදිකිරීම් සේවා, රාජ්‍ය සේවා සහ අනෙකුත් ව්‍යාපාරික සේවා ඇතුළු අනෙකුත් සේවා උප අංශ වෙතින් 2021 වසරේ දී සුළු ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා විය. ඒ අනුව, සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 0.8ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.6ක් දක්වා වැඩි විය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන් ම සංචාරක කර්මාන්තයේ ඉපැයීම් අඩු වීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය පාස්කු ඉරුදින ප්‍රහාරයන්ට පෙර පැවති මට්ටමට සාපේක්ෂව 2020 සහ 2021 වසරවල සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතුණි.

5.2.3 ප්‍රාථමික ආදායම

සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ප්‍රතිආයෝජිත ඉපැයීම්වල ඉහළ යෑමක් හමුවේ වුව ද, විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම්, රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජන සඳහා වන කූපන ගෙවීම් සහ සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් අඩු වීම හේතුවෙන්, 2021 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයෙහි අඩු වීමක් වාර්තා විය. වසර තුළ දී, රජයේ, පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් අඩු වූ අතර, තැන්පතු භාර ගන්නා ආයතන විසින් වසර තුළ දී, අනේවාසිකයන් වෙත සිදුකළ පොලී ගෙවීම් සුළු වර්ධනයක් වාර්තා කළේය. ඇතැම් කෙටි කාලීන වාණිජ ණය ක්‍රමානුකූලව ගෙවන අතරම, රජය ක්‍රමයෙන් අඩු පිරිවැය සහිත සහනදායී අරමුදල් වෙත යොමු වීමත් සමඟ රජයේ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්වල අඩුවීමක් නිරීක්ෂණය විය. තවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල කොටසක හිමිකාරීත්වය අනේවාසිකයන් සිට නේවාසිකයන් වෙත වෙනස් වීම මෙන්ම, 2020 සහ 2021 වසරවල දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරීම සහ නව නිකුතූන් නොමැති වීම හේතුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල අනේවාසිකයන් වෙත සිදු කළ කූපන ගෙවීම්හි සැලකිය යුතු අඩු වීමක් වාර්තා විය. කෙසේ වුවත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ප්‍රතිආයෝජිත ඉපැයීම්වල වැඩි වීමක් දක්නට ලැබුණි. මේ අතර, 2021 වසරේ දී ජාත්‍යන්තර සංචිත මත වන ආයෝජන ආදායම් අඩු වීම මූලිකවම හේතු කොට ගෙන ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් පහත වැටුණි. මෙම ප්‍රවණතා හමුවේ, 2021 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.2ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් බිලියන 2.0ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

5.2.4 ද්විතීයික ආදායම

2021 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ද්විතීයික ආදායම් ගිණුම දුර්වල විය. 2021 වසරේ පළමු මාස පහ තුළ හිතකර වර්ධනයක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2021 වසරේ ජූනි මාසයේ සිට ක්‍රමානුකූල අඩුවීමක් වාර්තා කළේය. මෙය 2021 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2020 වසරේ දී වාර්තා වූ සියයට 5.8ක වර්ධනයට සාපේක්ෂව සියයට 22.7කින් අඩු වීම සඳහා හේතු විය. මෙම පහත වැටීම සඳහා, නිල විනිමය අනුපාතිකයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපොළේ විනිමය අනුපාතිකයෙහි කැපී පෙනෙන වෙනසක් පැවතීම හේතුවෙන් විධිමත් මාර්ග හරහා ලැබෙන ප්‍රේෂණ අඩු වීම මූලික වශයෙන් හේතු විය. මෙම ප්‍රවණතා සමඟ, 2021 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම්, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 6.2ට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 5.2ක් දක්වා අඩු විය. 2022 වසරේ මාර්තු මස සිට විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ විදේශ රැකියා සඳහා

විශේෂ සටහන 6

අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම මගින් රටක මූල්‍ය වෙළඳපොලට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම

හැඳින්වීම

යම් රටක් තුළ මෙන්ම එම රටින් පිටත දේශසීමා අතර සිදුකෙරෙන ගනුදෙනු වලදී එම ගනුදෙනු වලට අදාළ මුදල් කාර්යක්ෂමව සහ ආරක්ෂාකාරී අයුරින් සංචලනය කළ හැකි ක්‍රමවේදයක් පැවතීම රටක මූල්‍ය පද්ධතියෙහි දැකිය හැකි වැදගත් ලක්ෂණයකි. විශේෂයෙන්ම, විදේශ විනිමය යොදා ගනිමින් දේශසීමා අතර සිදුවන මුදල් මාරු කිරීම් වලදී මෙම කරුණ වඩාත් වැදගත් වේ. සාමාන්‍යයෙන්, රටක මෙලෙස දේශ සිමා අතර සිදුවන මුදල් ගනුදෙනුවලින් බහුතරයක් විධිමත් මුදල් හුවමාරු ක්‍රම හරහා සිදු වේ. ඒ කෙසේ වුවත්, ඕනෑම රටක, විශේෂයෙන්ම, දේශසීමා අතර සිදුකෙරෙන ගනුදෙනු සඳහා විවිධාකාරයේ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කරනු ලබයි. රටක පුරවැසියන් ගනුදෙනු සඳහා විධිමත් මුදල් හුවමාරු ක්‍රම තොරාගන්නවාද නැතහොත් අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම තෝරාගන්නවාද යන්න එම රටෙහි ආර්ථිකයෙහි සහ මූල්‍ය වෙළඳපොලේ පවතින විවිධ ලක්ෂණ සහ එවැනි ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය මත රඳා පවතී. බලපත්‍රලාභී සහ නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් ජනතාවට සපයනු ලබන මුදල් හුවමාරුකිරීමේ සේවාවන් විධිමත් මුදල් හුවමාරු මාධ්‍යන් ලෙස හඳුනා ගැනේ. එලෙස මුදල් හුවමාරු කිරීමේ සේවාවන් සැපයීම සඳහා නියාමනයකට ලක්නොකෙරෙන හවාලා, හුන්ඩි හෝ උන්ඩියල් (දකුණු ආසියාවේ), ෆෙයි කියන් හෝ චිට් (අග්නිදිග ආසියාවේ) සහ බ්ලැක් මාර්කට් පෙසෝ (යුරෝපීය රටවල) වැනි මුදල් හුවමාරු සේවා සපයන්නන්ගේ ජාල අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම ලෙස හඳුනා ගැනේ. කෙසේ වෙතත්, වර්තමානයේ, ජර්මනිය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි ඇතැම් රටවල් එකී රටවල ක්‍රියාත්මක වන මුදල් විශුද්ධිකරණයට එරෙහි නීතිමය අවශ්‍යතා මත පදනම්ව එම රටවල අවිධිමත් මුදල් හුවමාරු සේවා සපයන්නන් සඳහාද ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම වැනි නියාමන ප්‍රවේශයන් අනුගමනය කරයි. විධිමත් බැංකු ක්‍රමයන් භාවිතා නොවූ අතීතයේ සිටම මුදල් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට භෞතික සංචලනයකින් තොරව එම මුදල් වල වටිනාකම පමණක් හුවමාරු කර යැවීම සඳහා හවාලා ක්‍රමය අඛණ්ඩව භාවිතා කර ඇත. කෙසේ වෙතත්, ජංගම දුරකතනයක යෙදුමක් භාවිතා කිරීමෙන් පවා බැංකු ගනුදෙනු ඉතා පහසුවෙන් ඉටුකර ගැනීමේ හැකියාවක් පවතින නූතනයේදීත් එවැනි අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතයේ පවතී. විවිධ පුද්ගලයන්, කණ්ඩායම් මෙන්ම ආයතන විසින් නීත්‍යානුකූල මෙන්ම නීත්‍යානුකූල නොවන ගනුදෙනු සඳහා ද ගෙවීම් මාධ්‍යක් ලෙස මෙම අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කරනු ලැබේ. විශේෂයෙන් එවැනි සේවාවන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු සාපරාධී ක්‍රියාකාරකම් සඳහා දැඩි ලෙස උපයෝගී කර ගනී. නිදසුනක් වශයෙන්, 2001 වසරේදී එක්සත් ජනපද ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ මාරාන්තික ත්‍රස්තවාදී ප්‍රහාරයට තුඩු දුන් ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයීමේදී හවාලා මුදල් හුවමාරු ක්‍රමය භාවිතා කර ඇති බව තහවුරු වී ඇත. මෙම ක්‍රම වල ඇති ඇතැම් වාසිදායක ලක්ෂණයන් වන අඩු ගනුදෙනු පිරිවැය, පහසු ප්‍රවේශය, අවම ලේඛන කටයුතු සහ ඉක්මනින් මුදල් මාරු කර ගැනීමේ හැකියාව යනාදිය මෙම අවිධිමත් ප්‍රේෂණ මාධ්‍යන් සමාජය තුළ ජනප්‍රිය වීමට හේතු සාධක වී ඇත. කෙසේ වෙතත්, සාපරාධී ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවිධිමත් මාධ්‍යක් වීම හේතුකොටගෙන ගණුදෙනු කරනු ලබන මුදල් අහිමි වීමේ හැකියාවක් පවතින බැවින් මේවා වඩාත් අවදානම් සහගත මුදල් හුවමාරු ක්‍රම ලෙසට හඳුනා ගැනේ. විශේෂයෙන්ම, මෙම ක්‍රම මුදල් විශුද්ධිකරණහි නියැළෙන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් විසින් අනිසි ලෙස භාවිතා කිරීමට බෙහෙවින් ඉඩකඩ පවතී. මෙවන් අවිධිමත් සහ නීත්‍යානුකූල නොවන ගෙවීම් ක්‍රම මගින් ආර්ථිකයක විධිමත් අංශයේ සිට අවිධිමත් අංශය කරා ආර්ථික සම්පත් ගලා යාමට සලස්වන බැවින්, රටක මූල්‍ය පද්ධතියෙහි සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වයට ද මෙම ක්‍රම අහිතකර ලෙස බලපෑ හැකිය. එබැවින් අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම රටක මූල්‍ය පද්ධතිය සහ ආර්ථිකය කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් පිළිබඳව මෙම සටහන මගින් අවධාරණය කෙරේ. තවද, මෙම අවිධිමත් ප්‍රේෂණ ක්‍රම සියල්ලටම අඩු වැඩි වශයෙන් එකම ලක්ෂණ පවතින බැවින්, මේ සටහන මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් භාවිතා වන හවාලා මුදල් ප්‍රේෂණ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර, එය හවාලා මුදල් හුවමාරු/ප්‍රේෂණ ක්‍රමය හෝ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම ලෙස මෙම සටහන තුල විටින් විට භාවිතා කරනු ලබයි.

හවාලා ගනුදෙනු පිළිබඳ හැඳින්වීමක්

ලොව පුරා විසිරී සිටින නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ජාලයන් ලෙස ක්‍රියාත්මක වන මෙම මුදල් ප්‍රේෂණ ක්‍රමයන් ඇතැම් විට සමාජයෙහි යම් නිශ්චිත ප්‍රජාවක් තුල මුදල් හුවමාරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වනු දැක ගත හැකිය. ලොවපුරා විසිර පවතින මෙම ජාලයන්හි නියෝජිතයන් ගනුදෙනු වලට අදාළ මුදල් වටිනාකම් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ නියැලී සිටියි. හවාලා ක්‍රමය තුළ, හවාලා නියෝජිතයන් හෝ අලෙවිකරුවන් (Hawala Dars) විවිධ රටවල ජීවත් වන අතර ගනුදෙනු පියවීම් සම්පූර්ණයෙන්ම ඔවුනොවුන් අතර විශ්වාසය මත සිදු වේ. එක් රටක නියෝජිතයෙකු වෙනත් රටකට මුදල් යැවීමට අවශ්‍ය පුද්ගලයින්ගෙන් එම රටෙහිදී මුදල් එකතු කරන අතර මුදල් ලැබිය යුතු රටෙහි නියෝජිතයා එම මුදල්

5

අපේක්ෂිත ලබන්නන්ට ඔවුන් කැමති මුදල් වර්ගයකින් පියවනු ලබයි. මෙලෙස සිදුවන මුදල් ප්‍රේෂණයන්හි දී, දේශසීමා හරහා භෞතික මුදල් සංචලනයක් සිදු නොවේ, කිසිදු මූල්‍ය ආයතනයක් දේශසීමා ගනුදෙනුවලට සම්බන්ධ ද නොවේ. එමෙන්ම, මෙම ක්‍රමය යටතේ සිදුවන කිසිදු ගනුදෙනුවක් සඳහා නිසි ලෙස සටහන් තැබීමක් ද සිදු නොවේ. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවෙකුට එම මුදල් ගිණුමකට බැර කිරීමේ කිරීමේ අවශ්‍යතාවයක් පවතින අවස්ථාවක, අවශ්‍යනම් මූල්‍ය ආයතන හරහා එය සිදු කළ හැකිය.

හවාලා ක්‍රම භාවිතා කරන්නන්

ආර්ථිකයක සිටින විවිධ තරාතිරමේ පුද්ගලයන් සිය නීත්‍යානුකූල මෙන්ම නීත්‍යානුකූල නොවන අරමුණු සඳහා ද මෙම හවාලා ක්‍රම භාවිතා කරනු ලැබේ. නිදසුන් ලෙස අ) විදේශීය ශ්‍රමිකයන් තම මව් රටවල සිටින ඥාතීන් වෙත මුදල් යැවීම සඳහා, ආ) ආනයනය/අපනයන කරන ලද භාණ්ඩ සඳහා මුදල් ගෙවීම් සහ මුදල් ලබා ගැනීම් සඳහා, ඇ) දෙමාපියන් තම දරුවන්ගේ විදේශ අධ්‍යාපනය වෙනුවෙන් මුදල් යැවීම සඳහා, ඈ) අඩු සංවර්ධිත බැංකු ප්‍රවේශයන් පවතින ප්‍රදේශ වල ජීවත් වන පුද්ගලයින්ගේ මුදල් හුවමාරුව සඳහා, ඉ) නිසි වීසා ප්‍රේෂණ නොමැතිව විදේශගතවී සිටින සංක්‍රමණිකයන් සහ, ඊ) මුදල් විශුද්ධිකරණය කරන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් වැනි නීත්‍යානුකූල නොවන අයවලුන් සිය ගෙවීම් අවශ්‍යතා සඳහා.

හවාලා මුදල් ප්‍රේෂණ ක්‍රම වල ප්‍රධාන ලක්ෂණ

හවාලා ඇතුළු අවිධිමත් ප්‍රේෂණ ක්‍රමයන්හි පවතින ඒවාට අවේනික විශේෂිත ලක්ෂණ නිසා, මෙම ප්‍රේෂණ ක්‍රමයන් භාවිතා කරන්නන් සඳහා ආකර්ෂණීය වේ. එම විශේෂ ලක්ෂණ අතර පහසු ප්‍රවේශ්‍යතාව වැදගත් තැනක් ගනී. අවිධිමත් ප්‍රේෂණ ජාලයන්හි නියෝජිතයන් ලොව පුරා සෑම ප්‍රදේශයකම විසිරී පැතිරී සිටින බැවින් විධිමත් බැංකු පහසුකම් සීමිත හෝ නොමැති දුරස්ථ ප්‍රදේශ වල පවා ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමක් සඳහා මුදල් ප්‍රේෂණය කිරීම පිණිස ඔවුන්ගේ සේවාවන් ලබා ගත හැකිය. භාවිතා කරන්නන් සඳහා දැරිය හැකි මට්ටමේ සේවා ගාස්තු ද මේවායෙහි පවතින තවත් විශේෂ ලක්ෂණයකි. විධිමත් බැංකු මාර්ග හරහා අරමුදල් ප්‍රේෂණය කිරීමේදී අදාළ වන ගාස්තු සමග සසඳන විට හවාලා ගනුදෙනු හා සම්බන්ධ කොමිස් මුදල් වඩා ලාභදායි වේ. එසේම, ඇතැම් අවස්ථා වල, හවාලා නියෝජිතයින් විසින් පිරිනමනු ලබන විනිමය අනුපාතිකය විදේශ විනිමය සඳහා බලයලත් නියෝජිතයින් විසින් සිය ගනුදෙනුකරුවන්ට ලබා දෙන විනිමය අනුපතිකයන්ට වඩා ආකර්ශනීය වේ. ගනුදෙනුවල වේගවත් භාවයද මෙහිදී සැලකිය යුතු කරුණකි. මෙම අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම තුළ ව්‍යවහාර මුදල් සංචලනයක් සිදු නොවන අතර විදේශ මුදල් වටිනාකමට සමාන මුදලක් ලබන්නාගේ ගිණුමකට අරමුදල් තැන්පත් කිරීමක් ලෙස හෝ ලබන්නා වෙත ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීමක් ලෙස මෙම ගනුදෙනු පියවනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී, පැය කිහිපයක් ඇතුළත ලබන්නා හට මුදල් සපයා දීමේ හැකියාවක් මෙම ක්‍රමය තුල පවතින අතර ඇතැම් විට අදාළ හවාලා නියෝජිතයාට ගනුදෙනුවෙහි මුරපදය හෙළි කිරීමෙන් පසු ඔවුන්ගේ නිවසටම මුදල් ලබා දීමක් සිදු වේ. ගනුදෙනු සිදු කිරීමේ ඇති පහසුවද මෙහි දැකිය හැකි තවත් ලක්ෂණයකි. කුවේට්, දකුණු කොරියාව සහ මාලදිවයින වැනි බොහෝ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රටවල මෙම අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමයන්හි නියෝජිතයන් ඔවුන්ගේ වැඩබිම් වලදීම ප්‍රේෂණ මුදල් එකතු කර ගැනීමට ක්‍රියාත්මක වන බැවින් ප්‍රේෂණකරුට එය ඉතා පහසු වේ. මෙම නියෝජිතයින්ට සේවා පරිශ්‍රයන් තුලදීම සේවකයින්ගෙන් වැටුප් එකතු කිරීමේ යාන්ත්‍රණයන් ඇත. අවසානයේ මෙම මුදල් ඔවුන්ගේ පවුල් වෙත යැවීම මෙහි අරමුණයි. නිර්නාමිකව ගනුදෙනු කිරීමේ ඇති හැකියාවද මෙම ක්‍රමවල දැකිය හැකි ලක්ෂණයකි. මෙය හවාලා හි වඩාත්ම ආකර්ෂණීය ලක්ෂණයයි. මෙලෙස ගනුදෙනු කිරීමේදී කඩදාසි හෝ ලේඛනගත සාක්ෂි අවශ්‍ය නොවේ. එබැවින් තම ගනුදෙනුවලදී රහස්‍ය භාවය රැකිය යුතු පුද්ගලයන්ට එය වක්‍ර ආරාධනාවකි. තවද, මෙම නියෝජිතයන් කිසිදු නියාමන අධීක්ෂණයකට යටත් නොවන බැවින් අරමුදල් මූලාශ්‍රයේ නීත්‍යානුකූලභාවය සේවා සපයන්නන් විසින් ප්‍රශ්න නොකෙරේ. සාමාන්‍යයෙන්, රටක විනිමය පාලන සහ මුදල් හුවමාරු සීමා කිරීම් සහ පාලනයන් වැඩි වන තරමට, විධිමත් අංශයේ ගනුදෙනුකරුවන් ද මෙම අවිධිමත් සේවාවන් ලබා ගැනීමට නැඹුරු වන බැවින් හවාලා සහ උන්ඩියල් වැනි ක්‍රියාකාරකම් ද එමගින් ඉහළ යනු ඇත.

හවාලා ක්‍රම හරහා සිදුකරන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මගින් උපයන ලද නීති විරෝධී ඉපයීම් එක රටක සිට තවත් රටකට හුවමාරු කිරීම සඳහා මෙම අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම පහසු වේදිකාවක් සපයයි. මුදල් විශුද්ධිකරණය යනු සාපරාධී ක්‍රියාවලින් උපයගන්නා ලද නෛතික නොවන මුදල් නීත්‍යානුකූලව පිළිගත් මුදල් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියයි. මුදල් විශුද්ධිකරණය කිරීමේ ක්‍රියාවලිය මූලික වශයෙන් පියවර තුනකින් සමන්විත වේ. පළමු පියවර ලෙස නීති විරෝධී ක්‍රියාවලින් උපයන ලද මුදල් මූල්‍ය පද්ධතියේ එනම් බැංකු ගිණුම්වල තැන්පත් කිරීම හඳුනා ගත හැකිය. දෙවන පියවරේදී එලෙස තැන්පත් කරන ලද මුදල් තවදුරටත් කොටස් ලෙස වෙන්

කිරීම සිදු කරනු ලබයි. මෙය නීතිවිරෝධී ලෙස උපයනු ලැබූ අදයම්වල මූලාශ්‍රය වසන් කිරීම සඳහා කරනු ලබන ගනුදෙනු මාලාවකි. අවසාන පියවර වන්නේ නීතිවිරෝධී ක්‍රියාවලින් උපයන ලද ආදායම විධිමත් ආර්ථික පද්ධතියට අවශෝෂණය කර ගැනීමයි. ත්‍රස්තවාදයට මුදල් සැපයීම යනු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ/හෝ සංවිධානවලට මුදල් සැපයීමේ වේ. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ මූලාශ්‍රය නීත්‍යානුකූල හෝ නීති විරෝධී විය හැකිය. ත්‍රස්තවාදී කණ්ඩායම්වල න්‍යාය පත්‍ර ඉදිරියට ගෙන යාමට ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව මුදල් ගලා ඒම අත්‍යවශ්‍ය වේ. එබැවින් ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සඳහා මෙවැනි ක්‍රම අවභාවිතා කරයි.

හවාලා ගනුදෙනු මුවාවෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම කරනු ලබන ක්‍රම කිහිපයක් පවතී. මේවායෙහි පවතින අඩුපාඩු සහ සෘණාත්මක ප්‍රතිවිපාක හඳුනා ගැනීම සහ පාලනය කිරීම සඳහා නියමිත නියාමන රාමුවක් නොමැති වීම හේතුවෙන් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සැපයීම වැනි අවදානම් කටයුතු සඳහා මෙම ක්‍රම අවභාවිත වේ. මෙම නියෝජිතයින් විසින් ගනුදෙනු පිළිබඳ වාර්තා නිසි ලෙස තබා ගැනීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම මෙමගින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට උදව් වන තවත් සාධකයක් වේ. බැංකු ක්ෂේත්‍රය හා සසඳන විට, මෙම ගනුදෙනු වල දී අරමුදල් මූලාශ්‍රය සහ භාවිතය පිළිබඳව අවධානය යොමු නොවීම ද මුදල් විශුද්ධිකරණය කරන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් දිරිමත් කිරීමට හේතු වේ. තවද නීතිමය කටයුතු ආරම්භ කිරීමට ඇති අපහසුව මෙහි තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වේ.

අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කිරීමේ අවදානම

මුදල් හුවමාරු කිරීම සඳහා විධිමත් ක්‍රම වෙනුවට හවාලා වැනි අවිධිමත් ක්‍රම යොදාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස බොහොමයක් අවිහිංසක පුද්ගලයන් නීති බලාත්මක කරනු ලබන ආයතනවල විමර්ශනයන්ට අනවශ්‍ය පරිදි ලක් වීමේ අවධානමක් දැක ගත හැකිය. හවාලා මඟින් සිදුකරන ගනුදෙනු වලදී විධිමත් ගනුදෙනු වලදී භාවිතා කරන ගනුදෙනු උපකරණ (negotiable instruments) හෝ ප්‍රේෂණ මාධ්‍යයන් (wire transfers) කිසිවක් භාවිතා කිරීම කිසිඳු ආකාරයකින් සිදු නොවේ. ඒ වෙනුවට, හවාලා වෙළෙන්දන්/තැරැව්කරුවන් අතර සිදුවන සන්නිවේදනය මත පමණක් පදනම්ව මුදල් මාරු කිරීම් සිදු වේ. එබැවින්, ගනුදෙනුව සිදුකළ බවට ඔප්පු කිරීමට හැකියාවක් නොලැබෙන අතර, දුක් මහන්සියෙන් උපයාගත් මුදල් මෙම ක්‍රම හරහා වෙනත් රටකට යැවීමට කටයුතු කිරීමෙන් එම මුදල් අහිමි වීමට වුවද වැඩි ඉඩක් ඇත. ඇතැම් විට, ගනුදෙනු තුලනය කිරීමේ අරමුණින් හවාලා තැරැව්කරුවන් වංචා, මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි අපරාධමය ක්‍රියා සමග සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී සිටී. එබැවින්, නීති බලාත්මක කරන ආයතන විසින් හවාලා තැරැව්කරුවන් විමර්ශනයට ලක් කිරීමේ වැඩි ඉඩකඩක් පවතී. එවන් අවස්ථාවකදී, අවිහිංසකව හෝ නොදන්නාකමින් හවාලා ක්‍රම භාවිතා කරනු ලබන පුද්ගලයින්ද නීති ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල නිලධාරීන්ගේ ප්‍රශ්නකිරීම්වලට ලක් වනු ඇත.

හවාලා ගනුදෙනු ක්‍රම මගින් රටකට, මූල්‍ය වෙළඳපොලට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම

දේශසීමා අතර ක්‍රියාත්මක වන අවිධිමත් ගනුදෙනු හුවමාරු ක්‍රමහේතුවෙන් රටක මූල්‍ය වෙළඳපොළ, ආර්ථිකය සහ ජාතික ආරක්ෂාව මත අහිතකර බලපෑම් ඇති විය හැකිය. සැලකිය යුතු තරමේ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමයන් පැවතීම හේතුවෙන් රටක අහිතකර බලපෑම් ඇති විය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.

බදු ආදායම අඩු වීම

අවිධිමත් ක්‍රම හරහා මුදල් ප්‍රේෂණය කිරීමට හවාලා මාධ්‍යන් තුළින් පුද්ගලයන් හා ආයතනවලට ඉඩකඩ ලබාදීම හේතුවෙන් බදු පැහැර හැරීමට මං සළසනු ලබයි. එවන් ගනුදෙනු හේතුවෙන් රජයට ආදායම් බදු හරහා ලැබෙන සෘජු බදු ආදායම් මෙන්ම වක්‍ර බදු ආදායම් ද අහිමි වේ. හවාලා ක්‍රම හරහා සිදුකරන ගනුදෙනු ලේඛනගත නොවීම නිසාත්, එම තොරතුරු දේශීය බදු අධිකාරීන්ට නොලැබීම නිසාත්, හවාලා ගනුදෙනු සිදු කරනු ලබන පුද්ගලයන්ගේ අදායම මෙන්ම හවාලා තැරැව්කරුවන්ගේ ආදායමද රටක බදු ආදායම යටතට නොගැනේ. තවද, ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් සේවා බදු වැනි, විධිමත් මාධ්‍යන් හරහා සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ වක්‍ර බදු අහිමි වීම තුළින් රාජ්‍ය ආදායම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලබයි. තවද, රටක ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් භාණ්ඩ මත වන බදු පැහැර හැරීමේ අරමුණින් ද හවාලා ගනුදෙනු යොදාගනු ලබයි. නිදසුනක් වශයෙන්, ගණුදෙනු ලේඛනවල මිල ගණන් අඩුවෙන් සඳහන් කරන ලෙස ආනයනකරුවෙකු විසින් විදේශ අපනයනකරුවෙකුගෙන් ඉල්ලා සිටීම මගින් ආනයනකරු විසින් රජයට ගෙවිය යුතු බදු මුදල අඩුකරගත හැක. එවිට සැබෑ පිරිවැය සහ ලේඛන වල සටහන් කළ පිරිවැය අතර වෙනස හවාලා මාධ්‍යන් හරහා පියවා ගත හැකි අතර, එය බදු බලධාරීන්ගේ අවධානයට ලක් නොවනු ඇත.

රටක ගෙවුම් ශේෂය හා විදේශ සංචිත කෙරෙහි ඇති කරන බලපෑම

ශ්‍රී ලංකාව වැනි නැගී එන ආර්ථිකයන්හි ගෙවුම් තුලන (BOP) සහ විදේශ සංචිතවල ඉතා වැදගත් අංගයක් ලෙස ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ හඳුනා ගත හැකිය. ශ්‍රමිකයින් විසින් හවාලා වැනි අවිධිමත් ක්‍රම හරහා සිය ඉපයීම් ප්‍රේෂණය

5

කරන විට, ගෙවුම් තුලනය ගණනය කිරීමේදී එම ඉපැයීම් සැලකිල්ලට නොගැනේ. ගෙවුම් තුලනය වාර්තා කරනු ලබන තවත් සංරචක කිහිපයකටම (උදාඃ භාණ්ඩ වෙළෙඳාම) මෙය අදාළ වේ. ඒ අනුව, රටක විදේශ අංශයේ සැබෑ තත්ත්වය ගෙවුම් තුලන දත්ත තුළින් නිරූපණය නොවනු ඇත.

තවද, රටක විදේශ සංචිත ගොඩනැගෙනුයේ විධිමත් මාර්ග හරහා එවනු ලබන ප්‍රේෂණයන් හරහා බැවින් රටක විදේශ සංචිත ඉහළ නැංවීමෙහි ලා හවාලා හරහා කරනු ලබන ප්‍රේෂණයන් උපකාරී නොවනු ඇත. ඇත්ත වශයෙන්ම, විධිමත් හා අවිධිමත් මාධ්‍ය අතර මාරු වීම හේතුවෙන් එම සංචිත පහත යා හැකිය.

මුදල් සැපයුම මත ඇති කරන බලපෑම

භෞතික මුදල් සංචලනයක් සිදු නොවන බැවින් හවාලා ගනුදෙනු හේතුවෙන් ආර්ථිකයක පුළුල් මුදල් සැපයුම මත ඇතිකරන සෘජු බලපෑම ශුන්‍ය වේ. කෙසේ වෙතත්, මුදල් ලැබෙන රටේ පුළුල් මුදල් සැපයුමේ සංයුතිය හවාලා ගනුදෙනු හේතුවෙන් බලපෑමට ලක් විය හැකිය. ඊට හේතු වන්නේ හවාලා ගනුදෙනු භෞතික මුදල් භාවිතය කෙරෙහි නැඹුරු වීම නිසා බැංකු තැන්පතුවල (ඉතුරුම් හා කාලීන) අඩු වීමක් සිදු වන බැවිනි. හවාලා මාධ්‍යන් විසින් බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඇති කරන ඍණාත්මක බලපෑම සහ මුදලට ඇති ඉල්ලුමේ අස්ථාවරත්වයක් ඇති කිරීමට සමත් වන ආකාරයේ මුදල් ආර්ථිකයක් නිර්මාණය වීම හරහා මූල්‍ය අතරමැදිකරණය සීමා විය හැකි අතර මුදල් ප්‍රතිපත්තියේ අකාර්යක්ෂමතාවයන් ඇති කරනු ඇති බව විද්වත් මතයයි.

මූල්‍ය අතරමැදිකරණය මත ඇති කරන බලපෑම

බැංකු පද්ධතියෙන් මුදල් කාන්දු වීම හේතුවෙන් බැංකු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා විය හැකිය. එසේම, බැංකු විසින් ඉහළ පොලී අනුපාතයක් ප්‍රදානය කිරීම හරහා තැන්පතු ආකර්ෂණය කරගැනීමට උත්සාහ කරනවිට වෙළඳපොළ පොලී අනුපාත ඉහළ යාමේ හැකියාවක්ද ඇතිවිය හැකි බව මේ පිළිබඳව සිදු කර ඇති අධ්‍යනයන්හි සඳහන් කර ඇත. තවද, විකල්ප හා අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම හේතුවෙන් මූල්‍ය අතරමැදිකරණයේ සුවිශේෂී කාර්යන් ද තර්ජනයට ලක් විය හැකිය. හවාලා ජාලයන්හි වැඩිවීම හේතුවෙන් බැංකුවලට හිමි ඔවුන්ගේ වෙළඳපොළ කොටස අහිමි වීමේ හැකියාවක්ද පවතී.

ජාතික ආරක්ෂාව මත ඇති කරන බලපෑම

ලෝකයේ සිදුව ඇති මහා පරිමාණ ත්‍රස්තවාදී ප්‍රහාර කිහිපයක්ම අර්ධ වශයෙන් මූල්‍යනය වී ඇත්තේ හවාලා වැනි ක්‍රම හරහා බැවින් එවැනි අවිධිමත් ක්‍රම පැවතීම ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතනවලට අභියෝගයක් වේ. හවාලා යනු නීතිවිරෝධී කටයුතු සඳහා ඇති වෙළෙඳපොළවල් වල මුදල් ගනුදෙනු සිදුවන ක්‍රමයක් ලෙස හඳුනා ගත හැකි අතර, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ යම් යම් මූලාශ්‍රයන් සඳහා අවිධිමත් මාධ්‍යන් යොදා ගන්නා බැවින් එය ත්‍රස්තවාදී මූල්‍යනයට එරෙහි සටනේ ඵලදායිත්වයටද තර්ජනයක් ලෙස සැළකේ. ඒ අනුව මෙවන් ක්‍රම ව්‍යාප්ත වීම නැවැත්වීමටත් ත්‍රස්තවාදීන් විසින් හවාලා මාධ්‍යන් යොදා ගැනීම නැවැත්වීමටත් සැම උත්සාහයක්ම ගත යුතුව ඇත.

ශ්‍රී ලංකාව සහ හවාලා අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම වල වර්ධනය

වසංගතය අතරතුර ශ්‍රමිකයින් විදේශ රටවලට පිටත්වීම අඩුවීමත් ශ්‍රී ලංකාවේ විධිමත් වෙළෙඳපොළ හා අවිධිමත් වෙළෙඳපොළ අතර විශාල විනිමය අනුපාත වෙනස්කම් පැවතීම හේතුවෙන් මුදල් ප්‍රේෂණය සඳහා හවාලා ක්‍රම බහුලවම යොදා ගැනීම නිසාත් වසර 2021 දී විගාමික ශ්‍රමිකයන් විසින් ශ්‍රී ලංකාව වෙත කරනු ලබන ප්‍රේෂණහි කැපී පෙනෙන අඩු වීමක් නිරීක්ෂණය වී ඇත.

හවාලා නියෝජිතයින් විසින් ප්‍රදානය කරනු ලැබූ ආකර්ෂණීය ඉහල විදේශ විනිමය විනිමය අනුපාතික හේතුවෙන් විගාමික සේවකයින් මුදල් එවීම සඳහා විධිමත් බැංකු පද්ධතියෙන් දුරස් වී හවාලා ක්‍රම වෙත නැඹුරුතාවයක් දැකගත හැකිවිය. 2021 දී සේවක ප්‍රේෂණවල දැඩි පහත වැටීම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන තත්ත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති කරන ලදී. එසේම, බැංකු පද්ධතිය තුළ පැවති විදේශ මුදල් සැපයුමේ හිඟය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආනයනකරුවන්ද තම ආනයන බිල්පත් ගෙවීමට හවාලා ක්‍රම භාවිතා කරන ලද බව වාර්තා වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ, මෑත කාලයේ හවාලා ක්‍රමවල ජනප්‍රියතාවය නිසා, විධිමත් මාර්ග හරහා රටට තීරණාත්මක විදේශ මුදල් ප්‍රවාහයන් ලැබීම අහිමි වී ඇති අතර, ඒ හරහා විදේශ විනිමය සැපයුම අඩාල වීම සහ විදේශ මුදල් සංචිත අඩු වීම ආදිය හේතුවෙන් ගෙවුම් තුලනය සඳහා ද බලපෑම් ඇති වී ඇත. මේ අනුව හවාලා ක්‍රම ව්‍යාප්ත වීම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන තත්ත්වයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. කෙසේ වෙතත්, වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම මත පදනම්ව තරඟකාරී විනිමය අනුපාතයක් ලබා දීමට විධිමත් මුදල් හුවමාරු ක්‍රමවලට හැකියාව පවතින්නේනම්, විනිමය අනුපාත අතර වෙනස්කම් බොහෝ දුරට අවම කරගත හැකි බැවින් ඒ හරහා අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම සඳහා ඇතිවන ඉල්ලුම අවම කිරීමට හැකියාව ලැබෙනු ඇත.

හවාලා ක්‍රම වලට එරෙහිව ගත් මෑතකාලීන ක්‍රියාමාර්ග

පෙර සඳහන් කළ පරිදි, ආර්ථිකයට එල්ල වූ දැඩි තර්ජනයන් හේතුවෙන් රට තුළ හවාලා ක්‍රම ව්‍යාප්ත වීම පාලනය කිරීමේ ප්‍රයත්නයන් 2021 වසර

5

තුළදී ක්‍රියාත්මක කරන ලදී. හවාලා ගණුදෙනුවල ඇති අවදානම පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා පුවත්පත්වල ලිපි හා දැන්වීම් පළ කිරීම ද ඇතුළුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද, නීතිරෝධී කටයුතුවලට සම්බන්ධ අරමුදල් මෙම ගිණුම් හරහා ගනුදෙනු වී ඇත්ද යන වග විමර්ශන මගින් තහවුරු වන තුරු එවැනි ගණුදෙනු වල යෙදුනු ගිණුම්වල මුදල් ගණුදෙනු සඳහා යොදා ගැනීමේ හැකියාව අත්හිටුවන ලදී. තවද, බැංකු හා අනෙකුත් මූල්‍යායතන වැනි විධිමත් මාර්ග හරහා විදේශ ශ්‍රමිකයන් තම ඉපයීම් ප්‍රේෂණය කිරීමට දිරි ගැන්වීම සඳහා අමතර මුදලක් පිරිනැමීම වැනි මූල්‍ය දිරිගැන්වීම් ද හඳුන්වාදෙන ලදී. තවද, විධිමත් ප්‍රේෂණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් ක්‍රම භාවිතය අධෛර්යමත් කිරීමේ අරමුණින් විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සහ විදේශ ප්‍රේෂණ සඳහා ණය පහසුකම් වැනි වෙනත් දිරි ගැන්වීම් යෝජනා කරන ලදී.

ඉදිරි දැක්ම

හවාලා ක්‍රම පැවතීම ගෝලීය ආර්ථිකයට විශාල අවදානමක් ඇති කරන අතර මෙම ක්‍රම විශාල වශයෙන් ව්‍යාප්ත වීමේ තර්ජනය හේතුවෙන් විවිධ රටවල් විසින් විවිධ උපක්‍රම භාවිතා කරමින් මෙවැනි ක්‍රම මගින් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට කටයුතු කර ඇත. ඉන්දියානු සංචිත බැංකුවේ කොන්දේසි සහිත අනුමැතියකින් තොරව ඉන්දියාවෙන් පිටත ඕනෑම පුද්ගලයෙකුට ගෙවීමක් කිරීම තහනම් කිරීම මගින් ඉන්දියාව තුළ හවාලා ගණුදෙනු සඳහා සීමා පනවා ඇත. මීට අමතරව, විධිමත් මූල්‍ය අංශයට ප්‍රවේශ වීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු ශාඛා පිහිටුවීම වැනි ක්‍රියා මාර්ග ද විධිමත් මූල්‍ය සේවාවන් හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ඉන්දීය සංචිත බැංකුව විසින් ක්‍රියා මාර්ග ද ගෙන ඇති අතර හවාලා ක්‍රමවල බලපෑම පාලනයට මුදල් හුවමාරු සේවා ක්‍රම වෙත ප්‍රවේශ වීමට බැංකු නොවන මූල්‍ය අංශයට අවසර ලබා දී ඇත. ඉන් අනතුරුව ඉන්දීය රජය විසින් 1970 දශකයේදී මූල්‍ය විනිමය කළමණාකරන පනත (Financial Exchange Management Act) බලාත්මක කරන ලදී. එසේම, මුදල් හුවමාරු කරන ආයතන විදේශීය විනිමය හුවමාරු සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා පකිස්තානය ද පියවර ගෙන ඇති අතර එහිදී ඔවුන්ට ලියාපදිංචි වීමට සහ අදාළ නියාමනයන්ට අනුකූල වීමට වසර දෙකක කාලයක් ලබා දෙන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය 2013 වසරේදී මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමෙහි හවාලා සහ අනෙකුත් සමාන සේවා සපයන්නන්ගේ භූමිකාව යන මැයෙන් කරන ලද ප්‍රකාශනය මගින්, නියාමනය නොකළ හවාලා සහ අනෙකුත් සමාන සේවා සපයන්නන් හඳුනා ගැනීමේ උපායමාර්ග සහ ඔවුන්ගේ ව්‍යාපාර විධිමත් කිරීමට දිරි ගැන්වීම් ඇති කළ හැකි මාර්ග පැහැදිලිව විස්තර කර ඇත. මේ වන විට ශ්‍රී ලංකාවේ හවාලා ක්‍රම නිරීක්ෂණය කිරීම සහ නීත්‍යානුකූල රාමුවකට ගෙන ඒම සඳහා සුදුසු නීතිමය අවශතා ඇති කොට ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට බලධාරීන් සැලසුම් කර ඇත.

මූලාශ්‍ර

1. Chene, M., 2008. Hawala Remittance System and Money Laundering, U4 Help Desk, Transparency International. [online] U4.no. Available at: <https://www.u4.no/ publications/hawala-remittance-system-and-money-laundering.pdf> [Accessed 18 March 2022].

2. Qorchi, M., Maimbo, S. and Wilson, J., 2003. Informal Funds Transfer Systems An Analysis of the Informal Hawala System. [online] Available at: <https://www.imf.org/external/pubs/nft/op/222/index.htm> [Accessed 18 March 2022].

3. Mumin, D., 2014. The Implications of Hawala Remittance System to The Somali Businesses: A Case Study of Eastleigh, Nairobi. [online] Erepo.usiu.ac.ke. Available at: <http://erepo.usiu.ac.ke/bitstream/handle/11732/48/Deeqo.pdf?isAllowed=y&sequence=1> [Accessed 18 March 2022].

4. Passas, N., 2003. Informal Value Transfer Systems, Terrorism and Money Laundering A Report To The National Institute Of Justice. [online] Ojp.gov. Available at: <https://www.ojp.gov/pdffiles1/nij/grants/208301.pdf> [Accessed 18 March 2022].

5. El Qorchi, M., Maimbo, S. and Wilson, J., 2003. Informal Funds Transfer Systems: An Analysis of the Informal Hawala System. Occasional Papers, [online] Available at: <https://doi.org/10.5089/9781589062269.084> [Accessed 7 April 2022].

පිටත්ව යන සංක්‍රමණික ශ්‍රමිකයින් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ, 2022 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස නැවත යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකු අංශය හරහා ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් 'විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව' නමින් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරන ලද අතර, බැංකු අංශය හරහා මුදල් ප්‍රේෂණ කරනු ලබන ශ්‍රමිකයන් සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රම රැසක් ද හඳුන්වා දෙන ලදී. තවද, බොහෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහභාගීත්වයෙන් ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම විසින්, පහසුවෙන් ප්‍රේෂණ මාරු කිරීමට පහසුකම් සැලසීම සඳහා "ලංකා රෙමිට්" නමින් ජංගම යෙදුමක් දියත් කරන ලදී. රුපියල්වලට පරිවර්තනය කරන ලද ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සඳහා නිල විනිමය අනුපාතිකයට වඩා වැඩි තාවකාලික මූල්‍ය දිරිගැන්වීමක් ලබා දුන් අතර, සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා තවත් දිරිගැන්වීම් යෝජනා ක්‍රම කිහිපයක් ඉදිරියේ දී හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

5.3 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

2021 වසරේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් සමස්තයක් ලෙස නොවෙනස්ව පැවතුණි. පෙර වසර සමග සැසඳීමේ දී, 2021 වසරේ දී රජය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම පහළ ගිය අතර, පෞද්ගලික අංශය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම වැඩි වීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන ගිණුමෙහි 2020 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 28ක අතිරික්තය සමග සැසඳීමේ දී 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 25ක අතිරික්තයක් වාර්තා කළේය.

5.4 මූල්‍ය ගිණුම

ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමෙහි, 2021 වසරේ දී වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළ අතර, වගකීම්වල ශුද්ධ වෙනස්වීම් ඉහළ ගියේය. වගකීම්වල ශුද්ධ වෙනස්වීම්, 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.7ක අඩුවීමට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.9ක වැඩිවීමක් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතය සහ දේශීය තත්ත්වයන් හමුවේ පවතින අඛණ්ඩ අවිනිශ්චිතතාවය පිළිබිඹු කරමින්, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන, පෙර වසරේ දී මෙන්ම 2021 වසරේ දී ද මධ්‍යස්ථව පැවතුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන, 2020 වසරේ දී ලද එ.ජ. ඩොලර් මිලියන 670ට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 784ක් ලෙස වාර්තා විය. තවද, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ඇතුළත් නොවූ විදේශීය සෘජු ආයෝජන, 2020 වසරේ දී වාර්තා කරන ලද එ.ජ. ඩොලර් මිලියන 434ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 598ක් විය. අංශ අනුව සැලකීමේ දී, විදේශීය සෘජු ආයෝජන ප්‍රධාන වශයෙන් ලැබී ඇත්තේ විදුලි සන්දේශ, දේපළ සංවර්ධනය, ඇඟලුම් සහ හෝටල් යන අංශවලට අදාළ ව්‍යාපෘතිවලට වන අතර, එම විදේශීය සෘජු ආයෝජන මූලික වශයෙන් ලැබී ඇත්තේ දැනටමත් ස්ථාපිත සෘජු ආයෝජන ව්‍යාපාර සඳහාය. 2021 වසරේ දී විදේශීය සෘජු ආයෝජන මධ්‍යස්ථ වුව ද, ඉදිරි අනාගතයේ දී, විශේෂයෙන්ම කොළඹ වරාය නගරයට සහ හම්බන්තොට වරාය ව්‍යාපෘතියට විදේශීය සෘජු ආයෝජන ලැබීම් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින ඌන උපයෝජිත වත්කම්වලින් මුදල් ඉපැයීමට ද ප්‍රයත්න ක්‍රියාත්මක වන අතර, රටෙහි විදේශීය සෘජු ආයෝජන වෙනුවෙන් එම ලැබීම් ද දායක වනු ඇත.

2021 වසරේ දී රජයට ලැබුණු ප්‍රධාන මූල්‍ය ලැබීම් අතරට 2021 වසරේ අප්‍රේල් සහ සැප්තැම්බර් මාසවල දී චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 810ක පමණ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක් ඇතුළත් විය. මීට අමතරව, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙත වූ විදේශීය ආයෝජන වලින් සමන්විත ණය සුරැකුම්පත් ආකාරයෙන් වූ ආයෝජන, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 670ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. අනේවාසිකයන්ට ගෙවීමට තිබූ එ.ජ.ඩොලර් මිලියන 700ද ඇතුළත් එ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය 2021 වසරේ ජූලි මාසයේ දී කල් පිරීම, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විදේශීය ආයෝජනවල ශුද්ධ ගෙවීම් සහ වසර තුළ දී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආශ්‍රිතව අනේවාසිකයන් විසින් ද්විතීයික වෙළෙඳපොළ වෙතින් සිදුකළ ශුද්ධ මිලදී ගැනීම්වල ශුද්ධ බලපෑම මේ සඳහා හේතුවිය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී ජා.මූ. අරමුදල වෙතින් වි.ගැ.හි. වෙන් කිරීමෙන් වූ ලැබීම (එ.ජ. ඩොලර් මිලියන 787ක් පමණ) සහ 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී බංගලාදේශ බැංකුව සමග සිදුකළ ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් (එ.ජ. ඩොලර් මිලියන 200) ඇතුළුව, මහ බැංකුවට ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. තවද, මහ බැංකුව විසින් 2021 වසරේ මාර්තු මාසයේ දී චීන මහජන බැංකුව සමග ඇතිකර ගත් එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන වූ ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී සක්‍රීය කරන ලදී. තවද, 2020 වසරේ දී ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම වසර තුළ දී මහ බැංකුව විසින් පියවන ලදී. මේ අතර, පෞද්ගලික අංශය වෙත වූ මූල්‍ය ලැබීම් 2021 වසරේ දී මධ්‍යස්ථ විය. ඒ අනුව, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සෘජු ආයෝජන ගනුදෙනු නොවන විදේශීය ආයෝජනවලින් සමන්විත හිමිකම් ආකාරයෙන් වූ විවිධ ආයෝජන, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 217ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 236ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. තවද, පෞද්ගලික අංශයට සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය ලැබීම් ද 2021 වසරේ දී

5

5.11 රූප සටහන
මූල්‍ය ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මධ්‍යස්ථ ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, බැංකු අංශය වෙත වූ විදේශීය ලැබීම් සැලකීමේ දී, මුදල් හා තැන්පතු සැලකිය යුතු ශුද්ධ වැඩිවීමක් වාර්තා කර ඇති අතර, බැංකු අංශයේ කෙටි කාලීන විදේශීය ණය වගකීම්වල සැලකිය යුතු ශුද්ධ පියවීම් ප්‍රමාණයක් වාර්තා විය. ප්‍රධාන වශයෙන් වසංගත කාලපරිච්ඡේදවල දී ඉන්ධන සඳහා ඉල්ලුම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් බිල්පත් සඳහා සිදුකළ ශුද්ධ පියවීම් හමුවේ වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල ශුද්ධ වෙනස් වීම් අඩු විය. තවද, මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ වගකීම්වලින් ප්‍රධාන වශයෙන් සමන්විත ගෙවිය යුතු අනෙකුත් ගිණුම්, 2021 වසරේ දී ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය.

2021 වසරේ දී දළ නිල සංචිත පහත වැටීම පිළිබිඹු කරමින් මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ විදේශීය වත්කම් අඩුවීම හේතුවෙන්, මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.1කින් අඩු විය. රජයේ සැලකිය යුතු විදේශීය ණය සේවාකරණ ගෙවීම්, මහ බැංකුවේ කල් පිරෙන වගකීම් පියවීම මෙන්ම විශේෂයෙන් 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදය තුළ දී ඉන්ධන, එල් පී ගෑස්, ගල් අඟුරු, ඖෂධ සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය සැලකිය යුතු ලෙස සැපයීම හේතුවෙන් 2021 වසර තුළ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 2.5කින් අඩු විය. කෙසේ වෙතත්, තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු ආකාරයෙන් වූ වත්කම්හි ශුද්ධ

5.9.අ. සංඛ්‍යා සටහන
මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
මූල්‍ය ගිණුම	**-2,113**	**-1,718**	**-2,122**	**1,907**
සෘජු ආයෝජන	**15**	**434**	**17**	**598**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	10	211	13	317
ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම්	7	20	9	27
සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි	7	20	9	27
ප්‍රති ආයෝජිත ඉපැයුම්	3	191	4	290
ණය උපකරණ	4	223	5	281
සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි	4	223	5	281
විවිධ ආයෝජන	**-**	**-2,383**	**-**	**-906**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	-	-217	-	-236
ණය සුරැකුම්පත්	-	-2,166	-	-670
රජය	-	-2,166	-	-670
කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්)	-	-122	-	-2
දිගු කාලීන	-	-2,044	-	-668
භාණ්ඩාගාර බැඳුම්කර	-	-431	-	-25
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	22	-	-2
ස්වෛරීත්ව බැඳුම්කර	-	-1,635	-	-640
නිකුතු	-	-	-	-
කල්පිරීම්	-	-859	-	-700
ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු	-	-776	-	60
මූල්‍ය ව්‍යුත්පන්න	**-**	**-**	**-**	**-**
අනෙකුත් ආයෝජන	**-136**	**231**	**387**	**2,216**
මුදල් සහ තැන්පතු	64	-15	306	4,016
මහ බැංකුව	-	400	-	1,375
කෙටි කාලීන	-	...	-	1
දිගු කාලීන	-	400	-	1,374
තැන්පතු භාරගන්නා ආයතන	64	-415	306	2,641
කෙටි කාලීන	259	-415	256	2,641
දිගු කාලීන	-194	-	50	-
පිටු අංක 176 හා සම්බන්ධයි				
විශේෂිත අයිතමයන්				
විදේශීය සෘජු ආයෝජන				
හිමිකම්		20		27
ප්‍රති ආයෝජිත ඉපැයුම්		191		290
අන්තර් සමාගම් ණය		223		281
මුළු විදේශීය සෘජු ආයෝජන (1)		**434**		**598**
ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2)		236		187
ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)		**670**		**784**
කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්		**-225**		**-238**
සෘජු ආයෝජන		-8		-2
විවිධ ආයෝජන		-217		-236
රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)		**-553**		**-27**
විදේශීය මිල දී ගැනීම්		120		17
විදේශීය විකුණුම්		673		44

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තු සමඟ සසඳන විට යම් වෙනසක් වේ නම් එසේ වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

5

5.9.ආ සංඛ්‍යා සටහන

මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
අනෙකුත් ආයෝජන (පිටු අංක 175 හා සම්බන්ධයි)				
ණය	-	174	-	-1,552
මහ බැංකුව	-	-14	-	-57
ජා.මූ. අරමුදලෙන් ලද ණය	-	-14	-	-57
විස්තීර්ණ ණය පහසුකම	-	-14	-	-57
තැන්පතු භාරගන්නා ආයතන	-	75	-	-2,152
කෙටි කාලීන	-	403	-	-2,169
දිගු කාලීන	-	-328	-	17
රජය	-	169	-	664
දිගු කාලීන	-	169	-	664
අනෙකුත් අංශ (ඇ)	-	-56	-	-7
දිගු කාලීන	-	-56	-	-7
වෙළඳ ණය සහ අත්තිකාරම්	-224	185	257	-428
තැන්පතු භාරගන්නා ආයතන	9	-	-3	-
කෙටි කාලීන	9	-	-3	-
අනෙකුත් අංශ (ඈ)	-233	185	260	-428
කෙටි කාලීන	-233	185	260	-428
අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්	24	-114	-176	180
මහ බැංකුව	-	-114	-	180
කෙටි කාලීන (ඉ)	-	-114	-	180
තැන්පතු භාරගන්නා ආයතන	24	-	-176	-
කෙටි කාලීන	24	-	-176	-
විශේෂ ගැනුම් හිමිකම්	-	-	-	787
සංචිත වත්කම්	**-1,992**		**-2,526**	
මූල්‍ය රත්‍රන්	-667		-212	
විශේෂ ගැනුම් හිමිකම්	-5		123	
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	-		-	
අනෙකුත් සංචිත වත්කම්	-1,319		-2,437	
මුදල් සහ තැන්පතු	-177		1,536	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	-1,092		1,055	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	914		481	
සුරැකුම්පත්	-1,143		-3,976	
ණය සුරැකුම්පත්	-1,143		-3,976	
දිගු කාලීන	-1,143		-3,976	
අනෙකුත් හිමිකම්	1		3	
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-394**		**-4,029**	
විශේෂිත අයිතමයන්				
රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)		**169**		**664**
ලැබීම් (ණය මුදා හැරීම්)		1,882		2,418
ව්‍යාපෘති ණය		1,382		1,608
විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්		500		810
ගෙවීම්		1,713		1,754

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

5.10 සංඛ්‍යා සටහන

2021 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්

දායකයා සහ ව්‍යාපෘතිය	ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන
රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව	**1,608**
එයින්;	
ආසියානු සංවර්ධන බැංකුව	**613**
එයින්;	
ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන	221
ද්විතීයික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන	52
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන	42
ජාත්‍යන්තර සංවර්ධන සංගමය	**294**
එයින්;	
දේශගුණික බලපෑම් අවම කරවීම් කළමනාකරණය	36
උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය	28
ජපානය	**135**
එයින්;	
කැළණි ගඟ හරහා නව පාලමක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය	51
ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	34
ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව	**131**
එයින්;	
කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	54
ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	42
චීන අපනයන - ආනයන බැංකුව	**126**
එයින්;	
මහනුවර උතුරු පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	54
දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	36
මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම	34
ඉන්දියානු අපනයන - ආනයන බැංකුව	**81**
එයින්;	
දුම්රිය අංශය සංවර්ධනය සඳහා වූ ඩොලර් ණය	80
ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	**27**
එයින්;	
අඹතලේ ජල සම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය	10
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	**22**
එයින්;	
කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘති සඳහා සහාය වීම	19
නෙදර්ලන්ත රබෝ බැංකුව (Robo Bank)	**22**
එයින්;	
කළුතර මහ රෝහල සංවර්ධනය	13

මූලය: මුදල් අමාත්‍යාංශය

අත්කර ගැනීම් සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් විසින් ඔවුන්ගේ විදේශීය වෙළඳ හවුල්කරුවන් වෙත ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් නිරූපණය කරන වෙළඳ ණය සහ අත්තිකාරම් මත වන වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් වසර තුළ දී ඉහළ ගිය අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනෙකුත් ලැබිය යුතු ගිණුම් වසර තුළ දී ශුද්ධ අඩුවීමක් වාර්තා කළේය.

5.5 සමස්ත ශේෂය

ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස නිරූපණය කරන ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2021 වසරේ දී අඛණ්ඩව සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව මධ්‍යස්ථ වීම, සිදුකළ සැලකිය යුතු මට්ටමේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කළ ශුද්ධ විකුණුම් හේතුවෙන් දළ නිල සංචිත, 2021 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අනුව, ශුද්ධ ජාත්‍යන්තර සංචිත 2021 වසර අවසානයේ දී හිඟයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී සමස්ත ශේෂයෙහි වූ එ.ජ. ඩොලර් බිලියන 2.3ක හිඟයකට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.0ක පමණ හිඟයක් වාර්තා කළේය.

5.6 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය අනුව 2020 වසර අවසානයේ සිට 2021 වසර අවසන් වන විට ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර, විදේශීය වත්කම් තත්ත්වය පහළ ගියේය. ඒ අනුව, රටෙහි විදේශීය වගකීම් තත්ත්වය 2020 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 58.6ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 64.5ක් දක්වා වැඩි වූ අතර, රටෙහි විදේශීය වත්කම් තත්ත්වය 2020 වසර අවසාන වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 10.9ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 8.8ක් දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය 2020 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 47.7ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 55.7ක් දක්වා වැඩි විය.

අනේවාසිකයන් සතුව ඇති ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් තත්ත්වය 2021 වසර තුළ සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්, 2020 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් වූ දළ නිල සංචිත 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා අඩු වීම හේතුවෙන් විදේශීය වත්කම් තත්ත්වය අඩු විය.[1] මේ අතර, නේවාසික ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි සිදු කරන සෘජු ආයෝජන නිරූපණය කරන සෘජු ආයෝජන වත්කම් තත්ත්වය වසර තුළ දී සුළු වශයෙන් වැඩි විය. තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු ආකාරයෙන්

1 විදේශ සංචිත තත්ත්වයෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් 5.6.1 කොටසෙහි අන්තර්ගත වේ.

5.11 සංඛ්‍යා සටහන

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
සෘජු ආයෝජන (ඇ)	**1,509**	**13,655**	**1,522**	**17,891**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	1,473	8,665	1,482	12,626
ණය උපකරණ	36	4,990	40	5,264
විවිධ ආයෝජන	**…**	**8,579**	**…**	**7,508**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්		867		1,148
අනෙකුත් අංශ		867		1,148
ණය සුරැකුම්පත් (ඈ)	…	7,712	…	6,360
තැන්පතු භාරගන්නා ආයතන	…		…	
කෙටි කාලීන	…		…	
රජය		7,616		6,266
කෙටි කාලීන		4		1
දිගු කාලීන		7,613		6,265
අනෙකුත් අංශ		96		94
දිගු කාලීන		96		94
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන	**3,710**	**36,340**	**4,096**	**39,100**
මුදල් සහ තැන්පතු	**835**	**1,734**	**1,142**	**5,749**
මහ බැංකුව		400		1,775
කෙටි කාලීන		…		1
දිගු කාලීන		400		1,774
තැන්පතු භාරගන්නා ආයතන	835	1,333	1,142	3,974
කෙටි කාලීන	622	1,333	878	3,974
දිගු කාලීන	214		264	
ණය		**31,353**		**29,585**
මහ බැංකුව		1,378		1,265
ජා.මූ. අරමුදලෙන් ලද ණය		1,378		1,265
තැන්පතු භාරගන්නා ආයතන		5,324		3,172
කෙටි කාලීන		4,174		2,005
දිගු කාලීන		1,150		1,167
රජය		20,570		21,077
දිගු කාලීන		20,570		21,077
අනෙකුත් අංශ (ඉ)		4,081		4,071
දිගු කාලීන		4,081		4,071
වෙළඳ ණය සහ අත්තිකාරම්	**954**	**2,341**	**1,211**	**1,913**
තැන්පතු භාරගන්නා ආයතන	101		98	
කෙටි කාලීන	101		98	
අනෙකුත් අංශ (ඊ)	853	2,341	1,113	1,913
කෙටි කාලීන	853	2,341	1,113	1,913
අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්	**1,920**	**343**	**1,744**	**523**
මහ බැංකුව (උ)		343		523
කෙටි කාලීන		343		523
තැන්පතු භාරගන්නා ආයතන	1,920		1,744	
කෙටි කාලීන	1,920		1,744	
විශේෂ ගැනුම් හිමිකම්		**570**		**1,330**
සංචිත වත්කම්	**5,664**		**3,139**	
මූල්‍ය රත්‍රන්	409		175	
විශේෂ ගැනුම් හිමිකම්	3		124	
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	69		67	
අනෙකුත් සංචිත වත්කම්	5,184		2,773	
මුදල් සහ තැන්පතු	2,210		2,729	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	861		899	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	1,350		1,830	
සුරැකුම්පත්	2,974		44	
ණය සුරැකුම්පත්	2,974		44	
මුළු වත්කම්/වගකීම්	**10,883**	**58,574**	**8,758**	**64,498**
ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය		**-47,691**		**-55,740**
විශේෂිත අයිතමයන්				
පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය	10,883	58,574	8,758	64,498
කෙටි කාලීන	6,184	9,062	6,804	9,564
දිගු කාලීන	4,699	49,512	1,954	54,934

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජන තත්ත්වය ද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය නිකුතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පවතින වත්කම් තත්ත්වය ඉහළ ගිය අතර, අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල අඩුවීමක් වාර්තා විය. මේ අතර, පෞද්ගලික අංශය මගින් අනේවාසිකයන්ට ලබා දී ඇති වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති වත්කම් තත්ත්වය, 2020 වසර අවසානයේ දී නිරීක්ෂණය කරන ලද තත්ත්වයට වඩා 2021 වසර අවසන් වන විට වැඩි විය.

අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි පිළිබිඹු වන අනේවාසිකයන් වෙත වූ ශ්‍රී ලංකාවේ සමස්ත වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සෘජු ආයෝජන වගකීම්, මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු වගකීම් මෙන්ම වි.ගැ.හි. වෙන් කිරීමට අදාළ වගකීම් වැඩි වීමයි. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කර ඇති අනේවාසික සමාගම්වල ප්‍රධාන හිමිකම් තත්ත්වයන් කිහිපයක සැලකිය යුතු තක්සේරු ලාභ වාර්තා වීම හේතුවෙන්, හිමිකම් ස්වරූපයෙන් පවතින නොපියවා ඉතිරිව ඇති සෘජු ආයෝජනවල වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් බිලියන 4.0කින් පමණ වැඩි විය. 2021 වසර අවසානය වන විට මෙම අනේවාසික ආයෝජකයන් සඳහා සැලකිය යුතු තක්සේරු ලාභයක් ලබා දෙමින්, වසර ආරම්භයේ සිට හිමිකම් තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ ගිය බැවින්, විශේෂයෙන් සමහර සමාගම්වල මෙම හිමිකම් වෙනුවෙන් වූ ලාභ ඉහළ යෑම් කැපී පෙනුණි. තවද, වසර තුළ දී චීන මහජන බැංකුව සමඟ චීන යුවාන් බිලියන 10ක (එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන) සහ බංගලාදේශ බැංකුව (එ.ජ. ඩොලර් මිලියන 200ක්) සමඟ නව ද්වීපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට එළඹීමෙහි සහ දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම (එ.ජ. ඩොලර් මිලියන 400ක) පියවීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය 2021 වසර අවසානය වන විට වැඩි විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානය වන විට ඉහළ ගියේය. තවද, වසර තුළ දී ජා.මූ. අරමුදල විසින් සිදු කරන ලද එ.ජ. ඩොලර් මිලියන 787ක් පමණ වූ නව වි.ගැ.හි. වෙන්කිරීම සමඟ වි.ගැ.හි වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානයේ දී වැඩි විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් වසර තුළ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ආපසු ගෙවීම සහ නොපියවා ඉතිරිව ඇති රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල කැපී පෙනෙන ලෙස පහත වැටීම සමඟ 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට විවිධ ආයෝජන වගකීම් තත්ත්වය පහත වැටුණි. ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වගකීම් පහළ යෑම හේතුවෙන් අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානයේ දී පහත වැටුණි. එසේ වුව ද, ප්‍රධාන වශයෙන් වසර තුළ දී ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක් හේතුවෙන් රජයේ විදේශීය ණය වගකීම් තත්ත්වයෙහි ඉහළ යෑමක් වාර්තා කළේය. තවද, 2021 වසර තුළ දී මහ බැංකුවෙහි ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ වගකීම් වැඩිවීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය වැඩි වූ අතර, ශ්‍රී ලංකාවේ ආනයනකරුවන් වෙත ලැබුණු වෙළඳ ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩු විය.

5.6.1 සංචිත වත්කම් තත්ත්වය

2020 වසර අවසානය වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 5.7ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා අඩු විය. සැලකිය යුතු විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්වල සහ වසර තුළ දී වූ මධ්‍යස්ථ විදේශ විනිමය ලැබීම් හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස දළ නිල සංචිත පහත වැටුණි. වසර තුළ දී දළ නිල සංචිත නැවත ගොඩ නැංවීමට උපකාරී වූ ප්‍රධාන ලැබීම් වලට චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 810ක පමණ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක්, ජා.මූ. අරමුදල මගින් ලද එ.ජ. ඩොලර් මිලියන 787ක පමණ වි.ගැ.හි. වෙන් කිරීම සහ චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5ක පමණ (චීන යුවාන් බිලියන 10) ලද සහ බංගලාදේශ බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 200ක ද්වීපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට අදාළ ලැබීම් ඇතුළත් වේ. කෙසේ වෙතත්, කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම (එ.ජ. ඩොලර් බිලියන 1.0), විදේශීය ව්‍යාපෘති ණය සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් වලට අදාළ ණය වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් (එ.ජ. ඩොලර් බිලියන 2.2), ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ අක්වෙරළ බැංකු ඒකක වෙතින් ලබා ගත් ණය සඳහා වූ ණය වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් (එ.ජ. ඩොලර් බිලියන 2.3) ඇතුළත්ව විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් සහ අත්‍යවශ්‍ය ආනයන බිල්පත් මූල්‍යයනය කිරීමට මහ බැංකුව විදේශ විනිමය

5.12 රූප සටහන
කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සැපයීම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම, වසර තුළ දී දළ නිල සංචිත මට්ටම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වසර අවසානයේ පැවති දළ නිල සංචිත මට්ටම ආනයනික මාස 1.8කට

5.12 සංඛ්‍යා සටහන
දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)
1. රජයේ විදේශීය වත්කම්	488	817	386	155	177
2. මහ බැංකුවේ විදේශීය වත්කම්	7,470	6,102	7,256	5,510	2,962
3. දළ නිල සංචිත වත්කම් (1+2)	**7,959**	**6,919**	**7,642**	**5,664**	**3,139**
4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම්	2,478	2,664	2,760	2,856	2,983
5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ)	**10,436**	**9,583**	**10,402**	**8,521**	**6,122**
6. සංචිතවලට අදාළ වගකීම් (ඇ)	1,361	1,425	1,771	2,121	3,562
7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)	**6,597**	**5,495**	**5,871**	**3,543**	**-423**
8. සමස්ත ශේෂය (ඈ)	**2,068**	**-1,103**	**377**	**-2,328**	**-3,967**
9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
9.1 වෙළඳ භාණ්ඩ	4.6	3.7	4.6	4.2	1.8
9.2 වෙළඳ භාණ්ඩ හා සේවා	3.8	3.1	3.7	3.7	1.8
10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
10.1 වෙළඳ භාණ්ඩ	6.0	5.2	6.3	6.4	3.6
10.2 වෙළඳ භාණ්ඩ හා සේවා	4.9	4.3	5.1	5.6	3.4

(අ) තාවකාලික
මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද ඍජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්

(2020 වසරේ දී ආනයනික මාස 4.2කට) සමාන වූ අතර, ඉදිරි වසර තුළ කල් පිරීමට නියමිත කෙටිකාලීන ණය සහ වගකීම්වලින් සියයට 23කට (2020 දී සියයට 43කට) සමාන විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම් ප්‍රමාණයෙහි මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ ද, ප්‍රධාන වශයෙන් නිල සංචිතවල පහළ යෑම හේතුවෙන්, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු ජාත්‍යන්තර සංචිත ද 2021 වසර අවසානය වන විට පහළ ගියේය. 2020 වසරේ දී වූ ආනයනික මාස 6.4ට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට රටෙහි මුළු විදේශීය වත්කම් තත්ත්වය ආනයනික මාස 3.6කට සමාන විය.

5.7 විදේශීය ණය සහ ණය සේවාකරණය

5.7.1 විදේශීය ණය

ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වැඩිවීමත් සමඟ 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය තත්ත්වය ඉහළ ගියේය. 2020 වසර අවසන් වන විට පැවති රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 49.0ක සිට 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 50.7ක් දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙක ලැබීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති රජයේ මුළු විදේශීය ණය වසර තුළ ඉහළ යාමක් වාර්තා කළ ද, වෙළඳපොළ මිලට අනුව රජයේ විදේශීය ණය 2020 වසර අවසන් වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 28.2ක සිට 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 27.3ක් දක්වා අඩු විය. මෙය, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල පහත වැටීම සහ 2021 වසරේ ජූලි මාසයේ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු ගෙවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 2021 වසරේ රජයේ විදේශීය ණය අඩු වීමට ප්‍රධාන හේතුවක් වූයේ ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙතින් නව ණය ගැනීම අඩු වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත උපයෝගී කර ගනිමින් රජය සතු විදේශීය ණය වගකීම් ආපසු ගෙවීමට සිදු වීමයි. මේ අතර, ඉන්දියානු සංචිත බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම ආපසු ගෙවුව ද, චීන මහජන බැංකුව සහ බංගලාදේශ බැංකුව සමඟ නව ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට එළඹීම හේතුවෙන් 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසන් වන විට මහ බැංකුවේ නොපියවා

5

5.13 සංඛ්‍යා සටහන
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රජය	**28,187**	**27,344**
කෙටි කාලීන	**4**	**1**
ණය සුරැකුම්පත්	4	1
භාණ්ඩාගාර බිල්පත් (ඇ)	4	1
දිගු කාලීන	**28,183**	**27,343**
ණය සුරැකුම්පත්	7,613	6,265
භාණ්ඩාගාර බැඳුම්කර (ඇ)	31	8
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ)	27	24
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ)	7,555	6,233
ණය	20,570	21,077
මහ බැංකුව	**2,690**	**4,892**
කෙටි කාලීන	**343**	**524**
මුදල් සහ තැන්පතු	...	1
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	343	523
ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්	343	523
දිගු කාලීන	**2,348**	**4,368**
විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්	570	1,330
මුදල් සහ තැන්පතු	400	1,774
ණය	1,378	1,265
ජා.මූ. අරමුදලේ ණය	1,378	1,265
විස්තීර්ණ ණය පහසුකම	1,378	1,265
තැන්පතු භාරගන්නා ආයතන	**6,657**	**7,146**
කෙටි කාලීන	**5,507**	**5,979**
මුදල් සහ තැන්පතු (ඊ)	1,333	3,974
වාණිජ බැංකු	1,333	3,974
ණය	4,174	2,005
වාණිජ බැංකු	4,174	2,005
දිගු කාලීන	**1,150**	**1,167**
ණය	1,150	1,167
වාණිජ බැංකු	1,109	1,084
තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන	41	83
අනෙකුත් අංශ (උ)	**6,517**	**6,078**
කෙටි කාලීන	**2,341**	**1,913**
වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ)	2,341	1,913
දිගු කාලීන	**4,176**	**4,165**
ණය සුරැකුම්පත් (ඉ)	96	94
ණය	4,081	4,071
පෞද්ගලික අංශය	2,315	2,425
රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා	1,766	1,646
සෘජු ආයෝජනඃ අන්තර් සමාගම් ණය (එ)	**4,990**	**5,264**
දළ විදේශීය ණය තත්ත්වය	**49,041**	**50,724**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන්		
දළ විදේශීය ණය	60.5	60.0
කෙටි කාලීන ණය	10.1	10.0
දිගු කාලීන ණය	50.4	50.0
දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්		
කෙටි කාලීන ණය	16.7	16.6
දිගු කාලීන ණය	83.3	83.4
විශේෂිත අයිතමයන්		
අනේවාසිකයින් සතු ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම-ආංශික වර්ගීකරණය	**12,058**	**11,400**
රජය	11,883	11,225
භාණ්ඩාගාර බිල්පත්	4	1
භාණ්ඩාගාර බැඳුම්කර	33	9
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	27	24
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	11,820	11,191
අනෙකුත් අංශ	175	175
නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම	**14,050**	**13,050**
අනේවාසිකයින් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය	11,820	11,191
නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (2019 වසරේ දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල අන්තර්ගත නොවේ)	2,230	1,859

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතිරිව ඇති විදේශීය ණය සැලකිය යුතු ලෙස වැඩි විය. කෙටිකාලීන ණය තත්ත්වය කැපී පෙනෙන ලෙස පහළ ගියද, මුදල් හා තැන්පතුවල සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ද සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර, පෞද්ගලික අංශයේ සමාගම් විසින් ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය වැඩි වුව ද, පෞද්ගලික අංශය වෙත ලැබුණු වෙළෙඳ ණයෙහි නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩුවීම සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය ආපසු ගෙවීම සමඟ 2021 වසරේ දී පෞද්ගලික අංශයේ සමාගම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය පහළ ගියේය. තව ද, වසර තුළ දී සෘජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ලැබුණු බැවින්, සෘජු ආයෝජන ව්‍යාපාරවල අන්තර් සමාගම් ණය 2021 වසරේ දී ඉහළ ගියේය.

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රටෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය වසර තුළ දී සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කරන ලදී. 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ දී නාමික ද.දේ.නි.යෙහි වැඩිවීම පිළිබිඹු කරමින්, 2021 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයෙහි පැවති සියයට 60.5ට සාපේක්ෂව සියයට 60.0ක් විය. සමස්ත විදේශීය ණය තත්ත්වයෙන් රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය 2020 වසර අවසානයේ දී පැවති සියයට 57.5 සිට 2021 වසර අවසානයේ දී සියයට 53.9ක් දක්වා පහළ

5.13 රූප සටහන
විදේශීය ණය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ගියේය. ණය කල්පිරීමේ කාලය අනුව, දිගුකාලීන කල් පිරීම් සහිත ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ දී පැවති සියයට 50.4ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී සියයට 50.0ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය.

5.7.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

ණය වාරික ගෙවීම්වල සුළු ඉහළ යෑමක් තිබුණ ද, පොලී ගෙවීම් අඩුවීම හේතුවෙන් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. විදේශීය ණය වාරික ගෙවීම් 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.0ට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා වැඩි විය. ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබාගත් ද්වීපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම පියවීම 2021 වසරේ ණය වාරික ගෙවීම්වල ඇතුළත් වේ. තවද, 2021 වසරේ පියවන ලද එ.ජ. ඩොලර් බිලියන 1ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය කල් පිරීමේ දී, එ.ජ. ඩොලර් මිලියන 700ක් අනේවාසිකයන්ට ගෙවන ලද අතර, ඉතිරිය නේවාසිකයන්ට ගෙවන ලදී. වසර තුළ දී රජයේ විදේශීය ණය වාරික ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, වසර තුළ දී පෞද්ගලික අංශය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වාරික ගෙවීම් පෙර වසරට සාපේක්ෂව, සැලකිය යුතු ලෙස අඩු විය. මහ බැංකුව විසින් ජා.මූ. අරමුදල වෙතින් 2016 වසරේ දී ගෙවුම් තුලනයට සහය වීම සඳහා ලබාගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ණය වාරික ගෙවීම් වසර තුළ දී අඛණ්ඩව සිදු කළේය. 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 1.6ට සාපේක්ෂව, විදේශීය ණය මත වූ පොලී ගෙවීම් වසර තුළ දී එ.ජ. ඩොලර් බිලියන 1.4ක් දක්වා අඩු විය. වසර තුළ දී, අනේවාසිකයන්ට නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කූපන ගෙවීම්, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සඳහා පොලී ගෙවීම් සහ රජයේ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වසරට සාපේක්ෂව, 2021 වසරේ දී වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම ඉහළ යෑමේ සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් ලෙස මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2020 වසරේ වාර්තා වූ සියයට 35.2ක සිට 2021 වසරේ දී සියයට 30.0ක් දක්වා පහළ ගියේය. මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයෙන් රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2020 වසරේ වාර්තා වූ සියයට 86.5ක සිට 2021 වසරේ දී සියයට 81.1ක් දක්වා පහළ ගියේය.

5.14 සංඛ්‍යා සටහන

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
1. ණය සේවාකරණ ගෙවීම්	**4,604**	**4,498**
1.1 ණය ආපසු ගෙවීම්	**3,004**	**3,111**
රජය	2,577	2,460
ව්‍යාපෘති ණය	1,713	1,754
ණය සුරැකුම්පත්	864	706
මහ බැංකුව	14	457
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	14	57
ජාත්‍යන්තර විනිමය හුවමාරු ගිවිසුම්	-	400
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	412	193
විදේශීය ණය	412	193
1.2 පොලී ගෙවීම්	**1,601**	**1,388**
රජය	1,405	1,187
ව්‍යාපෘති ණය	497	394
ණය සුරැකුම්පත්	908	793
මහ බැංකුව	19	15
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	18	15
ජාත්‍යන්තර විනිමය හුවමාරු ගිවිසුම්	2	1
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	167	175
විදේශීය ණය	167	175
සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය	10	11
2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්	**13,083**	**14,974**
3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම	**20,398**	**20,587**
4. ණය සේවාකරණ අනුපාතිකය		
4.1 ඉහත 2හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	35.2	30.0
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	35.0	29.6
4.2 ඉහත 3හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	22.6	21.8
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	22.4	21.5
5. රජයේ ණය සේවාකරණ ගෙවීම්		
5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ)	3,982	3,648
5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන්	86.5	81.1

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.8 විනිමය අනුපාතිකයේ හැසිරීම

2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකය වෙනස් වීමට ඉඩ හැරීමට පෙර ශ්‍රී ලංකා රුපියල 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී පුළුල් ලෙස ස්ථාවර මට්ටම්වල පවත්වා ගෙන යන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සීමිත විදේශ ව්‍යවහාර මුදල් ද්‍රවශීලතාවක් පැවතීම හේතුවෙන්, විශේෂයෙන්ම 2021 වසරේ පළමු මාස හතර තුළ දී, ශ්‍රී ලංකා රුපියල යම්

උච්චාවචනයක් සමගින් අවප්‍රමාණය වීමේ පීඩනයක් පෙන්නුම් කළේය. ආනයන බිල්පත් සහ රජයේ ණය සේවාකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩ ගෙවීම් මධ්‍යයේ, ණය සහ ණය නොවන ප්‍රවාහ වශයෙන් විදේශ විනිමය ලැබීම් බොහෝ දුරට පහළ යෑම මේ සඳහා හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම සිදු කළ සහ අඛණ්ඩ ශිෂ්ට ප්‍රයෝග භාවිතය වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී සහ 2022 වසරේ පළමු මාස කිහිපය තුළ දී ශ්‍රී ලංකා රුපියල ස්ථාවර වීමට ආධාර විය. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහාය ඇතිව මහ බැංකුවේ මැදිහත්වීමත් සමඟ අන්තර් බැංකු වෙළඳපොළෙහි බරිත සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය 2021 වසර අවසාන කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලරයකට රුපියල් 200 - 203ක මට්ටමේ පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි. ඒ අනුව, 2021 වසර අවසානයේ දී රඑ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ වාර්ෂික අවප්‍රමාණය සියයට 7.0කට සීමා වූ අතර, මෙය වසංගතයේ කම්පනය හේතුවෙන් ආර්ථිකය අර්බුදකාරී තත්ත්වයෙන් නැවත යථා තත්ත්වයට පත්වීමට ආසන්නයේ සිටි අවස්ථාවේ දී මුදල් ඒකකය අධික ලෙස අවප්‍රමාණය වීමේ අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීමට උපකාරී විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ නිරීක්ෂණය වූ පීඩනය සඳහා විදේශ විනිමය උපයන්නන් විසින් විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණවත් ලෙස රුපියල්වලට පරිවර්තනය නොකිරීම ද යම් දුරකට හේතු විය. අපනයන ආදායම රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතා පිළිබඳ රෙගුලාසි පැනවීමත් සමඟ දේශීය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය යම් ප්‍රමාණයකට වැඩිදියුණු විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් පිළිබිඹු කරමින්, 2021 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන් (සියයට 3.8කින්) සහ යූරෝ වලට (සියයට 1.1කින්) සාපේක්ෂව අතිප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම (සියයට 6.0කින්) සහ ඉන්දියානු රුපියලට (සියයට 5.5කින්) සාපේක්ෂව අවප්‍රමාණය විය. තවද, 2022 වසරේ මුල් මාස දෙක තුළ, අඛණ්ඩ ශිෂ්ට ප්‍රයෝග හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල පුළුල්ව ස්ථාවරව පැවතුණි. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව පහළ යෑමෙන් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනයන් 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී තීව්‍ර වීම හමුවේ, 2022 වසරේ මාර්තු මස මුල දී අවශ්‍ය වූයේ විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැලපීමකි. කෙසේ වෙතත්, ඉන් පසුව 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීභාවය සැලසීමෙන් පසුව ඇති වූ බලපෑමෙන්, වෙළඳපොළ බලවේග හමුවේ සැලකිය යුතු ඉහල ප්‍රමාණයකින් විනිමය අනුපාතිකය

5

5.15 සංඛ්‍යා සටහන

විනිමය අනුපාතික වෙනස්වීම්

මුදල් වර්ගය	විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය						පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ)			
	වර්ෂය අග අනුපාතිකය			වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය			වර්ෂය අග		වාර්ෂික සාමාන්‍යය	
	2019	2020	2021	2019	2020	2021	2020	2021	2020	2021
යූරෝ	203.67	229.42	226.86	200.14	212.07	235.10	-11.23	1.13	-5.62	-9.80
ඉන්දියානු රුපියල්	2.55	2.55	2.69	2.54	2.50	2.69	0.00	-5.45	1.46	-6.95
ජපන් යෙන්	1.67	1.81	1.74	1.64	1.74	1.81	-7.54	3.82	-5.65	-3.96
බ්‍රිතාන්‍ය පවුම්	238.46	254.35	270.60	228.20	238.22	273.51	-6.25	-6.00	-4.21	-12.90
එක්සත් ජනපද ඩොලර්	181.63	186.41	200.43	178.78	185.52	198.88	-2.56	-7.00	-3.64	-6.72
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)	251.17	268.48	280.53	246.97	258.61	283.18	-6.45	-4.29	-4.50	-8.68
සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2017 = 100)	වර්ෂය අග දර්ශකය			වාර්ෂික සාමාන්‍ය දර්ශකය			පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම්			
							වර්ෂය අග දර්ශකය		වාර්ෂික සාමාන්‍ය දර්ශකය	
	2019	2020	2021	2019	2020	2021	2020	2021	2020	2021
නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	86.74	83.12	79.65	88.17	85.93	78.64	-4.17	-4.18	-2.54	-8.48
මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	90.74	88.37	86.06	90.42	91.52	86.13	-2.61	-2.61	1.22	-5.90

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම/පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.14 රූප සටහන
විනිමය අනුපාතිකයේ වෙනස්වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවප්‍රමාණය වීම හේතුවෙන් එම අපේක්ෂාව මුදුන්පත් කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 33.0කින් අවප්‍රමාණය විය. එම තීරණය මෙන්ම අනෙකුත් අදාළ නියාමන සීමා ඉවත් කිරීම සහ අලුතින් පනවන ලද ආනයන සීමා කිරීම් මගින් විශේෂයෙන්ම, අපනයනකරුවන්ට සහ ප්‍රේෂණ සිදු කරන්නන්ට ඇති ශුද්ධ ලාභය ඉහළ යෑම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් ලැබීම දිරිමත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, හදිසි නොවන ආනයන සහ අනෙකුත් ගෙවීම් අධෛර්යමත් කරමින් පවතී. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් පිළිබිඹු කරමින්, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල යූරෝ වලට (සියයට 32.1කින්), ඉන්දියානු රුපියලට (සියයට 31.7කින්), ස්ටර්ලින් පවුමට (සියයට 31.1කින්), සහ ජපන් යෙන්වලට (සියයට 28.9කින්) සාපේක්ෂව අවප්‍රමාණය විය.

බලශක්ති මිල ගණන්හි ඉහළ යන උච්චාවචන, හිමිකම් කොටස්වල අඩු කාර්යසාධනය, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ ද්‍රවශීලතා ගැටළු හේතුවෙන් ආයෝජකයන් ආරක්ෂිත මුදල් ඒකකයක් ලෙස එ.ජ. ඩොලර් කරා නැඹුරු වීම ඇතුළු විවිධ සාධක හේතුවෙන් එ.ජ. ඩොලරය ශක්තිමත් වීම සමඟ 2021 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් ඒකක එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. ඒ අනුව, 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ජපන් යෙන් (සියයට 10.4කින්), යූරෝ (සියයට 8.0කින්), ඉන්දියානු රුපියල (සියයට 1.6කින්) සහ ස්ටර්ලින් පවුම (සියයට 1.1කින්) අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් රැසකට සාපේක්ෂව අවප්‍රමාණය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස 2021 වසර තුළ දී සහ 2022 වසරේ මාර්තු අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල වි.ගැ. හි. සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 4.3කින් සහ සියයට 32.1කින් අවප්‍රමාණය විය.

5.8.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය

ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි හැසිරීම මනිනු ලබන, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක වසර තුළ දී පහළ ගියේය. විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් සමඟින් අනෙකුත් තෝරාගත් ප්‍රධාන මුදල් ඒකක වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, නා.ස.වි.අ. දර්ශක පහළ ගියේය. ඒ අනුව, 2021 වසර තුළ දී, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නා.ස.වි.අ. දර්ශක, පිළිවෙළින්, සියයට 3.6කින් සහ සියයට 4.2කින් පහළ ගියේය. මුදල් පැසෙහි ඇතුළත් නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීම මෙන්ම රටවල උද්ධමන වෙනස ද සැලකිල්ලට ගෙන ගණනය කෙරෙන, මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2021 වසරේ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ.ස.වි.අ. දර්ශකය සියයට 6.9කින් ඉහළ ගිය අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ. ස. වි. අ. දර්ශකය සියයට 2.6කින් පහළ ගියේය. කෙසේ වුවත්, ශ්‍රී ලංකා රුපියලෙහි අඛණ්ඩ විදේශීය තරඟකාරිත්වය පිළිබිඹු කරමින්, මූ.ස.වි.අ. දර්ශක, 2021

5

වසරේ දී පදනම් වර්ෂයේ සීමාවට (2017=100) පහළින් පැවතුණි. 2022 වසරේ මාර්තු මස විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ පැසෙහි ඇතුළත් එ.ජ. ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන මුදල් ඒකක වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අවප්‍රමාණය වීම, නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ මාර්තු අවසානයේ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පිළිවෙළින්, සියයට 31.9කින් අඩු වූ අතර, සියයට 31.1කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 32.0කින් සහ සියයට 35.1කින් පහළ ගියේය.

5.8.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

2021 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ ගනුදෙනු පරිමාවන් තවදුරටත් පහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ එ.ජ. ඩොලර් මිලියන 18,408ක් ලෙස වාර්තා වූ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,160ක් දක්වා අඩු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 10,445ක් වූ මුළු එතැන් විනිමය පරිමාව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,852ක් (මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 48.1ක්) දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,964ක් වූ ඉදිරි විනිමය පරිමාව ද 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන

5.15 රූප සටහන
කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ කටයුතු සඳහා අඛණ්ඩව මැදිහත් විය. මහ බැංකුවේ මැදිහත්වීම තුළින් විනිමය අනුපාතිකයෙහි ඉහළ උච්චාවචනය වීම් වළක්වා ගැනීමට උපකාරී වූ අතර, එය ආර්ථිකයට සහ ජනතාවට සිදුවන බාධා වළක්වා ගැනීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීමේ අවශ්‍යතාවන්ට සහාය විය. කෙසේ වෙතත්, 2021 වසරේ අග දී පැවති ස්ථාවර විනිමය අනුපාතිකය යටතේ ආනයනකරුවන්ට අඩු පිරිවැයක් යටතේ වැඩි ප්‍රමාණයක් ආනයනය කිරීමට හැකි වූ අතර, අපනයනකරුවන් තම අපනයන ආදායම පරිවර්තනය කිරීමට මැලි වීම හේතුවෙන් එය දේශීය විදේශ විනිමය වෙළඳපොළට අහිතකර බලපෑමක් ඇති කළේය.

5